2019

වාර්ෂික වාර්තාව

ஆண்டு அறிக்கை

ANNUAL REPORT



කාර්මික තාක්ෂණ ආයතනය

கைத்தொழில் தாழில்நுட்ப நிறுவனம்

INDUSTRIAL TECHNOLOGY INSTITUTE

වාර්ෂික වාර්තාව 2019

කාර්මික තාක්ෂණ ආයතනය

පටුන

01 පරිච්ඡේදය	හැදින්වීම	
1.1.	දැක්ම, මෙහෙවර සහ ගුණාත්මක බව පිළිබඳ ප්‍රතිපත්තිය	**1**
1.2.	සංවිධාන ව්‍යුහය	**2**
02 පරිච්ඡේදය	උපාය මාර්ගික කාර්ය සාධනය	
2.1.	සභාපතිතුමාගේ පණිවුඩය	**3**
2.2.	අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය	**4**
2.3.	ක්‍රියාකාරී සැලැස්ම	**10**
03 පරිච්ඡේදය	පාලනය සහ පාරිශ්‍රමික	
3.1.	මණ්ඩල කරුණු	**12**
3.2.	කළමනාකරණ මණ්ඩලය	**12**
3.3.	කළමනාකරණ කමිටුව	**13**
3.4.	අභ්‍යන්තර විගණන	**14**
3.5.	වේතන	**15**
04 පරිච්ඡේදය	කාර්ය සාධනයේ විශේෂ අවස්ථා	
4.1.	තාක්ෂණය පැවරීම	**16**
4.2.	පර්යේෂණ, සංවර්ධන සහ නවෝත්පාදනය	**17**
4.3.	තාක්ෂණික සේවාවන්ගේ සංවර්ධනය	**21**
4.4.	යටිතල පහසුකම් සංවර්ධනය	**22**
4.5.	ජාතික ගැටළු සඳහා දායකත්වය	**23**
4.6.	ජාතික ව්‍යාපෘති සඳහා දායකත්වය	**24**
4.7.	මානව සුබ සාධනය සහ සමාජ ආර්ථිකය නැංවීම සඳහා තාක්ෂණය	**25**
4.8.	නව මූලාරම්භයන්	**27**
4.9.	දායකත්වයන්	**29**
05 පරිච්ඡේදය	පරිසර දූෂණය අධීක්ෂණය සහ අවම කිරීම	
5.1.	අපජලය පවිත්‍රකරණය	**31**
5.2.	වායු දූෂණය පාලනය	**31**
5.3.	ශබ්දය අවම කිරීම	**32**
06 පරිච්ඡේදය	තිරසර සංවර්ධනය	
6.1.	සේවා නියුක්ති සංඛ්‍යාලේඛන	**33**
6.2.	තත්ත්ව සහතික	**36**
6.3.	තොරතුරු සේවාවන්	**37**
6.4.	සම්මාන	**37**
6.5.	ධාරිතා සංවර්ධනය	**38**
6.6.	විදේශ පුහුණු වැඩසටහන්	**38**
6.7.	කාර්මික තාක්ෂණ ආයතනයේ යහපැවැත්ම	**40**
6.8.	ප්‍රවර්ධන අවස්ථා	**41**
07 පරිච්ඡේදය	මූල්‍ය කාර්ය සාධනය	**43**
08 පරිච්ඡේදය	පර්යේෂණ ප්‍රතිඵල	
8.1.	4 වන ද්විවාර්ෂික පර්යේෂණ සිම්පෝසියම	**46**
8.2.	යොමුගත ජර්නලවල පළ කිරීම්	**46**
8.3.	ජාත්‍යන්තර සන්නිවේදන	**49**
8.4.	ග්‍රන්ථ, පරිච්ඡේද සහ මාර්ගෝපදේශ	**49**
8.6.	පේටන්ට් බලපත්‍ර	**50**
8.7.	අයදුම් කළ පේටන්ට් බලපත්‍ර	**50**
	විධායක කාර්ය මණ්ඩලය	**51**

01 වන පරිච්ඡේදය:හැඳින්වීම

1.1 දැක්ම, මෙහෙවර සහ ගුණාත්මක බව පිළිබඳ ප්‍රතිපත්තිය

දැක්ම
ජාතික සංවර්ධනය සඳහා වන විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණවල විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් වීම.


මෙහෙවර
ශ්‍රී ලංකාවේ ජනතාවගේ යහපත සඳහා කාර්මික සංවර්ධනය වේගවත් කිරීමට නව්‍ය පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කිරීම හා ජාත්‍යන්තර වශයෙන් තරඟකාරී තාක්ෂණික සේවා සැපයීම.

තත්ත්වය පිළිබඳ ප්‍රතිපත්තිය
කාර්මික තාක්ෂණ ආයතනයේ ඉහළ කළමනාකාරිත්වය, ISO/ IEC 17025: 2017 සහ ISO 9001: 2015 ප්‍රමිතීන්ට අනුකූලව මෙන්ම ජාතික තත්ත්ව ප්‍රතිපත්තියට අනුකූලව සහ අඛණ්ඩව සංවර්ධනය තුළින් ගනුදෙනුකරුවන්ට සේවය සපයන අතර එහි ක්‍රියාකාරකම්වල ගුණාත්මක භාවයට අනුකූලව ගුණාත්මක අරමුණු ස්ථාපිත කරමින් සහ සමාලෝචනය කරමින් ඉහළ මට්ටමේ වෘත්තීය භාවිතයන් සඳහා කැපවී සිටී.

සේවාවේ ප්‍රමිතිය කිසි විටෙකත් අන් දෙයක් වෙනුවෙන් කැප නොකරන අතර ගුණාත්මක කළමනාකරණ පද්ධති (QMS) නඩත්තු කිරීම සහ ප්‍රකාශිත ක්‍රම සහ පාරිභෝගික අවශ්‍යතා අනුව තම ගනුදෙනුකරුවන්ට ස්වාධීන හා අපක්ෂපාතී සත්‍ය දත්ත ලබා දීමෙන් ඉහළම මට්ටමේ පාරිභෝගික තෘප්තියක් ලබා ගැනීමට ආයතනයේ සමස්ත කාර්ය මණ්ඩලයම උත්සාහ කරයි.

කාර්මික තාක්ෂණ ආයතනයේ කාර්ය මණ්ඩලය ඔවුන්ගේ කාර්යයන්හි ගුණාත්මක ලියකියවිලි හා ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සම්බන්ධව නිපුණ වන අතර එම නිසා QMS හි කාර්යක්ෂමතාව අඛණ්ඩව වැඩිදියුණු කිරීමට කැපවී සිටී.

1.2 සංවිධාන ව්‍යුහය


සභාපති සහ
කළමනාකරණ
මණ්ඩලය
අභ්‍යන්තර
විගණන
අධ්‍යක්ෂ ජනරාල්
කළමනාකරණ
කමිටුව
පර්යේෂණ සහ සංවර්ධන අංශය (R&D)
ආහාර තාක්ෂණ අංශය (FTS)
ශාක සාර තාක්ෂණ අංශය (HTS)
ද්‍රව්‍ය තාක්ෂණ අංශය (MTS)
පාරිසරික තාක්ෂණ අංශය (ETS)
ජෛව තාක්ෂණ අංශය (BTU)
තාක්ෂණ සේවා අංශය (TS)
රසායනික සහ ක්ෂුද්‍ර ජීව විද්‍යා රසායනාගාරය (CML)
ද්‍රව්‍ය තාක්ෂණ රසායනාගාරය (ML)
කර්මාන්ත මිනුම් රසායනාගාරය (IML)
විද්‍යුත් තාක්ෂණ රසායනාගාරය (ETL)
අවශේෂ විශ්ලේෂණ රසායනාගාරය (RAL)
පරිගණක ඒකකය (CU)
තොරතුරු සේවා මධ්‍යස්ථානය (ISC)
පරිපාලන හා මෙහෙයුම් අංශය (A&O)
මානව සම්පත් දෙපාර්තමේන්තුව (HRD)
අලෙවිකරණ සහ ව්‍යාපාර සංවර්ධන දෙපාර්තමේන්තුව (MBD)
ඉංජිනේරු සේවා (ES)
ප්‍රවාහන ඒකකය (TU)
මූල්‍ය දෙපාර්තමේන්තුව (FD)
ගබඩා (STO)
සැපයුම් (SUP)
තත්ත්ව සුපරීක්ෂණ දෙපාර්තමේන්තුව (QAD)

02 වන පරිච්ඡේදය:උපාය මාර්ගික කාර්ය සාධනය

2.1 සභාපතිතුමාගේ පණිවුඩය

කාර්මික තාක්ෂණ ආයතනයේ සභාපති ලෙස 2019 වසර තුළ සේවය කිරීමට හැකි වීම මම මහත් ගෞරවයක් ලෙස සලකමි. තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ අත්දැකීම් සමගින් මෙහි පැමිණි මගේ මෙහෙවර වූයේ මීළඟ පරපුරේ කාර්මීකරණ ඉල්ලීම් සැපිරීම පිණිස කර්මාන්තය 4.0 වෙත ගෙන යාමයි.

කාර්මික තාක්ෂණ ආයතනය වූ කලී ආහාර, ඖෂධ, ද්‍රව්‍යම කර්මාන්ත තුළ සුවිශේෂී තාක්ෂණයන් සංවර්ධනය කිරීමට මෙන්ම උසස් මට්ටමේ පරීක්ෂණ, පාරිසරික සේවා සැපයීමට හැකියාව සහ ධාරිතාව සහිත ආයතනයකි. රටේ ප්‍රමුඛ පෙළේ විද්‍යාඥයන් සහ තාක්ෂණවේදීන්ගෙන් සමන්විත එවැනි කීර්තිමත් ආයතනයකට පර්යේෂණ සහ සංවර්ධන ආයතනයකින් ඔබ්බට ගොස් ලාභදායී ව්‍යාපාරයක් කරනු පිණිස ව්‍යාපාරික දෘෂ්ටිකෝණයක් සහ වාණිජකරණ මනෝභාවයක් ගෙන ඒම සඳහා දායක වීමට ලැබීම මා ලද භාග්‍යයක් ලෙස මම සලකමි.

දේශීය භෝග සඳහා වටිනාකම් එකතු කිරීම සහ එම නිෂ්පාදනයන් ලෝක වෙළඳපොළට සැපයීමේ හැකියාව ඇතිවන පරිද්දෙන් ලොව ප්‍රමුඛ පෙළේ ප්‍රතීතනයන් සමඟ ඉහළම ප්‍රමිතීන්ට අනුකූලව විද්‍යාව, පර්යේෂණ සහ සංවර්ධනය සහ වාණිජකරණය සංවර්ධනයට දායකත්වය සැපයීමට ආයතනය සමත් විය.

2019 වර්ෂය තුළ පාස්කු බෝම්බ ප්‍රහාරයේ අනපේක්ෂිත අවාසනාවන්ත සිදුවීම මධ්‍යයේ වුවද කාර්මික තාක්ෂණ ආයතනයට සිය පිරිවැටුම රුපියල් මිලියන 10කට වඩා වැඩි කර ගැනීමට හැකි විය. Cargills Quality Confectioneries (Pvt) Ltd වෙත අඩුවෙන් එකතු කරන ලද සුක්‍රෝස් සහිත පෝෂ්‍යදායී ස්කෝන් සහ Keells Food Products PLC වෙත දේශීයව වගා කරන සහල්වලට භෞතිකව ප්‍රතිකාර කරමින් සංවර්ධනය කළ ක්ෂණික සහලක් වන Ezy සහල් ලබා දෙමින් ප්‍රධාන තාක්ෂණික පැවරීම් දෙකක් සාර්ථකව සිදු කිරීමට අපට හැකි විය. ඒ සමගම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් නඟා සිටුවීමට සහ තිරසාර කිරීමට සිදු කරන ලද අඩු වියදම් තාක්ෂණික පැවරීම් රාශියක් ද සිදු විය.

කාර්මික තාක්ෂණ ආයතනයේ ද්‍රව්‍ය අංශය නිදන්ගත වකුගඩු රෝගය තුරන් කිරීමේ හැකියාව සහිත මැටි පෙරහනක් සංවර්ධනය කිරීමට සමත් වූ අතර, මෙමගින් ස්වභාවිකව පෙරහන් කරන ලද ජලය පරිභෝජනය කළ හැකිවන පරිදි රට පුරා රෝහල්, පාසල්, විශ්ව විද්‍යාල සහ වෙනත් පොදු ස්ථානවලට මෙන්ම පුද්ගලික අංශයටද විසිතුරු ලෙස සකසා ඉදිරිපත් කිරීමටද අපි උත්සාහ කළෙමු. Taprobane International Ltd සමග එක්ව කොහුබත් මත පදනම් වූ ද්‍රව්‍ය සහ එහි යෙදුම් නිෂ්පාදන සංවර්ධනය කිරීම සහ එම තාක්ෂණය පැවරීමේ වගකීමද ආයතනය භාරගත්තේ ය.

කාර්මික තාක්ෂණ ආයතනයේ මෙතෙක් සිදු කළ ඉහළම අගය සහිත වූ ව්‍යාපෘතිය වන, Agri Deshiya (Pvt) Ltd.,සමග එක්ව මධ්‍යසාර කිතුල් පානය (sparkling sweet toddy) සහ කිතුල් පැණි නිපදවීමේ විශේෂී ව්‍යාපෘතියේ කොටසක් බවට පත්වීමට මගේ නිල කාලය තුළ හැකිවීම පිළිබඳව නිහතමානීව ආඩම්බර වෙමි.

මගේ පත් කිරීම සම්බන්ධයෙන් ගරු අමාත්‍ය සුජීව සේනසිංහ මැතිතුමාට ස්තුතිවන්ත වන අතරම කාර්මික තාක්ෂණ ආයතනයේ ප්‍රමිතීන් ඉහළ නැංවීම කෙරෙහි දායක වූ පුද්ගලික අංශයේ වෘත්තිකයන්ගෙන් සමන්විත මණ්ඩලයටද මගේ ස්තුතිය පුද කරමි.

කාර්ය මණ්ඩලයට සහාය වීමට පමණක් නොව, අවශ්‍ය අවස්ථාවන්හිදී ඔවුන්ට උපකාර කිරීමට ද සුබසාධන සංගමයට සහාය වීමෙන් අප සියලුම සේවකයින්ගේ සෑම තොරතුරක් කෙරෙහිම අවධානය

යොමු කළ අතර කාර්ය මණ්ඩල සාමාජිකයෙකුගේ වෛද්‍ය අවශ්‍යතා සඳහා අරමුදල් සැපයීම සඳහා වේදිකා නාට්‍යයක් සංවිධානය කිරීම ඉන් එක් කාර්යයක් විය.

ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳ බොහෝ වාද විවාද පවතින ලොවක් තුළ කාර්මික තාක්ෂණ ආයතනයේ ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයින් සහ කළමනාකාරිත්වය බහුතරයක් කාන්තාවන්ගෙන් සමන්විත වේ. පළමු අධ්‍යක්ෂ ජනරාල්/ප්‍රධාන විධායක නිලධාරී ලෙස 2019 වසරේ පත් වූ ආචාර්ය රාධිකා සමරසේකර , ආචාර්ය ඉල්මි හේවාපුලිගේ, ආචාර්ය ඉරේෂා කෝට්ටෙගොඩ, මනෝරි විජයමාන්න මිය, ඉංජිනේරු රම්‍යා විජේසේකර මිය, ආචාර්ය මේනුකා ඇරැව්වාවල මිය සහ හිමාෂි කරුණාරත්න මෙනවිය, කාර්මික තාක්ෂණ ආයතනයේ ප්‍රධාන වගකීම් දරන්නන් අතර කිහිප දෙනෙකි.

ආයතනයේ සැබෑ දැක්ම දෙසට තම කණ්ඩායම් සමග එක්ව කටයුතු කළ පුද්ගලයන් අතර ආචාර්ය පත්මසිරි රණසිංහ, ආචාර්ය රුවන් වීරසිංහ, ආචාර්ය සුදර්ශන සෝමසිරි, ආචාර්ය නෙවිල් අමුණුගම, එම් එන් ඒ මුබාරක්, රුවන් චන්දිම, දිනෙත් සමරවික්‍රම සහ අනුර සූරියආරච්චි යන මහත්වරුන් සිටී. තවද රෝහිණී ද සිල්වා මහත්මිය, වූක්ගැනවිලි කමිටුවේ සභාපතිත්වය දැරූ අතර අපක්ෂපාතීත්වයෙන් කටයුතු කර සත්‍ය සොයාගැනීම් සහ විසඳුම් වාර්තා කරමින් කාර්මික තාක්ෂණ ආයතන කාර්ය මණ්ඩලයේ යහපැවැත්ම සඳහා දායකත්වය දැක්වූවාය. මෙහිදී, තම දැනුම මා වෙත ලබා දෙමින් මග පෙන්වූ වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල් උපුල් පුෂ්පකුමාර මහතාද මා ගෞරවයෙන් සිහි පත් කරමි.

එමෙන්ම, ඉතාමත්ම රහස්‍ය භාවයෙන් මා ළඟින් සිට සහය ලබා දුන් මගේ රහස්‍ය ලේකම් අයේෂා ඩයස් මිය සහ මගේ රියදුරු දුෂාන්ත පුෂ්පරාජ් මහතා, කාර්මික තාක්ෂණ ආයතනයේ සභාපතිවරයා ලෙස මගේ සාර්ථකත්වයේ කොටස්කරුවන් ලෙස මම සලකමි.

අමල් ඩයස්
සභාපති

2.2 අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

වසර 64 කට අධික කාලයක් පුරා, ලංකා විද්‍යාත්මක සහ කාර්මික පර්යේෂණ ආයතනයේ (CISIR) අනුප්‍රාප්තික වූ කාර්මික තාක්ෂණ ආයතනය (ITI) විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදනය තුළින් විවිධාකාර වූ අභියෝගයන් විසඳාලමින්, පර්යේෂණ සහ සංවර්ධනය, උපදේශනය, තාක්ෂණික හුවමාරුව, පුහුණු කිරීම් ඔස්සේ කාර්මික සංවර්ධනය ප්‍රවර්ධනය කරමින් සහ ජාත්‍යන්තර තරගකාරී පරීක්ෂණ සහ ක්‍රමාංකන සේවාවන් තුළින් රටේ ආර්ථික සංවර්ධනයට දායක වෙමින් සිටී. 2019 නොවැම්බර් මස තෙක් ආයතනය විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශය යටතේ සහ ඉන්පසු උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විය.

මෙම වාර්ෂික වාර්තාව 2019 සඳහා ක්‍රියාකාරී සැලැස්මක් ලබාදෙයි; කාර්මික තාක්ෂණ ආයතනයේ ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශයක්, කාර්ය සාධනයේ විශේෂ අවස්ථාවන් සහ සැලසුම් කළ අරමුණු ආශ්‍රිත ප්‍රතිඵල; රජයට, කර්මාන්තවලට, රාජ්‍ය නොවන සංවිධානවලට සහ පොදුවේ ප්‍රජාව වෙත 2019 වසරේ ලබා දුන් ගුණාත්මක සේවාව සහ දායකත්වය ද මෙමගින් ඉදිරිපත් කෙරේ.

පළමුවෙන්ම, කාර්මික තාක්ෂණ ආයතනයේ කළමනාකරණ මණ්ඩලය වෙතින් ලැබෙන අගනා මාර්ගෝපදේශය සහ උපදෙස් ඇගයීමට මම මෙය අවස්ථාවක් කරගනිමි.දෙවනුව, ආයතනයේ දෛනික කර්තව්‍යයන් මෙන්ම විශේෂ පැවරුම් සියල්ල ඉමහත් කැපවීමෙන් සහ සහයෝගයෙන් යුතුව සිදු කරමින් බහුආංශික එළඹුමකින් වැඩ කටයුතු සිදු කරන කාර්මික තාක්ෂණ ආයතනයේ කාර්ය මණ්ඩලය සහ අනෙකුත් සේවකයන් වෙතද මගේ කෘතඥතාව පුද කරමි.මෙම සියලු දෙනාගේ අසීමිත සහය සහ සහයෝගීතාවය නොවන්නට, 2019 වසරේ පැවති ගෝලීය තත්ත්වයන් නිසා ඇති වූ කැලඹිලි සහිත කාලවලදී කාර්මික තාක්ෂණ ආයතනයට සිය ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වනු ඇත. අසීරු

තත්ත්වයන් යටතේදීත් විශිෂ්ට සහ බලපෑම් සහගත විද්‍යා හා තාක්ෂණ නවෝත්පාදයන් ජාතියට දායක කිරීමට අපට හැකියාව ලැබිණි.

2019 වසරේදී පර්යේෂණ තත්වයන්ගේ මාරුවීමට සහ පර්යේෂණ ප්‍රතිඵල වාණිජකරණයට පහසුකම් සලසන අතරම අපි රජයේ ප්‍රමුඛතා සහ කාර්මික ඉල්ලුම සමග සමපාත වන ක්ෂේත්‍රවල විද්‍යාව හා තාක්ෂණය සහ නවෝත්පාදන වෙත අඛණ්ඩව අවධානය යොමු කළෙමු.

වසර තුළදී කාර්මික තාක්ෂණ ආයතනය, පරීක්ෂණ, තාක්ෂණ පැවරීම්, උපදේශනය, ව්‍යාපෘති කොන්ත්‍රාත් සහ පුහුණුව ඇතුළු සේවා 18,000 කට වැඩි ප්‍රමාණයක් සිදු කළ අතර ශ්‍රී ලාංකීය කර්මාන්ත, ජාත්‍යන්තර ආයතන ඇතුළු සේවාදායකයන් 10,000 කට වැඩි ප්‍රමාණයක් සමග සහ කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර 1000 කට වැඩි ප්‍රමාණයක් සමග කටයුතු කළේ ය.එසේ සිදුකළ වැඩ කටයුතු අතර වැදගත්ම සහයෝගීතාවන් කිහිපයක් නම්, දක්ෂිණ කලාපයේ තිරසර සංවර්ධනය සඳහා විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව (COMSATS), එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය (UNIDO), ලෝක කාර්මික සහ තාක්ෂණික පර්යේෂණ සංවිධාන සංගමය (WAITRO), උණ සහ වේවැල් පිළිබඳ ජාත්‍යන්තර ජාලය (INBAR), චීනයේ යුනැන් ග්‍රාමීය විද්‍යා හා තාක්ෂණ සේවා මධ්‍යස්ථානය සහ කුන්මිංග්හි යුනැන් කෘෂිකාර්මික විශ්ව විද්‍යාලය, කොරියානු බුද්ධිමය දේපළ කාර්යාලය (KIPO), රාජ්‍ය පරිපාලනය පිළිබඳ කොරියානු ආයතනය (KIPA), කැනඩාවේ ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානය (IDRC) සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP).

තාක්ෂණය පැවරීම්

ප්‍රධාන තාක්ෂණ පැවරීම් ද්වය ගිවිසුම් තුළින් සම්පූර්ණ කෙරිණි.පහත තාක්ෂණ පැවරීම් ආවරණය විය

(අ) මුං, ඉරිහු වියළි පලතුරු සහ තල ඇට වැනි දේශීය ද්‍රව්‍ය යොදා ගනිමින් සකසා ගත් අඩු ආදේශිත සුක්‍රෝස් සහිත පැතලි පාන් වර්ගයක් වන පෝෂණීය ස්කෝන් Cargills Quality Confectioneries (Pvt) Ltd වෙත සුවිශේෂී අයිතීන් සමග පවරන ලදී.

(ආ) මිනිත්තු 5 කින් පිසිය හැකි වන ලෙස දේශීය සහල්වලින් සංවර්ධනය කළ නව්‍ය නිෂ්පාදනයක් වන InstantRice, ක්ෂණික බත් Keells Food Products PLC වෙත පවරන ලදී. Keells ආයතනය විසින් ක්ෂණික බත් රස වර්ග හතරකින් ඉදිරිපත් කළ අතර දැන් එය පරිභෝජනය සඳහා වෙළෙඳපොළේ ඇත. මීට අමතරව කිතුල් සක්‍රියන නිපැයීම සඳහා සහ සහ සාරය නිෂ්පාදනය වැඩි කිරීම සඳහා උත්තේජකයක් ලෙස KASPER තාක්ෂණය යොදා ගැනීමට APIC Agro Pvt Ltd සමග සහ කාර්මික සංවර්ධන මණ්ඩලයේ ජාලය තුළින් එහි සේවය ලබා ගැනීමට ඔවුන් සමග බලපත්‍ර ගිවිසුම් අත්සන් කරන ලදී.

කිතුල් තෙලිජ්ජ මධ්‍යසාර පානය සහ නවීකරණය කරන ලද කොහු පාදක ද්‍රව්‍ය සහ එහි යෙදවුම් නිෂ්පාදන සඳහා පිළිවෙළින් Agri Deshiya (Pvt) Ltd සහ Taprobane International සමග තොරතුරු අනාවරණය නොකිරීමේ ගිවිසුම් දෙකක් අත්සන් කරන ලදී.

කාර්මික තාක්ෂණ ආයතනය, විදාතා මධ්‍යස්ථාන සහ විදාතා ව්‍යවසායකයින් සමග එක්ව ග්‍රාමීය තාක්ෂණය ගොඩ නැගීමට/ප්‍රවර්ධනය කිරීමට ක්ෂුද්‍ර ව්‍යාපාර (MEs) සහ (SME) කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සම්බන්ධ කරගැනීමට අවශ්‍ය තාක්ෂණය තවදුරටත් ලබා දුන්නේය.

පර්යේෂණ සංවර්ධනය සහ නවෝත්පාදනය

විශිෂ්ට පර්යේෂණ, තාක්ෂණය සහ නවෝත්පාදන තුළින් ජාතියට සේවය කිරීමට ලැබීම භාග්‍යයක් ලෙස අපි සලකමු. රජයට හිමි ප්‍රධාන පෙළේ සහ විශාලතම විද්‍යාත්මක පර්යේෂණ හා සංවර්ධන ආයතනය ලෙස කාර්මික තාක්ෂණ ආයතනය, ශ්‍රී ලංකාවේ මෙන්ම ගෝලීයව පවතින පර්යේෂණ ජාල, කර්මාන්ත සහ විශ්ව විද්‍යාල සමග සහයෝගයෙන් සමස්ත ජාතියටම තාක්ෂණික නවෝත්පාදන ලබා දීමේ ප්‍රධාන අරමුණ අඛණ්ඩව සපුරා ලමින් සිටී.

2019 වසරේදී කර්මාන්ත සහ පාරිභෝගික ඉල්ලීම මත පදනම්ව පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති හැට තුනක් සැලසුම් කරන ලද අතර මෙම ව්‍යාපෘති, ආහාර, සෞඛ්‍යය, ජෛව තාක්ෂණය, ද්‍රව්‍ය, පරිසරය, ස්වභාවික සම්පත්, මිනුම් විද්‍යාව, විද්‍යුත් තාක්ෂණය සහ අනාගත කර්මාන්ත යනාදී ක්ෂේත්‍ර ආවරණය කරයි. කාර්මික තාක්ෂණ ආයතනය තාක්ෂණික ගැටළු සම්බන්ධව කටයුතු කළ අතර කර්මාන්ත සහ සමාජයට විසඳුම් සපයන ලදී.

කොල්ලු ආශ්‍රිත නිෂ්පාදන, කිතුල් ආශ්‍රිත නිෂ්පාදන, ධාන්‍ය වර්ග ආශ්‍රිත නිෂ්පාදන සහ ඖෂධීය පැලෑටි ආශ්‍රිත ඖෂධ, ස්වභාවික සුවඳ වර්ග, ක්ෂුද්‍රතරංග ජලීන විසරණය සහ ගුරුත්ව තාක්ෂණය භාවිතයෙන් රූපලාවණ්‍ය සහ ආහාර කර්මාන්තය සඳහා භාවිතා කළ හැකිවන පරිදි නිස්සාරක සහ තෙල් වර්ග, ජෛව පලිබෝධ නාශක, පිරිසිදු කරන ලද මිනිරන්, ග්‍රැෆීන්, අඩු කරන ලද ග්‍රැෆීන් ඔක්සයිඩ් සහ ග්‍රැෆයිට් සංයෝග සහ ජලයෙන් දෘඪතාව සහ අනෙකුත් අපවිත්‍ර ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා ඛනිජ සහිත නවීකරණය කරන ලද මැටි වැනි නිෂ්පාදන වාණිජ්‍යකරණය සඳහා මෙම ව්‍යාපෘති මගින් තාක්ෂණයන් සංවර්ධනය කරන ලදී.

“රට වෙනුවෙන් එකට හිටිමු” ව්‍යාපෘතිය යටතේ ජනාධිපති ලේකම් කාර්යාලය සමග එක්ව කාර්මික තාක්ෂණ ආයතනය, යාපනය, මුලතිවු, මඩකලපුව සහ මොණරාගල ඇතුළු විවිධ ස්ථානවල තාක්ෂණය දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

තාක්ෂණික සේවා

පරීක්ෂණ සේවාවන් තුළ කාර්මික තාක්ෂණ ආයතනයේ පළපුරුද්ද සහ සාර්ථකත්වයන් හේතුවෙන් 2019 වසරේදීත් රටේ කාර්මික වර්ධනය වැඩි දියුණු කිරීමට කාර්මික තාක්ෂණ ආයතනයේ විශේෂඥතාවට අදාළව ජාත්‍යන්තරව පිළිගත් ප්‍රතීතන තාක්ෂණික සේවාවන් දේශීය කර්මාන්ත සහ රජයේ සංවිධාන වෙත සැපයීමට හැකියාව ලැබිණි. රසායන, ජල, ආහාර, විලේපන, ඖෂධ ක්ෂේත්‍රයන් මෙන්ම පලිබෝධනාශක අවශේෂ බැර ලෝහ, මයිකොටොක්සින් වැනි පාරිසරික දූෂකකාරක මට්ටම හඳුනා ගැනීම සහ ද්‍රව්‍ය, ලිහිසිකාරක සහ පෙට්‍රෝලියම් තෙල්, ඇසුරුම්කරණය, ක්ෂුද්‍රජීව විද්‍යාව සහ ජාතික මිනුම් විද්‍යාව යටිතල පහසුකම් යනාදී කෙෂේත්‍රයන්ට එම සේවාවන් ලබාදෙන ලදී. ජාතික ආයතන සහ ව්‍යාපෘති ගණනාවකට තාක්ෂණ සේවාවන් ලබා දීම තුළින් කාර්මික තාක්ෂණ ආයතනය තම නව්‍ය තාක්ෂණය ප්‍රචාරණයේ ලා සක්‍රියව දායක වී ඇත.සමාලෝචිත වර්ෂය තුළ, කාර්මික තාක්ෂණ ආයතනය ආහාර සැකසීමේ යෙදී සිටින කර්මාන්ත වත්මන් තාක්ෂණයෙන් වැඩිදියුණු කිරීමට සහ උතුරු පළාතේ ගැටුම්වලින් පීඩාවට පත් ප්‍රදේශවල දෝශ නිරාකරණ කටයුතු සිදු කරන ලදී.සීනි, ලුණු සහ මේද අන්තර්ගතය සඳහා වර්ණ කේත සහිත ආහාර නිෂ්පාදන ලේබල් කිරීම පිළිබඳ රජයේ නව රෙගුලාසියට අනුව, කාර්මික තාක්ෂණ ආයතනය විසින් ගනුදෙනුකරුවන්ගේ ඉල්ලීම් මත සාම්පල 500 කට වඩා පරීක්ෂා කරන ලදී.

කාර්මික තාක්ෂණ ආයතනය විසින් 2019 වසර තුළදී ITI ජංගම විද්‍යාගාරය භාවිතයෙන් අවට වාතයේ ගුණාත්මකභාවය සහ සමුච්චිත විමෝචන අධීක්ෂණය, වායු දූෂණ පාලනය සහ අවම කිරීම, අපජල පවිත්‍රකරණය, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය, ජල තත්ත්ව අධ්‍යයනය, අන්තරායකර අපද්‍රව්‍ය කළමනාකරණය, පාරිසරික බලපෑම් ඇගයීම ඇතුළු පාරිසරික විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ සේවාවන් 200 කට වැඩි ගණනක් සපයන ලදී.

රට තුළ විදුලිබල හා බලශක්ති, මාර්ග, මහාමාර්ග, දුම්රිය, කර්මාන්ත සහ නාවික අංශ සඳහා මිනුම්, අවම කිරීම, අනාවැකි සහ ධ්වනි ආකෘති නිර්මාණ සේවා ඇතුළු ශබ්ද සහ කම්පන තක්සේරු අධ්‍යයනයන් සපයන ලදී.

තත්ත්ව යටිතල පහසුකම්

ආයතනය, පර්යේෂණ සහ සංවර්ධන අංශය සහ තොරතුරු සේවා මධ්‍යස්ථානය සඳහා ISO 9001:2015 තත්ත්ව කළමනාකරණ පද්ධති සහතිකය සමග අඛණ්ඩව ඉදිරියට ගමන් කළේ ය.

ITI හි දැනට පවතින රසායනාගාර තත්ත්ව කළමනාකරණ පද්ධතිය ISO/IEC 17025:2005 තාක්ෂණික සේවා අංශය සඳහා ISO/IEC17025:2017 රසායනාගාර තත්ත්ව කළමනාකරණ පද්ධතිය බවට පරිවර්තනය කරන ලද අතර රසායන, ආහාර සහ ජලය, අපජල, විලවුන්, ද්රව්ය (සිමෙන්ති, රබර් සහ පිඟන් මැටි), ක්ෂුද්ර ජීව විද්යාත්මක පරාමිතීන්, රසායනික අපද්රව්ය, ලෝහ අපද්රව්ය සහ කාර්මික ශබ්ද සහ කම්පන මිනුම් සඳහා පරීක්ෂණ පරාමිතීන් 500කට වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලංකා ප්‍රතිනත මණ්ඩලය (SLAB) විසින් ප්‍රතිනතය කර ඇත. කාර්මික මිනුම් විද්‍යාගාරය අඛණ්ඩව ස්කන්ධය, මානයන්, පරිමාව, විද්‍යුත්, බලය, පීඩනය සහ උෂ්ණත්ව මිනුම් සඳහා ISO/IEC17025:2017 රසායනාගාර තත්ත්ව කළමනාකරණ පද්ධතිය පවත්වාගත් අතර දකුණු කොරියාවේ කොරියානු ප්‍රමිති සහ විද්‍යා පර්යේෂණ ආයතනය (KRISS), ජර්මනියේ Physikalisch-Technische Bundesanstalt (PTB) සහ තායිලන්තයේ ජාතික මිනුම් විද්‍යා ආයතනය තුළින් SI ඒකක සඳහා මිනුම් සොයා ගැනීමේ හැකියාව අඛණ්ඩව පවත්වාගෙන ගියේය.

2019 දී කාර්මික තාක්ෂණ ආයතනය ISO/IEC 17043: 2010 ප්‍රවීණතා පරීක්ෂණ (PT) සඳහා ශ්‍රී ලංකා ප්‍රතිනත මණ්ඩලය වෙතින් ප්‍රතිනතය ලබා ගත් අතර එය මෙම තත්ත්වය පවත්වා ගෙන ගිය පළමු සහ එකම ශ්‍රී ලාංකේය රසායනාගාරය වේ.ජල ක්ෂුද්‍රජීව විද්‍යාව, ආහාර ක්ෂුද්‍රජීව විද්‍යාව සහ සිමෙන්ති සඳහා රසායනික හා භෞතික පරීක්ෂණ පිළිබඳ (PT)වැඩසටහන් පැවැත්වීමේ හැකියාව කාර්මික තාක්ෂණ ආයතනයට ඇත.

යටිතල පහසුකම් සංවර්ධනය

පසුගිය වසරවල විවිධ ප්‍රතිපත්තිමය නොගැලපීම් හේතුවෙන් UNIDO අරමුදල් ලැබූ ඇසුරුම් පරීක්ෂණ රසායනාගාරය, රජයේ අරමුදල් ලැබූ පෙට්‍රෝලියම් සහ ලිහිසි තෙල් පරීක්ෂණ රසායනාගාරය සහ ජාතික ඖෂධ රසායනාගාරය සහ චීන රජයේ අරමුදල් ලැබූ චීන-ශ්‍රී ලංකා ඒකාබද්ධ ජෛව තාක්ෂණ විද්‍යාගාරය වැනි විශාල ව්‍යාපෘතිවල ප්‍රගතිය මන්දගාමී විය. .කෙසේ වෙතත්, ඉහත සඳහන් කාල සීමාව තුළ මෙම ආයතනවලට සහයෝගීතාවයන් ඇති කර ගැනීම සඳහා නායකත්වය ලබා දී මඟ පෙන්වීමට මට හැකියාව ලැබිණි.

චීනයේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය (MOST) සහ ශ්‍රී ලංකා උසස් අධ්‍යාපන පර්යේෂණ අමාත්‍යාංශය සමග අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම යටතේ, කාර්මික තාක්ෂණ ආයතනය විසින් යුනෑන් ග්‍රාමීය විද්‍යා හා තාක්ෂණ සේවා මධ්‍යස්ථානය සහ චීනයේ කුන්මිං හොඟි යුනෑන් කෘෂිකර්ම විශ්වවිද්‍යාලය සමග ගිවිසුම් රාමුවකට අත්සන් තබන ලදී.2019 දී මෙම රාමු ගිවිසුම යටතේ විශේෂ ශාක සම්පත් (තේ, කුරුඳු සහ මුරුංගා) සහ ඒවායේ කාර්මික යෙදුම් පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා ජෛව තාක්ෂණය පිළිබඳ චීන ශ්‍රී ලංකා ඒකාබද්ධ රසායනාගාරය සඳහා කාර්මික තාක්ෂණ ආයතනය වෙත USD 600,000 ක් වටිනා උපකරණ ප්‍රදානයක් ලැබිණි.ජෛව තාක්ෂණ විද්‍යාගාරය නිම කිරීම සඳහා, මාලඹේ නවීන පර්යේෂණ හා සංවර්ධන සංකීර්ණයේ (MRDC) චීන-ශ්‍රී ලංකා ඒකාබද්ධ ජෛව තාක්ෂණ විද්‍යාගාරය නිම කිරීමට කාර්මික තාක්ෂණ ආයතනය දේශීය ඉදිකිරීම් සමාගම සමග ගිවිසුමක් අත්සන් කළේය.

කාර්මික තාක්ෂණ ආයතනය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය හරහා FAO සහාය ඇතිව ජෛව තාක්ෂණ ඒකකය තුළ සජීව ක්ෂුද්‍ර ජීවීන් සඳහා පරීශීලක සහ පරීක්ෂණ රසායනාගාරයක් පිහිටුවීම ආරම්භ කරන ලදී.වසර තුළදී කාර්මික තාක්ෂණ ආයතනය විසින් US FDA රෙගුලාසිවලට අනුව ටින් කළ ආහාරවල තාප ක්‍රියාවලි වලංගු කිරීම සහ අඩු තෙතමන සැකසූ ආහාර මෙහෙයුම් සඳහා අවශ්‍ය පහසුකම් MRDC මාලඹේ ආහාර තාක්ෂණ අංශයේ ස්ථාපිත කරන ලදී.

සම්මන්ත්‍රණ සහ රැස්වීම්

4 වන ITI ද්විවාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය "තිරසාර සංවර්ධනය සඳහා විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදනයේ විශිෂ්ටත්වය" යන තේමාව යටතේ 2019 දෙසැම්බර් 17 සිට 18 දක්වා මාලඹේ ITI හි අලුතින් ස්ථාපිත MRDC හිදී පැවැත්විණි. සමාරම්භක උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා සහ ගෞරවනීය ආරාධිත අමුත්තා ලෙස තාක්ෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍ය තිලංග සුමතිපාල මහතා සහභාගී විය.COMSATS හි විධායක අධ්‍යක්ෂ ආචාර්ය එස්. එම් ජුනයිඩ් සයිඩ් මහතා විශේෂ ආරාධිත අමුත්තා ලෙස මෙම අවස්ථාවට සහභාගී විය.මෙම සම්මන්ත්‍රණයේදී ITI හි සිදු කරන ලද පර්යේෂණ මගින් ලබාගත් දැනුම බෙදාහරිමින් පර්යේෂණ පත්‍රිකා 40 ක් ඉදිරිපත් කරන ලදී.සම්මාන ප්‍රදානෝත්සවයේදී ITI විද්‍යාඥයින්ගේ සහ ඉංජිනේරුවන්ගේ විශිෂ්ඨ කාර්යසාධනය ඇගයීමට ලක් වූ අතර පර්යේෂකයින් 30 කට ආසන්න සංඛ්‍යාවක් සම්මාන සහ සහතිකපත් ලබා ගත්හ.

සම්මාන, පේටන්ට්, ප්‍රකාශන සහ පිළිගැනීම්

ශ්‍රී ලංකා නවෝත්පාදකයන්ගේ කොමිෂන් සභාව විසින් සංවිධානය කරන ලද ජනාධිපති සම්මාන ප්‍රදානෝත්සවයේදී කාර්මික තාක්ෂණ ආයතනයේ විද්‍යාඥයන් රන් පදක්කම් දෙකක් දිනා ගත්හ. ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව විසින් සංවිධානය කරන ලද කෘෂිකාර්මික පර්යේෂණ තුළ විශිෂ්ටත්වය සඳහා වන SLCARD හිදී පළමු ස්ථාන දෙකක් සහ ඇගයීම් සහතික දෙකක්ද දිනාගන්නා ලදී. එමෙන්ම ජාතික විද්‍යා පදනම විසින් පවත්වන SUSRED (පර්යේෂණ උපාධි අධීක්ෂණය සඳහා වන සහය යෝජනා ක්‍රමය) සම්මානයද කාර්මික තාක්ෂණ ආයතනය විසින් දිනා ගන්නා ලදී.

2019 වසර තුළ පර්යේෂණ ලිපි 31 ක් යොමුගත ජර්නල තුළ පළ කෙරුණු අතර ජාත්‍යන්තර ප්‍රකාශකයන් සඳහා පොත් පරිච්ඡේද දෙකක් ලියන ලදී.මීට අමතරව, එක් පේටන්ට් බලපත්‍රයක් ලබාගත් අතර වසර තුළදී දේශීය පේටන්ට් 10 ක් සඳහා අයදුම්පත්‍ර ඉදිරිපත් ගොනුගත කරන ලදී.

මානව සම්පත් සංවර්ධන

පර්යේෂණ විද්‍යාඥයින්, ඉංජිනේරුවන්, පර්යේෂණ තාක්ෂණවේදීන් සහ රහස්‍ය ලේකම්, ජ්‍යෙෂ්ඨ නීති නිලධාරි, ජ්‍යෙෂ්ඨ ගබඩා නිලධාරි, අලෙවිකරණ නිලධාරි සහ කළමනාකරණ සහකාර ඇතුළු තනතුරු 66 ක් කාර්ය මණ්ඩලය ලෙස 2019 වසරේ බඳවා ගන්නා ලදී.පර්යේෂණ විද්‍යාඥයින් දෙදෙනෙකු සහ පර්යේෂණ තාක්ෂණවේදීන් තිදෙනෙකු ඉල්ලා අස් වූ අතර, පර්යේෂණ තාක්ෂණවේදීන් 4 දෙනෙකු 2019 වසරේ විශ්‍රාම යන ලදී. ඛනිජ තෙල් සහ ලිහිසි තෙල් පරීක්ෂණ රසායනාගාරය සහ ජාතික ඖෂධ රසායනාගාරය සඳහා අතිරේක සේවක සංඛ්‍යාවක් සඳහා අනුමැතිය ලබා දීමත් සමඟ ආයතනික සේවක සංඛ්‍යාව 440 දක්වා වැඩි කරන ලදී.සමාලෝචිත වර්ෂය තුළ, විද්‍යාඥයන් දෙදෙනෙකු විශ්ලේෂණාත්මක රසායන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සම්පූර්ණ කළ අතර, එක් විද්‍යාඥවරියක් සිය ආචාර්ය උපාධිය ලබා ගත්තාය.

මූල්‍ය කාර්ය සාධනය

2019 දී රුපියල් මිලියන 121 ක ප්‍රාග්ධන ප්‍රදානයක් සහ රුපියල් මිලියන 225 ක ප්‍රතිපාදනයක් කාර්මික තාක්ෂණ ආයතනය වෙත ලැබිණි.නව තාක්ෂණ සංවර්ධන සහ පරීක්ෂණ සේවා හරහා වැඩි ආදායමක් උපයා ගැනීම සඳහා පර්යේෂණ හා සංවර්ධන සහ තාක්ෂණ සේවා සඳහා ඉහළ මට්ටමේ උපකරණ මිලදී ගැනීමට මෙම අරමුදල් යොදා ගන්නා ලදී.වසර තුළදී, රුපියල් මිලියන 225න් රුපියල් මිලියන 207ක් යොදා ගනිමින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමෙන් කාර්මික තාක්ෂණ ආයතනයට සිය මූල්‍ය ප්‍රගතිය 92%ක් ලෙස වාර්තා කිරීමට හැකි විය.ආයතනයේ පුද්ගල වැටුප් සහ පුනරාවර්තන වියදම් සඳහා පුනරාවර්තන ප්‍රදානයක් ලෙස 2019 වසරේදී ITI හට රුපියල් මිලියන 250ක් ලැබිණි.

ආයතනයේ ආදායම 2018 දී රුපියල් මිලියන 324 සිට 2019 දී රුපියල් මිලියන 335 දක්වා වැඩි වී ඇති අතර, එම කාලය තුළ පුනරාවර්තන වියදම් රුපියල් මිලියන 552 සිට රුපියල් මිලියන 589 දක්වා වැඩි විය.ආදායම්/පුනරාවර්තන වියදම් අනුපාතය 52.4% සිට 51.7% දක්වා සුළු අඩුවීමක් පෙන්නුම් කළේය.පරීක්ෂණ සහ ක්‍රමාංකන සේවාවලින් ආයතනය තම ආදායමෙන් ඉහළ ප්‍රතිශතයක් උපයා ඇති අතර එය ජනනය කරන ලද ආදායමෙන් 63% (රුපියල් මිලියන 192) කි. තාක්ෂණ හුවමාරුව, තාක්ෂණ පුහුණුව ඇතුළු පුහුණු වැඩසටහන්, අභිරුචිකරණය කළ සේවා (customized services) සහ කොන්ත්‍රාත් ව්‍යාපෘතිවලින් ලැබූ ආදායම 37%ක් පමණ වේ.කොන්ත්‍රාත් සහ උපදේශන සේවා වලින් ලැබෙන ආදායම 2018 දී රුපියල් මිලියන 52 සිට 2019 දී රුපියල් මිලියන 85 දක්වා වැඩි වී ඇත.2018 ට සාපේක්ෂව 2019 දී තාක්ෂණ හුවමාරුවෙන් ලැබෙන ආදායම දෙගුණ වූ අතර එය රුපියල් මිලියන 7.51 ක් විය.ආයතනය වසර සඳහා නියම කරන ලද සමස්ත ආදායම් ඉලක්කයක් සපුරා ගැනීම හේතුවෙන් කාර්ය සාධනය පදනම් කරගත් දිරි දීමනා අඛණ්ඩව 16 වැනි වසර සඳහාත් කාර්ය මණ්ඩලය වෙත ගෙවන ලදී.

වර්ධනය වෙමින් ඉදිරියට යන, වෙනස් වන පරිසරයට අඛණ්ඩව හැඩගැසෙන කාර්මික තාක්ෂණ ආයතනය මීළඟ සියවස සඳහාද හොඳින් මුහුණ දෙනු ඇති බවට මම විශ්වාස කරමි.නුදුරු අනාගතයේ දී ශ්‍රී ලංකාවේ ආර්ථිකය යළි නගා සිටුවීම සහ එයට මහ පෙන්වීමට කාර්මික තාක්ෂණ ආයතනයට වැඩි මැදිහත්වීමක් සිදු කළ හැකි වෙනු ඇත.මෙම වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකාවේ සියලුම පුරවැසියන්ට වඩා යහපත් අනාගතයක් සඳහා ඉලක්කගත සේවාවන් සැපයීමට සහ එහි අරමුණු සපුරාලීම සඳහා වෙනස්වන පරිසරයට අනුවර්තනය වීමට සහ ඒවාට ප්‍රතිචාර දැක්වීමට කාර්මික තාක්ෂණ ආයතනය විසින් දියත් කරන ලද මුලපිරීම් විස්තර කරයි.

ස්තුතිය

සභාපති සහ කළමනාකරණ මණ්ඩලය, කළමනාකරණ කමිටුව, කාර්ය මණ්ඩලය, සේවාදායකයන්, රේඛීය අමාත්‍යාංශය සහ ප්‍රදායක නියෝජිතායතන.

ආචාර්ය ජේ.කේ.ආර්.ආර්. සමරසේකර
අධ්‍යක්ෂ ජනරාල්/ප්‍රධාන විධායක නිලධාරි, කාර්මික තාක්ෂණ ආයතනය

2.3 ක්‍රියාකාරී සැලැස්ම

අරමුණ :ශ්‍රී ලාංකීය ජනතාවගේ යහපත සඳහා කාර්මික සංවර්ධනය වේගවත් කිරීමට නව්‍ය පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කිරීම හා ජාත්‍යන්තර වශයෙන් තරඟකාරී තාක්ෂණික සේවා සැපයීම					
අංකය.	ක්‍රියා මාර්ග/ ප්‍රතිඵලය	ප්‍රධාන කාර්ය සාධන දර්ශක	ඉලක්කය	සත්‍ය	අදහස්
මූලික ප්‍රතිඵලය					
1	කර්මාන්ත සංඛ්‍යාව වැඩි කිරීම	ස්ථාපිත කළ නව කර්මාන්ත ගණන/ උත්ශ්‍රේණිගත කිරීම්	11	13	සාක්ෂාත් කරගැණින
2	තාක්ෂණය වාණිජකරණය වැඩිකිරීම	වාණිජකරණය වූ තාක්ෂණ ගණන	11	12	සාක්ෂාත් කරගැණින
		රාජ්‍ය භාගයෙන් උත්පාදිත ආදායම රු.(මිලියන)	2	1.1	සාක්ෂාත් කර නොගැණින
3	පාරිභෝගික තෘප්තිය වැඩි කිරීම	නිසි වේලාවට සැපයීම, තත්ත්වය, පිරිවැය, පැමිණිලි යනාදිය %	100	96	සාක්ෂාත් කර නොගැණින
4	මූල්‍ය කාර්ය සාධනය වැඩි කිරීම	ආදායම රු.(මිලියන)	316	335	සාක්ෂාත් කරගැණින
		වියදම් ප්‍රතිසාධන අනුපාතිකය %	56	57	සාක්ෂාත් කරගැණින
		ආදායම් වර්ධන අනුපාතය	15	5.2	සාක්ෂාත් කර නොගැණින
පිටවුම					
1	කර්මාන්තයට තාක්ෂණික පිවිසීම වැඩි වීම	සම්පූර්ණ කළ ව්‍යාපෘති ගණන	12	7	සාක්ෂාත් කර නොගැණින
		තාක්ෂණික පැවරුම් තුළින් උත්පාදිත ආදායම	5	7.5	සාක්ෂාත් කරගැණින
		පවරන ලද ව්‍යාපෘති තාක්ෂණ ගණන	42	45	සාක්ෂාත් කරගැණින
2	කර්මාන්තයට තාක්ෂණික විසඳුම් පිවිසීම වැඩි වීම	කර්මාන්ත වෙත පිරිනමන ලද නව පරීක්ෂණ සේවාවන්	24	35	සාක්ෂාත් කරගැණින
		පුහුණු සම්පූර්ණ කළ පුද්ගලයන් ගණන	200	220	සාක්ෂාත් කරගැණින
		සමීක්ෂණ සිදු කිරීමට සහ පරිසර දූෂණය අධීක්ෂණය	46	216	සාක්ෂාත් කරගැණින

		කිරීමට ලබාගත් උපදේශන සංඛ්‍යාව			
		සිදු කළ තාක්ෂණික පරීක්ෂණ 1/ ක්‍රමාංකණ ගණන	18,000	17978	සාක්ෂාත් කර නොගැණින
		තාක්ෂණික සේවාවන් තුළින් උත්පාදිත ආදායම (සියලුම මූලාශ්‍ර තුළින් උත්පාදිත මුලු ආදායමෙන් 1% ලෙස)	90	100	සාක්ෂාත් කරගැණින
		a. දේශීය කර්මාන්තයට ලබාදුන් සේවාවන්%	95	100	සාක්ෂාත් කරගැණින
		b. විදේශ කර්මාන්ත වෙත සේවාවන්%	5	0	සාක්ෂාත් කර නොගැණින
		සම්පූර්ණ කළ විදේශ පුහුණු/උපදේශන/තාක්ෂණික සේවාවන් ගණන	20	5	සාක්ෂාත් කර නොගැණින
		ISO 17025 ප්‍රතීතනය ලද පරීක්ෂණ/මැනීම් රසායනාගාර/ක්ෂේත්‍ර ගණන*	500	508	සාක්ෂාත් කරගැණින
		ISO 9001:2015 QMS සහතිකය ලත් පර්යේෂණ රසායනාගාර	5	5	සාක්ෂාත් කරගැණින
		සංවර්ධනය කළ/ PT ලබාදුන් CRMs/RMs සංඛ්‍යාව -QAD	10	5	සාක්ෂාත් කර නොගැණින
3	තාක්ෂණය පිළිබඳ නව දැනුම වෙත පිවිසීම	අධ්‍යාපන සුදුසුකම් සඳහා පහසුකම් ලද නිලධාරීන් ගණන (PhD/MPhil)	6	7	සාක්ෂාත් කරගැණින
		වෘත්තිය සුදුසුකම් සඳහා පහසුකම් ලද නිලධාරීන් ගණන (PhD/MPhil)	6	3	සාක්ෂාත් කර නොගැණින
		යොමුගත ජර්නලවල පල කළ පර්යේෂණ පත්‍රිකා ගණන	25	39	සාක්ෂාත් කරගැණින
		විද්‍යාත්මක සන්නිවේදන ගණන	80	113	සාක්ෂාත් කරගැණින
[1] තාක්ෂණික සේවා = පරීක්ෂණ/ක්‍රමාංකන, පුහුණුව සහ උපදේශන සේවා					
*අඛණ්ඩ ප්‍රතීතනය ඇතුළත් වේ					
T = ඉලක්කය A = සත්‍ය					

03 වන පරිච්ඡේදය:පාලනය සහ පාරිශ්‍රමික

3.1 මණ්ඩල කරුණු

කාර්මික කාර්මික තාක්ෂණ ආයතනය විසින් තාක්ෂණ ආයතනයේ කළමනාකරණ මණ්ඩලයට ආයතනයේ පරිපාලනය, කළමනාකරණය සහ කටයුතු පාලනය කිරීම පැවරී ඇති අතර එමඟින් ආයතනය සඳහා වන මෙහෙවර, උපාය මාර්ග, අරමුණු, මෙහෙයුම් ප්‍රතිපත්ති සහ ප්‍රමුඛතා අනුමත කරන අතර ප්‍රතිපත්තිවලට අනුකූල වීම සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම අධීක්ෂණය කරයි.

කළමනාකරණ මණ්ඩලය

විද්‍යා , තාක්ෂණික හා පර්යේෂණ විෂය භාර අමාත්‍යවරයා අවුරුදු තුනක නිල කාලයක් සඳහා මණ්ඩල සාමාජිකයින් පත් කරනු ලබයි.මණ්ඩලයට සභාපතිවරයෙකු, කාර්මික තාක්ෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයෙකු, මුදල් භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම් හෝ ඔහු නම් කළ පුද්ගලයෙකු, තාක්ෂණ පැවරීම සහ තාක්ෂණ සංවර්ධනය සඳහා අරමුදල් සපයන ආයතනයක ප්‍රධාන විධායක සහ විද්‍යාඥයන්, තාක්ෂණඥයන් සහ කාර්මික ව්‍යවසායකයන් අතුරින් අමාත්‍යවරයා විසින් පත් කරන ලද පහකට නොවැඩි සාමාජිකයින් සංඛ්‍යාවක් අයත් වෙයි.කාර්මික තාක්ෂණ ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් හැර අනෙක් සාමාජිකයින් විධායක ගණයට අයත් නොවේ.පහත සඳහන් සාමාජිකයින් 08 දෙනාගෙන් සමන්විත කාර්මික තාක්ෂණ ආයතනයේ මණ්ඩලය මසකට වරක් රැස්වේ.

2019 දෙසැම්බර් 8 වන දිනට

සභාපති

අමල් ආර් ඩයස් මහතා

සාමාජිකයින්

ආචාර්ය රධිකා සමරසේකර අධ්‍යක්ෂ ජනරාල්	ඩී නන්දනී සමරවික්‍රම මිය
කේ.ජී. ප්‍රදීප් පුෂ්පකුමාර මහතා	ඉන්දික ඩි සොයිසා මහතා
මහාචාර්ය රමණී විජේසේකර	එම්.ඒ.ජේ.එල්. රත්නවර්ධන මහතා
සුරේෂ් ප්‍රනාන්දු මහතා	ආචාර්ය නිශාන්ත නානායක්කාර මහතා

3.3 කළමනාකරණ කමිටුව

අධ්‍යක්ෂ ජනරාල්වරයා, කළමනාකරණ කමිටුවේ සභය ඇතිව සංවිධානය කළමනාකරණය කරයි.අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරු 3 දෙනෙකු, ජ්‍යෙෂ්ඨ තාක්ෂණ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් 12 ක්, ජ්‍යෙෂ්ඨ පරිපාලන නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් 3 ක්, ප්‍රධාන ඉංජිනේරු සහ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයාගෙන් කළමනාකරණ කමිටුව සමන්විත.ජ්‍යෙෂ්ඨ තාක්ෂණ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් වසර 3ක කොන්ත්‍රාත් කාලයක් සඳහා පත් කරනු ලබන අතර නිල කාලය අවසන් වූ විට මණ්ඩල සම්මුඛ පරීක්ෂනයකින් නව/ යළි පත් කිරීම් සිදු කරනු ලැබේ.

සංවිධානයේ උපාය මාර්ගය ක්‍රියාත්මක කිරීමට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීමට වග කියනු ලබන අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ප්‍රධානත්වයෙන් කමිටුව මාසික කමිටු රැස්වීම් පවත්වනු ලබයි.

2019 දෙසැම්බර් 31 වන දිනට

අධ්‍යක්ෂ ජනරාල්
ආචාර්ය ජේ.කේ.ආර්.ආර්. සමරසේකර

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, පර්යේෂණ හා සංවර්ධන
ආචාර්ය ඉල්මි ජී.එන්. හේවාසූලිගේ

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තාක්ෂණ සේවා
(පුරප්පාඩු)

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, පරිපාලන හා මෙහෙයුම්
කේ.ඒ.එස්.පී කළුආරච්චි මහතා

පර්යේෂණ හා සංවර්ධන

ආචාර්ය ඉල්මි ජී.එන්. හේවාසූලිගේ
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ආවරණ)
ආහාර තාක්ෂණ අංශය

ආචාර්ය පී. රණසිංහ
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ
ශාකසාර තාක්ෂණ අංශය

ආචාර්ය ඉරේෂා කෝට්ටෙගොඩ
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ
ද්‍රව්‍ය තාක්ෂණ අංශය

ඉංජී. එන්.ඒ.ටී.ඩී. ගුණසේකර
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ
පාරිසරික තාක්ෂණ අංශය

තාක්ෂණික සේවා

ආචාර්ය එච්.පී.පී.එස්. සෝමසිරි
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ
රසායනික සහ ක්ෂුද්‍ර ජීව විද්‍යා රසායනාගාරය

ආචාර්ය ඩබ්.එම්.එස්. විජේසිංහ
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ
කර්මාන්ත මිනුම් රසායනාගාරය

ආචාර්ය ඉංජී. ආර්.එම්. වීරසිංහ
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ
විද්‍යුත් තාක්ෂණ රසායනාගාරය

ඉංජී. ඒ.ටී.එම්. අධිකාරි
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ
ද්‍රව්‍ය තාක්ෂණ රසායනාගාරය

ආචාර්ය ආර්.එම්. ධර්මදාස
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ
ජෛව තාක්ෂණ ඒකකය

එම්. එන්. ඒ. මුබාරක් මහතා
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ
අවශේෂ විශ්ලේෂණ රසායනාගාරය

පරිපාලන සහ මෙහෙයුම්

හිරන්ති කත්‍රිආරච්චි මෙය
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ
පරිපාලන හා මානව සම්පත්

ඉංජි. ඒ.එස්. ආරච්චි
ප්‍රධාන ඉංජිනේරු
ඉංජිනේරු සේවා

ලලීන් ගුණරත්න මහතා
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ
මූල්‍ය දෙපාර්තමේන්තුව

මනෝරි විජේමාන්න මෙය
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ
අලෙවිකරණ හා ව්‍යාපාර සංවර්ධන

තත්ත්ව සුපරීක්ෂණ දෙපාර්තමේන්තුව
සජීවිකා පෙරේරා මෙය
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ

තොරතුරු සේවා මධ්‍යස්ථානය
පූර්ණිමා ජයසිංහ මෙය
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ

අභ්‍යන්තර විගණන
ප්‍රධාන අභ්‍යන්තර විගණක
(පුරප්පාඩු)

3.4 අභ්‍යන්තර විගණන

අභ්‍යන්තර විගණනය යනු ITI තුළ කළමනාකරණයේ සියලුම මට්ටම්වල ක්‍රියාකාරකම් සමාලෝචනය කිරීම සඳහා වන ස්වාධීන තක්සේරුකරණ කාර්යයකි.එය වූ කලී, ආයතනය තුළ සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම සඳහා දායකත්වයක් ලෙස අභ්‍යන්තර පාලනයන්, මූල්‍ය හා මූල්‍ය නොවන කාර්ය සාධනයේ ඵලදායීතාවය මැනීම, ඇගයීම සහ වාර්තා කිරීම සිදු කරන පාලනයකි.
ආයතනයේ ආයතනික ව්‍යුහයට අනුව අභ්‍යන්තර විගණන සභාපතිවරයා යටතේ ක්‍රියාත්මක වන අතර ආයතනයේ සභාපතිවරයාට සෘජුවම වාර්තා කරයි.

මෙම අභ්‍යන්තර විගණන වාර්ෂික ක්‍රියාකාරිත්වය පදනම් වන්නේ ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරනු ලබන සහ ඉන්පසුව ක්‍රියාත්මක කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන ගිණුම් නිලධාරී විසින් අනුමත කරන විගණන කමිටුවේ නිර්දේශ / අනුමැතිය සහිත වාර්ෂික අභ්‍යන්තර විගණන වැඩසටහන මතයි.විගණන වැඩ සටහනේ දක්වා ඇති විගණන පැවරුම්වලට අමතරව, වරින් වර ආයතනයේ සභාපති, කළමනාකරණ මණ්ඩලය හෝ අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලබන සැක සහිත වංචා හෝ වෙනත් විශේෂ පැවරුම් පිළිබඳව අභ්‍යන්තර විගණන අංශය විශේෂ පරීක්ෂණ සිදු කළ යුතුය.

තවද, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව, ආයතනයේ සියලුම ක්‍රියාකාරකම් සඳහා අභ්‍යන්තර පාලන පද්ධති සමාලෝචනය කිරීම හා ඇගයීම, පිරිවැය- ඵලදායීතාවය සඳහා නියමිත වේලාවට කාර්ය සාධනය සමාලෝචනය කිරීම සහ අනවශ්‍ය වියදම් ඉවත් කිරීම යනාදිය, බාහිර විගණකවරුන් සමඟ සම්බන්ධතා

පැවැත්වීම සහ විගණනයට පිළිතුරු සැපයීමේදී සම්බන්ධීකරණය කිරීම, විගණකාධිපතිවරයාගේ වාර්තා / විගණන විමසීම්, විගණන සොයාගැනීම් මත පදනම් වූ පසු විපරම් ක්‍රියාමාර්ග, ප්‍රඥප්ති, රෙගුලාසි, රීති සහ චක්‍රලේඛවලට අනුකූලද යන්න සොයා බැලීම, ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වීම සහතික කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම, නිර්දේශ / නියෝග ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීම විගණන කමිටුව සහ කළමනාකරණ මණ්ඩලය යනාදිය සිදු කළ යුතුය.

2019 වසරේදී, කාර්මික තාක්ෂණ ආයතනය තුළ විගණන සහ කමිටු තුනක් පවත්වා තිබිණි.මෙම වාර්තා කරන ලද කරුණු සම්බන්ධයෙන් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග / පිළියම් යෙදීමට පහසුකම් සැලසීම සඳහා විගණන කමිටුව වාර්තා සමඟ කළමනාකරණ මණ්ඩලයට මෙම නිර්දේශ ඉදිරිපත් කළේය. මෙම සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ රේඛීය අමාත්‍යාංශයේ පැවති විගණන හා කළමනාකරණ කමිටු හතරක් සඳහා අභ්‍යන්තර විගණන ප්‍රධානියා සහභාගී වී තිබේ.

3.5 වේතන

වැටුප්
සංවිධානයේ කාර්ය මණ්ඩලය සඳහා වන වැටුප කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය මත පදනම් වේ. අංශයේ ප්‍රධානී විසින් සිදු කරන ඇගයීමකින් පසුව වාර්ෂික වැටුප් වැඩි වීමක් ප්‍රදානය කෙරේ.

වෙනත් ප්‍රතිලාභ
විධායක නිලධාරීහු රාජ්‍ය අංශයේ වෘත්තිකයන්ට හිමි, වෘත්තීය දීමනාව, සන්නිවේදන දීමනාව, පර්යේෂකයින් සඳහා පර්යේෂණ දීමනාව සහ ඉහළ කළමනාකරණය ප්‍රවාහන දීමනාව ඇතුළත්වන මූල්‍ය ප්‍රතිලාභ භුක්ති විඳිති.රු.6000 වෛද්‍ය දීමනාව, කාර්ය සාධනය මත පදනම්වන දීමනාව සහ මූල්‍ය ඉලක්ක ළඟා කරගැනීම මත ලබාදෙන PF 380, සඳහා සමස්ත කාර්ය මණ්ඩලයම හිමිකම් කියයි. මෙම වරප්‍රසාද කාර්මික තාක්ෂණ ආයතනයෙහි සේවකයින් දිරිමත් කරයි.භාවිතයට නොගත් වෛද්‍ය නිවාඩු වර්ෂය අවසානයේදී ප්‍රතිපූරණය කරනු ලබන අතර වෛද්‍ය රක්ෂණ ක්‍රමයේ ප්‍රතිශතයක් ආයතනය විසින් දරනු ලැබේ.

04 පරිච්ඡේදය:කාර්ය සාධනයේ විශේෂ අවස්ථා

4.1 තාක්ෂණය පැවරීම්

සමාලෝචිත වසර තුළ ප්‍රධාන තාක්ෂණ පැවරීම් දෙකක් ගිවිසුම් තුළින් සම්පූර්ණ කෙරිණි .එමගින් (අ) අඩු ආදේශිත සුක්‍රෝස් සහිත පැතලි පාන් වර්ගයක් වන පෝෂණීය ස්කෝන් Cargills Quality Confectioneries (Pvt) Ltd වෙත සුවිශේෂී අයිතීන් සමග පවරන ලදී. (ආ) මිනිත්තු 5 කින් පිසිය හැකි වන ලෙස දේශීය සහල්වලින් සංවර්ධනය කළ නව්‍ය නිෂ්පාදනයක් වන InstantRice, ක්ෂණික බත් Keells Food Products PLC වෙත පවරන ලදී.

අඩු ආදේශිත සුක්‍රෝස් සහිත, පිරිනැමීමට සකසා ඇති පැතලි පාන් වර්ගයක් වන පෝෂණීය ස්කෝන්

දේශීය අමුද්‍රව්‍ය යොදා ගනිමින් සෞඛ්‍ය සම්පන්න පෝෂ්‍යදායී පිසින ලද ආහාරයක් සැකසීමේ අරමුණින් නිපදවන ලද පෝෂණීය ස්කෝන් නම් පැතලි පාන් සඳහා වන තාක්ෂණය Cargills Quality Confectioneries (Pvt) Ltd වෙත පැවරිණි. ප්‍රෝටීන් ඉහළ මුං, සෝයා බෝංචි පිටි, ඉරිඟු සහ තිරිඟු පිටි, කිරිපිටි, වියළි පලතුරු, සුක්‍රෝස්, තල ඇට සහ වෙනත් වැඩිදියුණු කාරක සමග සකසා ඇති මෙය විශේෂයෙන් ළමයින් සඳහා වන පෝෂ්‍යදායී ආහාරයකි.

ක්ෂණික බත් තාක්ෂණය පැවරීම සහ EZY RICE ලෙස වාණිජකරණය

ඉක්මනින් පිසිය හැකි සහල්/ක්ෂණික බත් නිෂ්පාදන තාක්ෂණය කාර්මික තාක්ෂණ ආයතනය විසින් වැඩි දියුණු කරන ලද අතර එය Keells Food Products PLC වෙත පවරන ලදී. මෙහිදී දේශීයව වගා කරන සාමාන්‍ය සහල්වලට භෞතික සැකසුමක් සිදු කොට මිනිත්තු 5ක් ඇතුළත සම්පූර්ණයෙන්ම පිස ගැනීමේ නව්‍ය ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබිණි. මෙම තාක්ෂණය මගින් කිසිදු රසායනික ද්‍රව්‍යක් එකතු නොකර සහල්වල ජල අවශෝෂණ වේගය වැඩි කර ඇත.ඒ අනුව ඉක්මණින් පිසිය හැකි බත් සඳහා රසකාරක කිහිපයක් හඳුන්වා දී ඇති අතර රසවර්ග හතරකින් EZY RICE ලෙස එය වාණිජකරණය කරනු ලැබීය. මෙම නිෂ්පාදනය 2019 සැප්තැම්බර් මාසයේදී Keells විසින් දියත් කරන ලද අතර එය දැන් සුපිරි වෙළඳසැල් සහ සිල්ලර වෙළෙඳසැල්වලින් ලබාගත හැකිය. බත් පිසගත හැකි පහසු ක්‍රමයක් ලෙස දැන් එය ජනප්‍රිය වෙමින් ඇත.

KASPER තාක්ෂණය සඳහා බලපත්‍ර ගිවිසුම

කිතුල් සක්‍රීය කිරීමේ සහ සාරය නිෂ්පාදනය වැඩි දියුණු කිරීමේ ප්‍රතික්‍රියාකාරක සඳහා KASPER තාක්ෂණය භාවිතා කිරීම පිණිස වසර තුනක් සඳහා APIC Agro Pvt Ltd සමග බලපත්‍ර ගිවිසුමක් අත්සන් කරන ලදී. මීට අමතරව KASPER නිෂ්පාදනය අලෙවි කිරීමට කාර්මික සංවර්ධන මණ්ඩලයේ ජාලය හරහා රට පුරා බෙදා හැරීමේ එකම නියෝජිතයා ලෙස කටයුතු කිරීම ඉදිරියට ගෙන යාම පිණිස කාර්මික සංවර්ධන මණ්ඩලය සමග අතිරේක බලපත්‍ර ගිවිසුමකට එළඹෙන ලදී.

තෙලිජ්ජ කිතුල් පානය පිළිබඳ තාක්ෂණය සඳහා අනාවරණය නොකිරීමේ ගිවිසුම

තෙලිජ්ජ දේශීය සහ ජාත්‍යන්තර වෙළෙඳපොළ වෙත ගෙන යාමට ඒ සඳහා වන තාක්ෂණය අනාවරණය නොකිරීමේ ගිවිසුමක් Agri Deshiya (Pvt) Ltd සමග අත්සන් කරන ලදී. පිරිසිදු කිතුල් යුෂ වලින් එහි නියම රසය රැකෙන පරිදි කිතුල් තෙලිජ්ජ නිෂ්පාදනය කරන අතර එහි සෞඛ්‍ය ප්‍රතිලාභද රැසකි.මෙම නිෂ්පාදනය, ඉහළ මට්ටමේ අපනයන වෙළෙඳපොළ සඳහා වන සියලුම ජාත්‍යන්තර තත්ත්ව ප්‍රමිති අවශ්‍යතා සපුරන අතර ඒ සඳහා ඉහළ ඉල්ලුමක් පැවතීමේ හැකි යාවක් ඇත.

නවීකරණය කරන ලද කොහුබත් තාක්ෂණය පැවරීම සඳහා අවබෝධතා ගිවිසුම

නවීකරණය කරන ලද කොහුබත් පාදක ද්‍රව්‍යවල තාක්ෂණය සහ එහි යෙදුම් නිෂ්පාදන හුවමාරු කිරීම සඳහා Taprobane International Ltd. සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

ක්ෂුද්‍ර ව්‍යවසාය (MEs) සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ආරම්භ කිරීමට/ප්‍රවර්ධනය කිරීමට සහ විද්‍යාත්මක මධ්‍යස්ථාන සහ විද්‍යාත්මක ව්‍යවසායකයන් හරහා ග්‍රාමීය කාර්මික සංවර්ධනය තුළ නව ව්‍යවසායන් ආරම්භ කිරීමට අවශ්‍ය තාක්ෂණය සැපයීමද කාර්මික තාක්ෂණ ආයතනය අඛණ්ඩව සිදු කළේ ය.සමාලෝචිත වසර තුළ ඉහත ව්‍යවසායකයන් සඳහා තාක්ෂණයන් 50 කට වැඩි ප්‍රමාණයක් පවරන ලදී.ජාතික අධ්‍යාපන ආයතනයේ ගුරුවරුන්ට ලබාදෙන පුහුණු හරහාද තාක්ෂණයන් පැවරීම සිදු කරන ලදී.පිරිනැමීමට සැකසූ පාන වර්ග, ආස්රුතිකව විජලනය කළ පලතුරු, ඖෂධීය ආලේපන සහ දියරමය ඩිටර්ජන්ට් වැනි ගෘහ ආරක්ෂණ නිෂ්පාදන සඳහා ඉහළ ඉල්ලුමක් පවතී. ‘‘රට වෙනුවෙන් එකට හිටිමු’’ ව්‍යාපෘතිය යටතේ ජනාධිපති ලේකම් කාර්යාලය සමග එක්ව කාර්මික තාක්ෂණ ආයතනය, යාපනය, මුලතිවු, මඩකලපුව සහ මොණරාගල ඇතුළු විවිධ ස්ථානවල තාක්ෂණ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන් ලදී.

4.2 පර්යේෂණ, සංවර්ධන සහ නවෝත්පාදනය

රජයට අයත් ප්‍රමුඛතම සහ විශාලතම ජාතික විද්‍යාත්මක පර්යේෂණ සහ සංවර්ධන ආයතනය ලෙස, කාර්මික තාක්ෂණ ආයතනය ශ්‍රී ලංකාවේ සහ ගෝලීය වශයෙන් රජය, පර්යේෂණ ජාලය, කර්මාන්ත සහ විශ්ව විද්‍යාල සමග සහයෝගයෙන් කටයුතු කරන සමස්ත ජාතිය සඳහා තාක්ෂණික නවෝත්පාදනයන් ලබා දීමේ අපගේ මූලික අරමුණ අඛණ්ඩව සපුරාලමින් සිටී.

2019 වසරේදී කර්මාන්ත සහ පාරිභෝගික ඉල්ලීම මත පදනම්ව පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති හැට තුනක් සැලසුම් කරන ලද අතර මෙම ව්‍යාපෘති, ආහාර, සෞඛ්‍යය, ජෛව තාක්ෂණය, ද්‍රව්‍ය, පරිසරය, ස්වභාවික සම්පත්, මිනුම් විද්‍යාව, විද්‍යුත් තාක්ෂණය සහ අනාගත කර්මාන්ත යනාදී ක්ෂේත්‍ර ආවරණය කරයි.කාර්මික තාක්ෂණ ආයතනය තාක්ෂණික ගැටළු 500 කට වැඩි ගණනක් සම්බන්ධව කටයුතු කළ අතර කර්මාන්ත සහ සමාජයට විසඳුම් සපයන ලදී.කොල්ලු ආශ්‍රිත නිෂ්පාදන, කිතුල් ආශ්‍රිත නිෂ්පාදන, ධාන්‍ය වර්ග ආශ්‍රිත නිෂ්පාදන සහ ඖෂධීය පැලෑටි ආශ්‍රිත ඖෂධ, ස්වභාවික සුවඳ වර්ග, ක්ෂුද්‍රතරංග ජලීන විසරණය සහ ගුරුත්ව තාක්ෂණය භාවිතයෙන් රූපලාවණ්‍ය සහ ආහාර කර්මාන්තය සඳහා භාවිතා කළ හැකිවන පරිදි නිස්සාරක සහ තෙල් වර්ග, ජෛව පලිබෝධ නාශක, පිරිසිදු කරන ලද මිනිරන්, ග්‍රැෆීන්, අඩු කරන ලද ග්‍රැෆීන් ඔක්සයිඩ් සහ ග්‍රැෆයිට් සංයෝග සහ ජලයෙන් දෘඪතාව සහ අනෙකුත් අපවිත්‍ර ද්‍රව්‍ය

ඉවත් කිරීම සඳහා ඛනිජ සහිත නවීකරණය කරන ලද මැටි සහ මී පැණිවල තත්ත්වය හඳුනාගැනීමේ කට්ටලය වැනි නිෂ්පාදන වාණිජ්‍යකරණය සඳහා මෙම ව්‍යාපෘති මගින් තාක්ෂණයන් සංවර්ධනය කරන ලදී.

4.2.1 තාක්ෂණ සංවර්ධනය

මී පැණිවල තත්ත්වය හඳුනාගැනීමේ කට්ටලය

ක්ෂේත්‍ර මට්ටමින් මී පැණිවල ගුණාත්මකභාවය පරීක්ෂා කිරීමට ගොවීන්ට සහාය වන සරල, වේගවත් සහ අඩු වියදම් මී පැණි තත්ත්ව හඳුනාගැනීමේ පරීක්ෂණ කට්ටලයක් සංවර්ධනය කරන ලදී.ශ්‍රී ලංකාවේ මී පැණි වල ගුණාත්මක භාවය ගබඩා කාලය, උෂ්ණත්වය, අපවිත්‍ර වීම සහ තෙතමනය වැනි විවිධ සාධක මත රඳා පවතී.එබැවින් ක්ෂේත්‍ර මට්ටමින් ගුණාත්මක බව අඩු කිරීම, සීනි සහ හයිඩ්‍රොක්සිමෙතිල්ෆර්ෆරල් (HMF) හඳුනාගැනීම සඳහා ඵලදායී හා වේගවත් ගුණාත්මක තාක්ෂණයක් අවශ්‍ය වේ.ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට අනුව මිනිස් පරිභෝජනය සඳහා මී පැණි SLS 464:2016 ප්‍රමිතීන්ට අනුකූල විය යුතු ය.වර්තමානයේදී ගුණාත්මක බව පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය සඳහා වැඩි කාලයක් ගතවන අතර ගොවියන් නියැදි ස්ථාන මාරුකිරීමේ අසීරුතාවන්ටද මුහුණ දෙයි.සංවර්ධිත ශීඝ්‍ර පරීක්ෂණ කට්ටලය කෙටි කාලයක් තුළ විශ්වාසනීය සහ ලාභදායී තත්ත්ව පරීක්ෂාවක් සපයන අතර මී පැණි උසස් තත්ත්වයේ නිෂ්පාදනයක් බව සහතික කරයි.

ශබ්ද මාත්‍රාව පරීක්ෂා කිරීම සඳහා ක්‍රම සංවර්ධනය

ලෝක සෞඛ්‍ය සංවිධානයේ මාර්ගෝපදේශයන්ට අනුව නිෂ්පාදන කර්මාන්තවල නිෂ්පාදන පරිසරයක් තුළ සේවකයින් ඉහළ ශබ්ද මට්ටමට නිරාවරණය කිරීම සිදු නොකළ යුත්තකි. එබැවින්, කාර්මික ශබ්ද පාලනය සඳහා නිෂ්පාදන සමාගම්වල ශබ්ද නිරාවරණ මට්ටම් නිරීක්ෂණය කළ යුතු අතර සේවකයින් ආරක්ෂා කිරීම සඳහා ආරක්ෂක පියවරයන් ගත යුතුය. ශබ්ද නිරාවරණ මැනීම විශාල කාලයක් ගතවන කාර්යයකි. කාර්මික තාක්ෂණ ආයතනය වෘත්තීයමය ශබ්ද නිරාවරණය සඳහා කර්මාන්තවල ශබ්ද මාත්‍රාව වේගවත්ව මැනීම සඳහා ක්‍රමයක් සංවර්ධනය කර ඇත. අලුතින් සංවර්ධනය කරන ලද මෙම ක්‍රමය ප්‍රමුඛ පෙළේ නිෂ්පාදන සමාගමක් තුළ යොදවා මැනුම් සිදු කර වලංගුකරණය කරන ලදී.

රබර්වල තාප සන්නායකතාව වැඩි කිරීම

තරගකාරී ගෝලීය වෙළෙඳපොළ තුළ රැඳී සිටීමට අඩු පෙරළීම් ප්‍රතිරෝධයක් සහ වැඩි ගෙවී යාම් ප්‍රතිරෝධයක් සහිතව ටයර්වල කාර්ය සාධනය වැඩි දියුණු කළ යුතුය.ඝර්ෂණ ප්‍රතිරෝධය, කම්පනය සහ පෙරළීමේ ප්‍රතිරෝධය ප්‍රශස්ත කිරීම සඳහා රබර් නිවැරදිව මිශ්‍ර කළ යුතුය.ඒ අනුව ග්‍රැෆයිට් භාවිතයෙන් රබර්වල තාප සන්නායකතාවය වැඩි දියුණු කිරීම සඳහා ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී.ග්‍රැෆයිට්/රබර් යොදාගෙන සංයෝග සකසන ලද අතරඉහළ තාප සන්නායකතාවක් සහ යාන්ත්‍රික ලක්ෂණ සහිත රබර්/ග්‍රැෆයිට් නැනෝ සංයෝග සංවර්ධනය කරනු ලැබීය. යාන්ත්‍රික ලාක්ෂණික පරීක්ෂා කිරීම සඳහා කර්මාන්ත සමග සාකච්ඡා සිදුවෙමින් පවතී.

ස්වභාවික තිරුවානා, සූර්ය පැනල සැකසීමට සුදුසු ශ්‍රේණියේ සිලිකන් බවට හැරවීම

දේශීයව පවතින ඛනිජ වැනි ස්වභාවික සම්පත්වලට අගය එකතු කිරීම මින් පෙර මෙරට තුළ සිදු නොකළ දෙයක් වන අතර එමඟින් රටට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් උපයා ගැනීමට මග සැලසේ.කාර්මික තාක්ෂණ ආයතනය ස්වභාවික තිරුවානා, සූර්ය පැනල සැකසීමට සුදුසු - ශ්‍රේණියේ සිලිකන් බවට හැරවීම

සඳහා වන පර්යේෂණ ව්‍යාපෘතියක් ආරම්භ කළේය.සමාලෝචන වර්ෂය තුළ, සූර්ය ශ්‍රේණියේ සිලිකන් නිස්සාරණය කිරීමට හැකි වන විද්‍යුත් රසායනික ප්‍රතික්‍රියා ආරම්භ කිරීම සඳහා අවසාන අදියර සඳහා අවශ්‍යතා කිහිපයක් සම්පූර්ණ කර ඇත.

ඉහළ ගුණාත්මක බවකින් යුත් ග්‍රැෆින් පදනම් ද්‍රව්‍යයක් නිෂ්පාදනය

ග්‍රැෆයිට් යනු රට තුළ පවතින වටිනා ස්වභාවික සම්පතක් වන අතර, දැනට ප්‍රධාන වශයෙන් අමුද්‍රව්‍යයක් ලෙස හෝ සුළු අගය එකතු කිරීමක් සමග අඩු මිලට අපනයනය කෙරේ. සමාලෝචිත වර්ෂය තුළ අගය එකතු කළ නිෂ්පාදන ලෙස මිනිරන්වලින් ග්‍රැෆීන් ඔක්සයිඩ් සහ ග්‍රැෆයිට් ඔක්සයිඩ් මහා පරිමාණයෙන් සංශ්ලේෂණය කිරීම විවිධ නව ක්‍රම භාවිතා කරමින් අඛණ්ඩව සිදු කරන ලද අතර ඒවාට පේටන්ට් බලපත්‍රය ලබා ගන්නා ලදී.

MI උෂ්ණත්ව උමං පාලන පද්ධතිය සංවර්ධනය කිරීම

පළමු අදියරේ උෂ්ණත්ව උමං සංවර්ධන ව්‍යාපෘතියේ දී, උෂ්ණත්ව නිරීක්ෂණ පද්ධතිය සංවර්ධනය කිරීම, ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදී.පද්ධතිය නිරීක්ෂණය කරන ලද අතර සුමට ක්‍රියාකාරීත්වය සඳහා සමහර වෙනස්කම් සිදු කළේය.ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ, උෂ්ණත්ව අනුක්‍රමික පාලන පද්ධතිය සංවර්ධනය කිරීම සහ උමග තුළ රත් වූ වාතය ඉවත් කර උෂ්ණත්වය අඩු කිරීම සඳහා කාර්මික විදුලි පංකා දෙකක් මිණුම් විද්‍යාව කිරීම සඳහා වෙනම පාලන පද්ධතියක් නිර්මාණය කරන ලදී.

SMART අලෙවි යන්ත්‍රය (vending machine) සංවර්ධනය කිරීම

ඉංජිනේරු සමාගමක් විසින් කරන ලද ඉල්ලීමකට අනුව, කාර්මික තාක්ෂණ ආයතනය විසින් සාමාන්‍ය තේ සහ කෝපි අලෙවි යන්ත්‍රයක් SMART අලෙවි යන්ත්‍රයක් ලෙස වැඩිදියුණු කිරීමට කටයුතු කරන ලදී.ස්වයංක්‍රීයව පාන වර්ග නිකුත් කිරීමේ හැකියාව ඇති SMART විකුණුම් යන්ත්‍රය දුරස්ථ සේවාදායකයකට මාර්ගගත ලෙස සැපයුම් තත්ත්වය යාවත්කාලීන කරයි.මෙම ව්‍යාපෘතිය යටතේ සම්පූර්ණ අර්ධ ස්වයංක්‍රීය යන්ත්‍රයම ප්‍රතිසංස්කරණය කර ස්වයංක්‍රීයව කෝප්ප බෙදා හැරීමේ සහ පිරවුම් පද්ධතිය අවශ්‍ය පාලන පද්ධති සමග ප්‍රතිනිර්මාණය කළ යුතුය.
මෙම පද්ධතිය දැන් ඉදිකිරීම් අදියර යටතේ පවතී.SMART ගෙවීම් ද්වාරය සමග සහ පොදු කාර්ය සම්පාදන ජාලයට සම්බන්ධ කිරීම සඳහා වැඩි දුර කටයුතු සිදු කළ යුතුව ඇත.

තෝරාගත් ශ්‍රී ලාංකීය කිරි වර්ගවල ක්ෂුද්‍රශාකවල ජෛව විවිධත්වය සහ තාක්ෂණික විභවයන්

කිරි ආශ්‍රිත පරිසරය තුළ පවතින ක්ෂුද්‍රජීවී විවිධත්වය නව මාදිලීන් සොයා ගැනීම සඳහා භාවිතා කළ හැකි සුවිසල් එමෙන්ම භාවිතා නොකරන ලද ජානමය සහ ජෛව විද්‍යාත්මක සංචිතයක් පවතී. අමු කිරිවල ක්ෂුද්‍රජීව විද්‍යාත්මක ගුණය සංරක්ෂණය කිරීම සහ පාලනය කිරීම ලොව පුරා අවධානයට ලක් වී ඇති කරුණක් වුවත්, අමු කිරිවල බැක්ටීරියා ජෛව විවිධත්වය පරීක්ෂාවට ලක් කළ අධ්‍යයනයන් ඇත්තේ කිහිපයකි. සෞඛ්‍යය සහ රෝග සම්බන්ධයෙන් ඒවායේ කාර්යභාරය පිළිබඳව ගැටළු ගණනාවක් දැනට නොවිසඳී පවතී. ඒ අනුව, ශ්‍රී ලංකාවේ නිපදවන අමු කිරිවල ක්ෂුද්‍රජීවීමය විවිධත්වය පරීක්ෂා කිරීම සඳහා අධ්‍යයනයක් ආරම්භ කරන ලදි.මෙම අධ්‍යයනයෙන් වෙන් කරගත් සහ හඳුනාගත් කෘත්‍යමය සහ කාර්මික විභවයන් සහිත ප්‍රයෝජනවත් ක්ෂුද්‍රජීවීන්, කාර්මික තාක්ෂණ ආයතනයේ ආහාර තාක්ෂණ

අංශය තුළ පර්යේෂණ සහ කාර්මික යෙදවුම් සඳහා වන ශ්‍රී ලංකාවේ පළමු තථ්‍ය කිරි ක්ෂුද්‍රජීවී රෝපණ භාණ්ඩාගාරයක් ස්ථාපිත කිරීම සඳහා පදනම සකසන ලදී.

4.2.2 පැවරීම සඳහා සූදානම්ව ඇති තාක්ෂණය

දිරාපත් වන ආහාර අපද්‍රව්‍ය දිනක් ඇතුළත කොම්පෝස්ට් කිරීමට ගෘහ කොම්පෝස්ට් බඳුන්

නිවාස මට්ටමින් දිරා යන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමට ක්‍රමයක් සැකසීම නිවසේ ආහාර අපද්‍රව්‍ය කළමනාකරණයට ඵලදායී පිළිතුරක් සපයයි. මුළුතැන්ගෙයින් ඉවත ලන දිරායන අපද්‍රව්‍ය සඳහා ක්‍රමයක් සැකසීමේ අරමුණින් ගෘහ කොම්පෝස්ට් බඳුනක් සකසා ඇත.මෙම කොම්පෝස්ට් බඳුනෙන් පැය 24 ක් ඇතුළත අපද්‍රව්‍ය කොම්පෝස්ට් කළ හැකි ය.

නිෂ්පාදනය කරන ලද කොම්පෝස්ට් වල C/N අනුපාතය, කාබනික ද්‍රව්‍ය අන්තර්ගතය, තෙතමනය සහ pH අගය ගුණාත්මක කොම්පෝස්ට්වල පිළිගත හැකි මට්ටමට සමාන වේ.තාක්ෂණ පරිමාණයන් සම්පූර්ණ කර ඇති අතර වාණිජකරණ ක්‍රියාවලිය සිදුකෙරෙමින් පවතී.ව්‍යාපෘතියේ ඊළඟ අරමුණ වන්නේ ආකර්ශනීය ලෙස නිර්මිත, සැහැල්ලු සහ පාරිභෝගිකයින් ඉලක්ක කරගත් වාණිජ යන්ත්‍රයක් නිෂ්පාදනය කිරීමයි.

කොල්ලුවලින් පෝෂණීය ආහාර නිෂ්පාදනය

කොල්ලු (*Macrotyloma uniflorum*) ඉතා අඩුවෙන් ප්‍රයෝජනයට ගන්නා රනිල කුලයට අයත් බෝගයක් වන අතර රනිල කුලයට අයත් බෝගවල ක්‍රියාකාරී ගුණාංග පරීක්ෂා කිරීමේදී එය ඉතා පෝෂ්‍යදායී බව හඳුනාගෙන ඇත.එය ප්‍රෝටීන්, තන්තු, ඛනිජ සහ ප්‍රතිරෝධී පිෂ්ඨයෙන් පොහොසත් වන අතර අඩු ග්ලයිසමික් දර්ශකයක් සහ ප්‍රතිඔක්සිකාරක ගුණයක් ද ඇත.කොල්ලුවලින් සැකසූ ග්‍රැනෝලා බාර්, කොල්ලුවලින් සැකසූ ක්ෂණික පෝෂ්‍යදායී කැඳ, පිටිකළ කොල්ලු ක්ෂණික පෝෂණීය පානය, කොල්ලු සහිත පිටි, කොල්ලුවලින් සැකසූ පෝෂණීය පානය සහ කොල්ලුවලින් සැකසූ පෝෂණීය පියළි යන නිෂ්පාදන හයක් සංවර්ධනය කෙරිණි.මෙම නිෂ්පාදන හයේ ආසන්න සංයුතිය සහ ආහාරමය තන්තු අන්තර්ගතය සිදු කර ඇති අතර නිෂ්පාදන වාණිජකරණය සඳහා සූදානම් කර ඇත.

ඕලු ඇට අඩංගු ආහාර නිෂ්පාදන

'ඕලු' (Nymphaea pubescens Willd) යනු ජලයේ වැවෙන ශාකයක් වන අතර එහි බීජ කැඳ සැකසීමේදී සම්ප්‍රදායිකව භාවිතා වේ.පෝෂ්‍ය පදාර්ථ වලින් පිරි ඕලු බීජ ආහාරමය තන්තු වලින් පොහොසත් වන බැවින් එය ආහාර ජීර්ණ පද්ධතියට ගුණදායක වන අතරම කොලෙස්ටරෝල් මට්ටම අඩු කරයි.පුම්බන ලද ඕලු ඇට සහිත පෝශණීය/අඩු කැලරි සහිත ආහාරයක් සහ ඕලු ඇටවලින් සැකසූ ක්ෂණික ඉඳි ආප්ප පිටි මිශ්‍රණයක් සංවර්ධනය කර ඇත.නිෂ්පාදනවල පෝෂණය සහ පෙව සක්‍රීය ගුණාංග ඇගයීමට ලක් කරන ලද අතර මෙම තාක්ෂණය වාණිජකරණය සඳහා සූදානම්ව පවතී.

පෙව ක්‍රියාකාරී ශාක සාරය භාවිතයෙන් ප්‍රතිප්‍රදාහ ජෙල් සැකසීම

ඖෂධීය ගුණ කිහිපයක් සහිත ඉතා වටිනා බහු විභව ශාකයක් වන කරපිංචා කොළ (Murraya koenigi) වල පෙව සක්‍රීය පත්‍ර සාරය ඇතුළත් කර මෙම ප්‍රතිප්‍රදාහ ජෙල් සංයුතිය සකස් කර ඇත.*Murraya koengii* හි එතනෝල් සාරය, ප්‍රතිඔක්සිකාරක ගුණයන් සහිතව Arachidonate-5-lipoxygenase සහ Xanthine oxidase එන්සයිම ප්‍රතිශේධාත්මක ක්‍රියාකාරීත්වයට අදාළව ප්‍රතිප්‍රදාහ ගුණාංග පෙන්නුම් කර ඇත.එමෙන්ම මෙම ජෙල් සැකසුම ඉහළ ක්ෂුද්‍රජීවී සංශුද්ධතාවයකින් යුත් පිළිගත හැකි භෞතික රසායනික සහ කාබනික ගුණ ද පෙන්නුම් කළේ ය.M. koenigii හි එතනෝල් සාරය අඩංගු මෙම ජෙල්

සැකසීම සෞඛ්‍යාරක්ෂණ කර්මාන්තයට හඳුන්වා දිය හැකි ප්‍රතිප්‍රදාහ/ප්‍රතිඔක්සිකාරක සම ආශ්‍රිත ජෙල් වර්ගයකි.

ක්ෂුද්‍ර තරංග හයිඩ්‍රෝ-විසරණය සහ ගුරුත්ව ක්ෂුද්‍ර තරංග තාක්ෂණය භාවිතයෙන් ශාක සාරය සහ තෙල්
ක්ෂුද්‍ර තරංග හයිඩ්‍රෝ-විසරණය සහ ගුරුත්ව ක්ෂුද්‍ර තරංග යනු වායුගෝලීය පීඩනය තුළ ක්ෂුද්‍ර තරංග තාපනය සහ ගුරුත්වයේ සංයෝජනයකි. එය ඖෂධීය සහ සුවඳැති ශාක, පලතුරු, එළවළු සහ හතු වර්ගවලින් රසය, සුවඳ, වර්ණක, සගන්ධ තෙල් සහ සුවඳ සංයෝග, ප්‍රතිඔක්සිකාරක සහ සුවිශේෂී රසයන් සහ සුවඳ විශේෂ සහිත වෙනත් පරිවෘත්තීජයන් නිස්සාරණය කරගන්නා නව හරිත තාක්ෂණයකි.

මයික්‍රෝවේව් තාක්ෂණයෙන් සකස් කරන ලද සම්පූර්ණ සාරය අතරට ස්ට්‍රෝබෙරි පළතුරු සාරය, කොමඩු සාරය, තක්කාලි සාරය, අන්නාසි පලතුරු සාරය, ඉඟුරු සාරය, වැනිලා බෝංචි අපද්‍රව්‍යවලින් වැනිලින් බහුල සාරය, වරකා සාරය, අනෝදා පලතුරු සාරය, ජැම්සන් පළතුරු සාරය, එෑණු සාරය, නැවුම් තේ කොළ වලින් කැටචින් සහිත තේ සාරය, කෙසෙල් පළතුරු සාරය, දෙහි, තැඹිලි සහ අන්නාසි ලෙලි වලින් සුවඳ සාරය යනාදිය ඇතුළත් වේ.ක්ෂුද්‍ර තරංග තාක්ෂණයෙන් නිස්සාරණය කරන සගන්ධ තෙල් සහ සුවඳ අතර කුරුඳු පොතු සහ කොළ තෙල්, බුලත් කොළ තෙල්, බැසිල් කොළ තෙල්, පැහිරි තෙල්, ඉඟුරු තෙල්, කළු තේ වලින් ගන්නා තේ සුවඳ සහ වරකා අපද්‍රව්‍යවලින් ලබාගන්නා වරකා පලතුරු සුවඳ ඇතුළත් වේ. .
ක්ෂුද්‍ර තරංග නිස්සාරණ තාක්ෂණය භාවිතයෙන් ලබාගත් රස, වර්ණක සහ සුවඳ ද්‍රව්‍ය සහ සගන්ධ තෙල්වලින් පොහොසත් සාරය රූපලාවන්‍ය සහ ආහාර නිෂ්පාදනවලට ඇතුළත් කළ හැකි ජෛව ක්‍රියාකාරී අමුද්‍රව්‍ය ලෙස හඳුනාගෙන ඇත.

ශ්‍රී ලංකාවේ වැවෙන ඖෂධීය සහ සුගන්ධවත් ශාක සාරයන් භාවිතයෙන් කෘෂි බෝගවල යුෂ උරාබොන පලිබෝධයන් සඳහා ස්වභාවික කෘෂිකාර්මික පලිබෝධ පාලන කාරකයන් සංවර්ධනය

ශාකවල සාරය උරාබොන කෘමීන් (plant hoppers, leafhoppers, mealy bugs, aphids, whiteflies, thrips etc.) බෝගවලට විශාල වශයෙන් හානි සිදු කරන අතර 40% සිට 100% දක්වා අස්වනු හානියක්ද ඇති කරයි.මෙම කෘමීන් පාලනය සඳහා සාම්ප්‍රදායික කෘෂි රසායන භාවිතා කිරීම මගින් පරිසර දූෂණය, ජීව විද්‍යාත්මක මාර්ගවල බාධා කිරීම් සහ මිනිස් සෞඛ්‍යයට හානි කිරීම වැනි අහිතකර බලපෑම් ගණනාවක් ඇති වේ. එබැවින්, වගාවන්ට හානි කරන පළිබෝධ විශේෂ පාලනය කිරීම සඳහා විකල්ප විසඳුමක් ලෙස කාර්මික තාක්ෂණ ආයතනය විසින් පරිසර හිතකාමී, ආරක්ෂිත, ලාභදායී ඖෂධීය ශාක පදනම් කරගත් හරිත නිෂ්පාදනයක් නිපදවා ඇත. මෙම නිෂ්පාදිතය ශ්‍රී ලංකාවේ ඖෂධීය සහ සුවඳැති ශාක සාරය භාවිතයෙන් සකස් කර ඇති අතරඑය ගෙවතු වගාවට මෙන්ම වාණිජ කාබනික ගොවිතැනෙහි යෙදෙන ගොවීන්ටද සුදුසුය.මෙම නිෂ්පාදන තාක්ෂණය කර්මාන්තය වෙත පැවරීමට සූදානම්ව ඇත.

4.3 තාක්ෂණික සේවාවන්ගේ සංවර්ධනය

කාර්මික තාක්ෂණ ආයතනය, රසදිය විශ්ලේෂණයේ ගෝලීය රසායනාගාර ඇගයීම නියෝජනය කරයි.
රසදිය පාරිසරිකව සංකේන්ද්‍රණය වීමට මිනිසා නිරාවරණය වීම ගෝලීය වශයෙන් අධීක්ෂණය කිරීමේ සැලසුමක් සංවර්ධනය" පිළිබඳව එක්සත් ජාතීන්ගේ පරිසර රසායනික හා සෞඛ්‍ය ශාඛා ව්‍යාපෘතියේ කොටසක් ලෙස ලොව පුරා රසදිය විශ්ලේෂණය කරන රසායනාගාරවල පවතින ධාරිතාව පිළිබඳ තොරතුරු රැස් කිරීම සඳහා රසදිය රසායනාගාර සමීක්ෂණයක් සිදු කරන ලදී.කාර්මික තාක්ෂණ ආයතනයේ අවශේෂ විශ්ලේෂණ රසායනගාරය ශ්‍රී ලංකාවෙන් පළමු වරට මෙම ගෝලීය ඇගයුම්

ප්‍රවීණතා පරීක්ෂණය තුළ එක්සත් ජාතීන්ගේ රසදිය විශ්ලේෂණයේ පාරිසරික ගෝලීය රසායනාගාර ඇගයීමේ පළමු වටයට සහභාගි වූ අතර ජෛව හෝ ජෛව නොවන සාම්පලවල රසදිය විශේෂ ප්‍රමාණනය කිරීමේ හැකියාව පෙන්නුම් කළේය.මෙම නියමු ඇගයුමේ ප්‍රතිඵල, රසදිය විශ්ලේෂණය කළ හැකි ලොව පුරා රසායනාගාරවල ධාරිතාව සහ ක්‍රියාකාරීත්වය අවබෝධ කර ගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහනට සහාය වන තීරණාත්මක පසුබිම් තොරතුරු ලෙස සේවය කරනු ඇත.

නව පරීක්ෂණ සේවා

සමාලෝචන වර්ෂය තුළ, කර්මාන්තයට සහ අපනයන වෙළෙඳපොළට සහාය වීම සඳහා පරීක්ෂණ සේවා විෂය පථය පුළුල් කරමින් තවත් පරීක්ෂණ සේවා ආරම්භ කරන ලදී; වර්ණමිතික/ වර්ණාවලි ඡායාරූපමිතික ක්‍රියා පටිපාටි භාවිතා කරමින් ස්වභාවික රබර් කිරිවල සහ නයිට්‍රයිල් අත්වැසුම්වල නිස්සාරණය කළ හැකි dialkyl-dithiocarbamate, thiuram සහ mercapto-benzothiazole accelerators ප්‍රමාණ කිරීම, LC-MS-MS භාවිතයෙන් කුළුබඩු වල පළිබෝධනාශක අවශේෂ විශ්ලේෂණය, GC-MS-MS භාවිතයෙන් ජලයේ ඇති පළිබෝධනාශක අපද්‍රව්‍ය විශ්ලේෂණය, පශු ප්‍රතිජීවක විශ්ලේෂණය, පසෙහි ඇති ග්ලයිෆොසේට් අපද්‍රව්‍ය විශ්ලේෂණය කිරීම, තේ ධාන්‍ය වර්ග සහ කුළු බඩුවල ඇති ඇෆ්ලැටොක්සින් විශ්ලේෂණය කිරීම, බදින තෙල්වල කෘත්‍රිම ප්‍රතිඔක්සිකාරක ප්‍රමාණාත්මක හා ගුණාත්මක විශ්ලේෂණය සඳහා HPLC ක්‍රමය.

4.4 යටිතල පහසුකම් සංවර්ධනය

ජානමය වශයෙන් වෙනස් කරන ලද ජීවී පරීක්ෂණ පහසුකම් පිහිටුවීම

ජානමය වශයෙන් වෙනස් කරන ලද ජීවීන් (GMOs) භාවිතා කිරීම සෑම විටම විවාදයට ලක්වන කරුණක්ව ඇති අතර බොහෝ රටවල් ඒ සඳහා නියාමන රාමු ස්ථාපනය කර ඇත.ඒ අනුව, කාර්මික තාක්ෂණ ආයතනය GMO හඳුනා ගැනීම සඳහා කඩිනම්, විශ්වසනීය සහ ඵලදායී ක්‍රමයක් සංවර්ධනය කළේ ය.තත්‍ය කාලීන PCR මත පදනම්ව ආහාර සාම්පලවල GMOs හඳුනාගැනීමේ විශේෂඥ දැනුමක් ඇති ශ්‍රී ලංකාවේ එකම රජයේ ආයතනය වන්නේ කාර්මික තාක්ෂණ ආයතනයයි.මෙම පරීක්ෂණය ශාක පදනම් කරගත් නැවුම් හෝ සැකසූ ආහාර මත සිදු කළ හැකිය.

ඉහත හැකියාවන් හඳුනා ගනිමින්, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය හරහා ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ (FAO) සහාය ඇතිව ජානමය වශයෙන් වෙනස් කරන ලද ජීවීන් / සජීව ක්ෂුද්‍ර ජීවීන් (GMO/LMO) සඳහා විමර්ශන රසායනාගාරයක් පිහිටුවීමට කාර්මික තාක්ෂණ ආයතනය තෝරාගෙන ඇත.

සෛල රෝපණ රසායනාගාරයක් ස්ථාපිත කිරීම සහ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි (SOP) ක්‍රියාත්මක කිරීම

සෛල රෝපණය යනු භෞතවේදී තත්ත්වයන් තුළ eukaryotic හෝ prokaryotic සෛල වර්ධනය සඳහා ඉඩ සලසන රසායනාගාර ක්‍රමයක් වන අතර ව්‍යාධි අධ්‍යයනය, ජාන හැසිරවීම සහ එන්නත් නිෂ්පාදනය ආදිය සඳහා ප්‍රයෝජනවත් වේ. සෛල රෝපණ රසායනාගාර පහසුකමක් ස්ථාපිත කරන ලද අතර සෛල පදනම් වූ ශිල්පීය ක්‍රම සහ අදාළ පර්යේෂණ ක්‍රියාකාරකම් සැලසුම් කර ලබා දී ඇති මාර්ගෝපදේශයන්ට අනුව ප්‍රශස්ත කරන ලදී. MTT සෛල සයිටොටොක්සිසිටි පරීක්ෂාව, උදාසීන රතු සහ ස්ඵටික වයලට් සෛල ශක්‍යතා පරීක්ෂාව, Hoechst staining මගින් dsDNA හඳුනාගැනීම සහ Caspase 3/7 පරීක්ෂාව භාවිතයෙන් ශාක සාරය සහ පිරිසිදු කළ කොටස් පිළිකා නාශක ක්‍රියාකාරකම්

සඳහා පරීක්ෂා කරන ලදී.ඉහත පරීක්ෂණ සඳහා Rhabdomyosarcoma අස්ථි පිළිකා සහ MCF 7 පියයුරු පිළිකා සෛල රේඛා භාවිතා කරන ලදී.

කෑන් කළ ආහාර සහ අඩු - තෙතමනයක් සහිතව සැකසූ ආහාර නිපැයීම සඳහා තාප ක්‍රියාවලියක් සහිත පහසුකමක් ස්ථාපිත කිරීම.

කෑන් කළ/බෝතල් කළ සහ සැකසූ ආහාර කර්මාන්තය, නිෂ්පාදනය, පරිභෝජනය, අපනයනය සහ වර්ධනය අතින් ගත් විට ශ්‍රී ලංකාව තුළ නැගී එන සහ ලාභදායී කර්මාන්තවලින් එකකි. අඩු අම්ල ටින් කළ ආහාර, ආම්ලික කළ ආහාර සහ තාපයෙන් සැකසූ අඩු තෙතමනය සහිත ආහාරවල පවතින ආවේණික ලක්ෂණ නිසා විය හැකි සෞඛ්‍ය අවදානම් ඇති අතර එම හේතුව නිසා තාප සැකසුම් භාවිතයෙන් සංරක්ෂණය කළ යුතුය.

එක්සත් ජනපද ආහාර සහ ඖෂධ පරිපාලන නියාමනයට (FDA) අනුව, රට තුළ ආරක්ෂිත ආහාර ව්‍යාපාරයක් ස්ථාපිත කිරීම සඳහා, ප්‍රමිතිගත ක්‍රම සහ පාලන පියවර වලංගුකරණය පිණිස වන පහසුකම් සහිත ක්‍රියාවලියක් අත්‍යවශ්‍ය වේ. බොහෝ තාක්ෂණ /නිෂ්පාදන/පැකේජ සංයෝජන සහ ආදේශක සහ ක්ෂුද්‍ර ජීවීන්, අංශු හෝ කොටස් වැනි ප්‍රතිනිහිත හේතුවෙන් ඉහත ගැටළු මහහරවා ගැනීමට භාවිතා කළ හැකි තාප ක්‍රියාවලි කාලය තක්සේරු කිරීම වඩ වඩාත් සංකීර්ණ වෙමින් පවතී.

ටින් කළ/බෝතල් කළ නිෂ්පාදන සහ සැකසූ ආහාර සඳහා නියමිත ක්‍රියාවලි ස්ථාපිත කිරීම සඳහා ක්‍රියාවලි අධිකාරිය ලෙස කාර්මික තාක්ෂණ ආයතනය ක්‍රියා කරන බැවින් දේශීය ආහාර කර්මාන්තයේ ඉලක්කගත ක්ෂුද්‍ර ජීවීන් පාලනය කිරීම සඳහා භාවිතා කරන තාප ක්‍රියාවලිය වලංගු කිරීමේ පහසුකම ස්ථාපිත කිරීමෙන් එහි ධාරිතාව පුළුල් විය.

4.5 ජාතික ගැටළු සඳහා දායකත්වය

ආරක්ෂිත පලතුරු ඉදවීමේ තාක්ෂණය පිළිබඳ නිර්දේශය

ජනාධිපති ලේකම් කාර්යාලයේ ඉල්ලීම පරිදි කාර්මික තාක්ෂණ ආයතනය පළතුරු වෙළෙන්දන් විසින් භාවිතා කිරීමට සුදුසුම පලතුරු ඉදවීමේ ක්‍රම තෝරා ගැනීමේ පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. පළතුරු වෙළෙන්දන් විසින් භාවිතා කරන දුම් ගැසීම, එතිලෝන් ඉසීම, ගිල්වීමේ ක්‍රම සහ එතිලෝන්වලින් විමෝචනය වන එතිලීන් වායුවට නිරාවරණය කිරීම යනාදී ක්‍රම පලතුරේ මතුපිට සහ ඇතුළත ඇති හානිකර අවශේෂ සහ ගුණාත්මක බව වෙනස් වීමට අදාළව අධ්‍යයනය කරන ලදී. එතිලෝන් වලින් මුදා හරින එතිලීන් වායුවට නිරාවරණය වීම පලතුරු ඉදවීම සඳහා ආරක්ෂිත ක්‍රමය ලෙස හඳුනාගෙන නිර්දේශ කරන ලදී.

පුත්තලම කලපුවේ රසදිය දූෂණය නිරීක්ෂණය කිරීම

මිනිස් ක්‍රියාකාරකම් වැඩිවීම සහ ගංගා හා නාගරික පෙදෙස් සෝදායාමෙන් රැගෙන එන දූෂකකාරකයන් දරාගැනීමේ ස්වභාවික තැන්පතුවක් බවට පත්ව ඇති නිසා කලපු අවසාදිතයන් නිරන්තරයෙන් දූෂණයට ලක් වේ. ලෝහ වැනි අපවිත්‍ර ද්‍රව්‍ය මෙසේ අවසාදිතවල එකතු වන අතර කාලයත් සමඟ අවට පරිසරයට අනතුරුදායක විය හැකි මට්ටමට ළඟා වෙයි.

මෙම ජාතික මට්ටමේ ගැටළුවට පිළිතුරු සෙවීම සඳහා පුත්තලම කලපු ජලයේ දූෂණය, අවසාදිත සහ රසදිය සහිත මත්ස්‍යයන් හා වෙනත් බැර විෂ ලේහ වර්ග හඳුනාගැනීමට ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

4.6 ජාතික ව්‍යාපෘති සඳහා දායකත්වය

තාක්ෂණික දැනුම හඳුන්වා දීමෙන් පවතින ආහාර කර්මාන්ත/ව්‍යවසායකයින් වැඩිදියුණු කිරීම
ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) ආර්ථික සංවර්ධනය තුළින් දේශීය සවිබල ගැන්වීම් (LEED) ව්‍යාපෘතිය සමගින් යාපනය, කිලිනොච්චිය සහ වවුනියාව යන ප්‍රදේශවල තෝරාගත් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (MSMEs) වැඩිදියුණු කිරීම සඳහා ආහාර තාක්ෂණ සේවා ලබා දීමට කාර්මික තාක්ෂණ ආයතනයට ආරාධනා කළේ ය.LEED ව්‍යාපෘතියේ අරමුණ වන්නේ රාජ්‍ය සහ පුද්ගලික් හවුල්කාරිත්වයෙන් ශ්‍රී ලංකාවේ උතුරු පලාතේ ගැටුම් මගින් බලපෑමට ලක් වූ කාන්තාවන් සහ පිරිමින් සඳහා තිරසර රැකියා නිර්මාණය කිරීමෙන් දිළිඳු බව අවම කිරීමයි. ඒ අනුව, ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් තාක්ෂණය සහ ආහාර සුරක්ෂිතතාව කළමනාකරණය සම්බන්ධව ගැටළු පවතින සහ විවෘත වෙළෙඳපොළ තුළ කාර්ය සාධනය සහ තරගකාරීත්වයට බාධා පැමිණි කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දහයක් තෝරාගන්නා ලදී.කාර්මික තාක්ෂණ ආයතනයේ නිලධාරීන් කණ්ඩායමක් එම කර්මාන්තවල වර්තමාන සැකසුම් තාක්ෂණයන්, ආහාර සුරක්ෂිතතා කළමනාකරණ පිළිවෙත් සමීක්ෂණය කිරීමට ඒ වෙත සංචාරය කළ අතර ව්‍යවසායකයන්ගේ දැනුම තහවුරු කිරීමට ඔවුන් සමග සාකච්ඡා පවත්වන ලදී.කාර්මික තාක්ෂණ ආයතනය විසින් පුහුණුව, නව නිෂ්පාදන සංවර්ධනය, නිෂ්පාදන සැලසුම් කිරීම, ආහාර සුරක්ෂිතතා මාර්ගෝපදේශ මත පදනම්ව ආයතනය පිරිසැලසුම් කිරීම සහ සුදුසු ඇසුරුම්කරණය යනාදියට අදාළව ධාරිතා සංවර්ධනය ලබා දෙනු ඇත.

පිටත මධ්‍යම අධිවේගී මාර්ගය සඳහා ශබ්ද බාධක සැලසුම්
කඩවත අන්තර් හුවමාරුව සහ මුතුරාජවෙල දක්වා මාර්ගය දිගුව, පිටත මධ්‍යම අධිවේගී මාර්ගය (OCH) - 3 වැනි කොටස ව්‍යාපෘතිය යටතේ කටුනායක අධිවේගී මාර්ගයට සම්බන්ධ කිරීමට නියමිතය.කඩවත අන්තර් හුවමාරුව සඳහා ශබ්ද බාධක සැලසුම් කිරීම සහ පිටත වටරවුම් මාර්ගයේ මුතුරාජවෙල ප්‍රදේශයේ කිලෝමීටර 2 ක දුරක් හඳුනා ගැනීම සඳහා කාර්මික තාක්ෂණ ආයතනය වෙත පවරන ලදී.ඒ අනුව මුතුරාජවෙල දෙසට ශබ්ද බාධක යෝජනා කරන ලද අතර මධ්‍යම අධිවේගී පිවිසුම සඳහා සුදුසු ශබ්ද බාධක තෝරා ගැනීම සඳහා බාධක පිරිවිතර සකස් කරන ලදී.

ශ්‍රව්‍ය විද්‍යා කාමර සඳහා ශබ්ද පරිවාරක පද්ධතියක් සැලසුම් කිරීම AYATI ව්‍යාපෘතිය
රාගම රෝහලේ AYATI මධ්‍යස්ථානය විවිධ ආබාධ සහිත දරුවන් සඳහා බහුවිධ සත්කාර ලබාදීමේ ජාතික විශිෂ්ටතා මධ්‍යස්ථානයකි. රාජ්‍ය සහ පුද්ගලික අංශය එක්ව දියත් කරන මෙම මූලාරම්භය මගින් රට තුළ පවතින දැවෙන ප්‍රශ්නයකට පිළියම් ලැබෙනු ඇත. මෙම මධ්‍යස්ථානය ශ්‍රව්‍ය පරීක්ෂණ විද්‍යාගාර කිහිපයකින් සමන්විත අංග සම්පූර්ණ ශ්‍රව්‍ය විද්‍යා පරීක්ෂණ පහසුකම්වලින් යුතු වනු ඇත.

මෙහි 20dB සිට 11dB දක්වා වෙනස් වන බහු පරිවාරක මට්ටම් සහිත ශබ්ද ආරක්ෂණ සැලසුම සිදු කිරීමට කාර්මික තාක්ෂණ ආයතනයට ආරාධනා කරන ලදී. ස්ථානීය විමර්ශන මත පදනම්ව, නිශ්චිත ශබ්ද ආරක්ෂණ මට්ටම් සැලසුම් කිරීමේ කාර්යය කාර්මික තාක්ෂණ ආයතනය විසින් ඉටු කරන ලදී.මේ වන විට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අදියරේ පවතී.

සංඥා වර්ණ කේතීකරණය සඳහා ආහාර නිෂ්පාදන විශ්ලේෂණය
ශ්‍රී ලංකාවේ බෝ නොවන රෝග සඳහා ප්‍රධානතම සාධකයක් වන්නේ අධික සීනි, ලුණු සහ මේදය සහිත ආහාර පරිභෝජනයයි. පෝෂණ අගය පිළිබඳව පාරිභෝගිකයන් දැනුවත් කිරීමේ අරමුණින්, මාර්ග සංඥා

ආලෝක භාවිතයෙන් ආහාර නිෂ්පාදනයේ සීනි, ලුණු සහ මේද ප්‍රමාණය සඳහන් කිරීම රජය විසින් අනිවාර්ය කරන ලදී. ඉහළ, මධ්‍යම සහ පහළ මට්ටම් සඳහා පිළිවෙලින් රතු, කහ සහ කොළ.කර්මාන්තවල ඉල්ලීම මත කාර්මික තාක්ෂණ ආයතනය විසින් වර්ණ කේතීකරණය සඳහා ආහාර නිෂ්පාදන පරීක්ෂණ වාර්තා 500 කට වඩා නිකුත් කරන ලදී.

බේරේ වැවේ අවසාදිතයන්ගේ ක්ෂුද්‍රජීව විද්‍යාත්මක තත්ත්ව ඇගයීම

කොළඹ නගරයේ පිහිටා ඇති බේරේ වැව, නගරයට දර්ශනීය සුන්දරත්වයක් එක් කරන අතරම ප්‍රදේශයේ ගංවතුර පාලනය කරයි.විවිධ කටයුතු හේතුවෙන් වැවේ ජලය අපවිත්‍ර වී ඇති අතර වැව පිරිසිදු කර සංවර්ධනය කිරීම සඳහා බේරේ වැව ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය ද ආරම්භ කෙරිණි.අවසාදිත තුළ වෙසෙන, අවසාදිත බැහැර කිරීම සඳහා තෝරාගත් ගොඩකිරීමේ ස්ථානවල පරිසර පද්ධතිවලට හානි කළ හැකි ක්ෂුද්‍රජීවීන් සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීමට කාර්මික තාක්ෂණ ආයතනය කැඳවනු ලැබිණි. එම කාර්යය සාර්ථකව නිම කරන ලද අතර, ගොඩකිරීම සඳහා අවසාදිතවල ඇති යෝග්‍යතාවය පිළිබඳව ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාවට (LRDC) නිර්දේශ ලබා දෙන ලදී.

4.7 මානව සුබ සාධනය සහ සමාජ ආර්ථිකය නැංවීම සඳහා තාක්ෂණය

සෞඛ්‍ය සම්පන්න ආහාර නිෂ්පාදන හඳුන්වා දීමෙන් මිනිසුන්ගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම

කොස්, වට්ටක්කා, කෙසෙල් සහ මාළු ඉහළ අස්වැන්නක් සහ නිසි අගය දාම කළමනාකරණයක් නොමැතිකම හේතුවෙන් පසුගිය කාලය තුළ ඉහළ පසු අස්වනු පාඩුවලට මුහුණ දුන් ඉහළ පෝෂණ ගුණයෙන් යුත් ආහාර වේ.මෙම කෘෂිකාර්මික නිෂ්පාදන උපයෝගී කර ගනිමින් සෞඛ්‍ය සම්පන්න ආහාර නිෂ්පාදන/ආහාර සැලසුම් සකස් කිරීම රටේ ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාව පවත්වා ගැනීමට මහඟු පිටුබලයක් වනු ඇත.මෙම ආහාරවල පවතින කෘත්‍යමය ගුණාංගවලට බෝනොවන රෝග මැඩලීමටද හැකියාව ඇත.

වෙළඳපල සහ සැපයුම් දාම කළමනාකරණය සමග ගුණාත්මක අගය එකතු කළ නිෂ්පාදන සංවර්ධනය කිරීම සහ කොස්, වට්ටක්කා, කෙසෙල් සහ මාළු වල පෝෂණ අගයේ වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.සංවර්ධනය කළ අගය එකතු කළ නිෂ්පාදන, අපනයනයන් තුළින් විදේශ විනිමයද වැඩි කරනු ඇති අතර දේශීය ප්‍රජාවගේ පෝෂණ පරතරයන්ද සපුරනු ඇත.

දියවැඩියා සහ කොලෙස්ටරෝල් රෝග කළමාකරණය කිරීම සඳහා අතිරේක ආහාරයක් ලෙස පෝෂණීය ක්ෂණික කැඳ

දියවැඩියාව සහ කොලෙස්ටෙරෝල් වැනි බෝ නොවන රෝග සමාජය තුළ ඉතා බහුල වන අතර එම රෝග පාලනය සඳහා ඇති හොඳම ක්‍රමය වන්නේ නිසි ආහාර සහ ව්‍යායාමයි.දේශීයව ලබාගත හැකි ඖෂධ පැලෑටි භාවිතයෙන් පෝෂණීය ක්ෂණික කැඳ *Cassia auriculata* (රණවරා), *Coccinia grandis* (කෝවක්කා), *Murraya koenigii* (කරපිංචා) and *Vernonia cinerea* (මොණරකුඩුම්බිය) සහ ධාන්‍යමය ආහාරයක් සංවර්ධනය කෙරෙමින් ඇත. ඉහළම ප්‍රතිඔක්සිකාරක-ක්‍රියාකාරී මිශ්‍රණය ලබා ගැනීම සඳහා ප්‍රතිඔක්සිකාරක ක්‍රියාකාරිත්වය ලබාගැනීමට ශාක කුඩුවල විවිධ අනුපාත ඇගයීමට ලක් කරන ලද අතර ඒ අනුව කැඳ මිශ්‍රණ දෙකක් සකස් කරන ලදී.සංවේදන ඇගයීම, ප්‍රතිඔක්සිකාරක ක්‍රියාකාරකම්, නිස්සාරණ සඳහා ලිපිඩ පරීක්ෂණ බැර ලෝහ සහ ක්ෂුද්‍ර පෝෂක විශ්ලේෂණ සිදු කරන ලදී.

දේශීයව වගා කරන රනිල වර්ගවල ජීව සක්‍රිය ප්‍රෝටීන ක්‍රියාකාරීත්වය සහ ප්‍රති-පෝෂණීය සාධක (ANFs) .

රනිල ධාන්‍ය වර්ග ප්‍රෝටීන්, කාබොහයිඩ්‍රේට් සහ තන්තු මෙන්ම අත්‍යවශ්‍ය විටමින් සහ ඛණිජ ලබාදෙන අනගි මූලාශ්‍රයකි.දේශීයව වගා කරන ආහාරයට ගත හැකි ශ්‍රී ලාංකීය ධාන්‍ය වර්ගවල වැදගත් පෝෂණීය දත්ත අධ්‍යයනය කර දත්ත ප්‍රකාශයට පත් කරන ලදී.බොහෝ ප්‍රතිපෝෂණීය සාධක; ප්‍රොටියේස් නිෂේධක සහ ඇන්ජියොටෙන්සින් I- හැරවීමේ එන්සයිම (ACE) නිෂේධක වැනි ජෛව සක්‍රිය සංයෝග පවතින බවට වාර්තා වී ඇත.ට්‍රිප්සින් සහ කයිමොට්‍රිප්සින් වැනි ප්‍රොටියේස් නිෂේධක සමහර පිළිකා සෑදීමේ අවස්ථා සහ ප්‍රතිප්‍රදාහ ලක්ෂණ අඩු කරන බවටත් වාර්තා කෙරිණි.ACE නිෂේධකය අධි රුධිර පීඩනය අඩු කිරීම හා සම්බන්ධ වේ.දේශීය රනිල වර්ගවල ජෛව සක්‍රිය ප්‍රෝටීන් සහ ANF දත්ත ලද නොහැකි බැවින්, එම සංරචක සඳහා ක්‍රමානුකූල දත්ත පදනමක් සංවර්ධනය කිරීමට වර්තමාන අධ්‍යයනය ආරම්භ කරන ලදී.

සමාලෝචිත වසර තුළ්, පිසූ බීජවල ප්‍රති-ඇමයිලේස් ක්‍රියාකාරීත්වය සහ රනිල කුලයට අයත් ප්‍රභේද 11 ක අමු සහ පීඩනයෙන් පිසූ බීජවල ට්‍රිප්සින් නිෂේධන ක්‍රියාකාරීත්වය ඇගයීමට ලක් කරන ලදී.

ආහාරවල ගුණාත්මක බව සහ තත්ත්වය රැක ගනිමින් බැදීමේ තත්ත්වයන්

ගැඹුරු තෙලෙන් බැදීම මගින් බදින තෙල්වල ඔක්සිකාරක සහ ජල විච්ඡේදක හායනය සහ බහුඅවයවීකරණය සිදු වන අතර එය නිදහස් මේද අම්ල, මධ්‍යසාර, චක්‍රීය සංයෝග, ඩයිමර් සහ පොලිමර් වැනි අතුරු නිෂ්පාදන රාශියකට මග පාදයි.භාවිත කළ තෙල්වල ඇති සමහර අතුරු නිෂ්පාදන මිනිස් සෞඛ්‍යයට අහිතකර බලපෑම් ඇති කරන බව හඳුනාගෙන ඇත.එබැවින්, බැදුම් තෙල් නරක් වීමට බලපාන සාධක අවබෝධ කරගැනීම වැදගත් වන අතර බදින ලද ආහාරවල ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා ඉවතලෑමේ නිෂ්පාදන ප්‍රමාණය නිරීක්ෂණය කළ යුතුය.

AOAC, ISO, AOCS සම්මත ක්‍රමයන් මත පදනම්ව බහුලව පවතින සහ භාවිතා වන සන්නාමගත බැදුම් තෙල් කිහිපයක පෙරොක්සයිඩ් අගය, අයඩින් අගය, තෙතමනය, නිදහස් මේද අම්ල අන්තර්ගතය, සඵනීකරණ අගය/ සඵනීකරනය නොවන පදාර්ථ, දුස්ස්‍රාවීතාවය, Lovibond වර්ණය, ඇනිසිඩීන් අගය, තයබාබිටියුරික් අම්ලය අගය, මේද අම්ල පරීක්ෂාවට බඳුන් කරන ලදී.

පර්යේෂණයෙන් ජනනය කරන ලද දත්ත, තෙල්වල ගුණාත්මකභාවය, ආරක්ෂාව සහ සත්‍යාපනය ඇගයීම සඳහා මූලික සමීක්ෂණයක් ලෙස භාවිතා කළ හැකිය.

ශ්‍රී ලාංකීය වෙළෙඳපොළ තුළ අලෙවි කරන තේ, පලිබෝධනාශක අවශේෂ සහ ඇෆ්ලටොක්සින් මගින් දූෂණය වීම

ශ්‍රී ලංකාව ලෝකයේ තුන්වන විශාලතම තේ අපනයනකරු වන අතර සිව්වන විශාලතම තේ නිෂ්පාදකයා වේ.තේ සඳහා පාරිභෝගික ඉල්ලුම වැඩි වීම, තේ පළිබෝධකයන් මැඩලීම සඳහා ඉහළ පළිබෝධනාශක භාවිතයට හේතු වී තිබේ.දේශීය වෙළඳපොලේ තේ පරිභෝජනයෙන්, පාරිභෝගිකයා පළිබෝධනාශක අපද්‍රව්‍ය සහ ඇෆ්ලටොක්සින් වලට නිරාවරණය වන ප්‍රමාණය තක්සේරු කිරීම සඳහා කාර්මික තාක්ෂණ ආයතනය විසින් සමීක්ෂණයක් පවත්වන ලදී.

අධ්‍යයනයෙන් අනාවරණය වූයේ, පලිබෝධනාශක අවශේෂ සහ ඇෆ්ලටොක්සින් දූෂණය තිබියදීත්, පලිබෝධ නාශක අවශේෂවල සහ ඇෆ්ලටොක්සින්වල ඇති අඩු නිස්සාරණ සඵලබව නිසා සහ ආසේචනය අතරතුර තාපමය හායනය සෞඛ්‍යයට අහිතකර තත්වයට පහළින් ඇති නිසා විමර්ශනය කරන ලද තේ පරිභෝජනයට සුදුසු බවයි.

***Moringa oleifera* වෙතින් සෞඛ්‍යමත් ආහාර සහ ඖෂධ සංවර්ධනය කිරීම**

Moringa olifera හි විවිධ ශාක කොටස්වල සාරය සමග ඔසු තේ වැනි දේ නිපදවන නව ව්‍යාපාරයන් සමග නිෂ්පාදන සංවර්ධනය. සමාලෝචිත වසර තුළ පිළිස්සුම් සඳහා ආලේපන, විරේචක මිශ්‍රණය, ප්‍රතිප්‍රදාහ ආලේපන, ප්‍රතිප්‍රදාහ ස්ප්‍රේ සහ මොරිංගා ඔලිෆෙරා සාරය ඇතුළත් කර ඇති තුවාල සුව කිරීමේ ආලේපන සැකසීම ප්‍රශස්තකරණය සම්පූර්ණ කෙරිණි.

තාප නොවන ක්‍රියාවලි භාවිතා කරමින් කුළුබඩු මතුපිට විෂබීජහරණය කිරීම

අස්වැන්න නෙළන වේලාවේ සිට මේසයට පැමිණි දක්වා වූ දිගු ගමනේදී කුළුබඩු බැක්ටීරියා සහ පුස්වලින් දූෂණය වේ.එතිලින් ඔක්සයිඩ් ධූමකරණය සහ විකිරණ පාත්‍රණය යන සනීපාරක්ෂණ ක්‍රම මෙම දූෂණයන් වලක්වා ගැනීමට භාවිතා කෙරේ.ප්‍රකිරණ ක්‍රියාවලිය බැක්ටීරියා, පුස් සහ අනෙකුත් කුඩා කෘමීන් විනාශ කිරීම සඳහා අයනීකරණ ශක්තිය භාවිතා කරන වඩා හොඳ ක්‍රමයක් වන අතර, ප්‍රකිරණයෙන් පසුව පවා කුළුබඩු වල භෞතික-රසායනික හා සංවේදී ගුණාංග එලෙසම පවතී.තෝරාගත් කුළුබඩු මතුපිට ක්ෂුද්‍ර ජීවීන් විනාශ කිරීම සඳහා සිසිල් ප්ලාස්මා / පාරජම්බුල ක්‍රියාවලි පරාමිතීන් ප්‍රශස්ත කිරීම පිණිස පර්යේෂණය ආරම්භ කරන ලදී.සමාලෝචිත වසර තුළ ඉහළ රික්ත සිසිල් ප්ලාස්මා පිරියම්කරණයක් භාවිතා කර විචල්‍ය වෝල්ටීයතාව යටතේ රික්ත සිසිල් ප්ලාස්මා පිරියම් කිරීමක් අධ්‍යයනය කළ් අතර ගම්මිරිස් ඇට සහ කුඩු සම්බන්ධව වටිනා ප්‍රතිඵල ලබාගන්නා ලදී.

ශ්‍රී ලංකාව තුළ වැඩි වශයෙන් පරිභෝජනය කරන සහ සාම්ප්‍රදායික සහල් වර්ගවලින් තෝරාගත් ප්‍රමාණයක පෝෂණීය, රසායනික, අණුක සහ රූප විද්‍යාත්මක ලක්ෂණයන් පිළිබඳ දත්ත ගොනුව සංවර්ධනය කිරීම:

සාම්ප්‍රදායික සහල් මෙන්ම වැඩි දියුණු කරන ලද සහල් වර්ග 60 කට අධික ප්‍රමාණයක් රට තුළ පවතී.කෙසේ වෙතත්, සාම්ප්‍රදායික සහ වැඩිදියුණු කරන ලද සහල් ප්‍රභේදවල පෝෂණ, රසායනික, අණුක සහ රූප විද්‍යාත්මක ලක්ෂණ පිළිබඳව රට තුළ සිදු කර ඇති අධ්‍යනයන් සීමා සහිත වන අතර ශ්‍රී ලංකාවේ තෝරාගත් සාම්ප්‍රදායික සහ බහුලව පරිභෝජනය කරන වැඩිදියුණු කළ සහල් ප්‍රභේදවල පෝෂණ, රසායනික, අණුක සහ රූප විද්‍යාත්මක ලක්ෂණ පිළිබඳ දත්ත ගබඩාවක් සංවර්ධනය කිරීමේ අරමුණින් ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී.සමාලෝචිත වර්ෂය තුළ සහල් පර්යේෂණ සහ සංවර්ධන ආයතනය වෙතින් සහල් වර්ග දහසයක් එක් රැස් කරගත් අතර GC-FID ක්‍රමය භාවිතයෙන් තෙතමනය, මුළු මේද අන්තර්ගතය සහ මේද අම්ල පැතිකඩ විශ්ලේෂණය කරන ලදී.බීජ රසායනික පරාමිතීන් යටතේ සහල් වර්ග හයක් ෆිනෝල් පරීක්ෂණය සඳහා පරීක්ෂා කරන ලදී.

4.8 නව මූලාරම්භයන්

තෝරාගත් ඌන උපයෝජිත පළතුරුවලින් එකතු කළ අගය සහිත නිෂ්පාදන

මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ, පාස්චරීකරණයේ උසස් තාක්ෂණය භාවිතා කරමින් අඩු වශයෙන් භාවිතා කරන පලතුරුවල පෝෂණය ආරක්ෂා කරගනිමින් සහ ජීවසක්‍රිය සංරචකයන් විනාශ වීම අවම කරමින් නිෂ්පාදන ගුණාත්මක බව පවතින ලෙසට යුෂ/පාන වර්ග වැනි සෞඛ්‍යයට හිතකර ආහාර සැකසීමයි.

පලතුරු, එළවළු යුෂ සහ අල පල්ප් වලින් නිෂ්පාදන සංවර්ධනය

මෙම අධ්‍යයනයේ පරමාර්ථය වූයේ වෙළෙඳ පොළේ ඉහළ පාරිභෝගික ඉල්ලුමක් ඇති පලතුරු/එළවළු යුෂ කුඩු නිෂ්පාදනය කිරීම සඳහා ඇලෙන සුළු බව පාලනය කිරීම සඳහා වාහක කාරක පරාමිතීන් සංවර්ධනය කිරීම, කැටි ගැසීම වැළැක්වීම සහ වියලීමයි. තවද තෝරාගත් ස්ප්‍රේ මගින් වියලන ලද කුඩුවල පෝෂණ ගුණ වැඩි දියුණු කිරීම සඳහා කැප්සියුලේෂන් ශිල්පීය ක්‍රම මගින් සහ අවසාන නිෂ්පාදනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා තෝරාගත් ස්ප්‍රේ මගින් වියලන ලද කුඩුවල මතුපිට වෙනස් කිරීම සිදු කිරීම ද අරමුණු කෙරිණි.

ගව කිරිවල ඇති රසායනික අවශේෂ සහ ශ්‍රී ලංකාව තුළ ඒ සම්බන්ධව පවතින සෞඛ්‍ය අනතුර

මෙම අධ්‍යයනයේ පරමාර්ථය වූයේ ශ්‍රී ලංකාවේ මධ්‍යම හා මහා පරිමාණ ගොවිපළවල් මඟින් නිෂ්පාදනය කරන ගව කිරිවල පශු වෛද්‍ය ප්‍රතිජීවක, පළිබෝධනාශක සහ මයිකොටොක්සින් අපද්‍රව්‍ය ගුණාත්මකව හඳුනා ගැනීම සහ ප්‍රමාණාත්මකව මැන බැලීම සඳහා ජාත්‍යන්තරව පිළිගත් විශ්ලේෂණ පරීක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීම හා සම්බන්ධ අවදානම් පැහැදිලි කිරීම සඳහා මූලික දත්ත උත්පාදනය කිරීමයි.

අපද්‍රව්‍ය තිරිඟු වලින් කෘත්‍යාත්මක බීම සංවර්ධනය කිරීම

මෙම අධ්‍යයනයේ පරමාර්ථය වූයේ දේශීය කිරි නිෂ්පාදන ජෛව සැකසුම් කර්මාන්තයෙන් ලබාගන්නා අපද්‍රව්‍ය තිරිඟු යොදා ගනිමින් එකතු කළ අගය සහිත ක්‍රියාකාරී පාන වර්ග සංවර්ධනය කිරීමයි.

ඇනත්‍රැක්නෝස් රෝගය පාලනය කිරීම සඳහා ශාක - පදනම් සංවර්ධනය කිරීම.

මෙම අධ්‍යයනයේ පරමාර්ථය වූයේ අඹ සහ පැපොල් වල ඇන්ත්‍රැක්නෝස් රෝගය පාලනය කිරීම සඳහා *Aloe vera* (කෝමාරිකා), *Zyzguym cumini* (මා දන්) සහ *Senna allata* (අත්තෝර) යන ශාකසාරවලින් දිලීර නාශකයක් නිපදවීමයි.

කුරුඳුවල නව ප්‍රභේද පිළිබඳ අධ්‍යයන

මෙම අධ්‍යයනයේ පරමාර්ථය වූයේ ශ්‍රී ලංකාවේ සංවර්ධනය කරන ලද ශ්‍රී විජය සහ ශ්‍රී ගැමුණු යන ඉහළ අස්වැන්නක් සහිත කුරුඳු ප්‍රභේදවල රසායනික, පෝෂණ සහ ක්‍රියාකාරී සෞඛ්‍ය ප්‍රතිලාභ අධ්‍යයනය කිරීම, සහ ලංකාවට ආවේණික කුරුඳු එහි භෞතික-රසායනික පරාමිතීන්, ජෛව ක්‍රියාකාරීත්වය සහ DNA අනුපිළිවෙල පිළිබඳව විමර්ශනය කිරීමයි.

ඌන උපයෝජිත ජෛව ක්‍රියාකාරී ඖෂධීය ශාක වලින් සෞඛ්‍ය නිෂ්පාදන

මෙම අධ්‍යයනයේ පරමාර්ථය වූයේ ශ්‍රී ලංකාවේ ජීවන රටාව හා බැඳුණු රෝග සඳහා ප්‍රතිකාර කිරීමට ඌන උපයෝජිත ජෛව ක්‍රියාකාරී ඖෂධීය ශාක ඇතුළත් එකතු කළ අගයන් සහිත සෞඛ්‍ය නිෂ්පාදන සංවර්ධනය කිරීමයි.

දේශීය මීනිරන් වලින් උෂ්ණත්වයට ඔරොත්තු දෙන ලිහිසි තෙල්

මෙම අධ්‍යයනයේ පරමාර්ථය වූයේ දේශීය ඛනිජ වලට අගය එකතු කිරීමක් ලෙස විද්‍යුත් රසායනික යෙදීම් සඳහා (අධික උෂ්ණත්වයකදී) අඩු වියදම් මීනිරන් මත පදනම් වූ සංයුක්ත ඉලෙක්ට්‍රෝඩයක් සෑදීමයි.

විද්‍යුත් රසායනික යෙදුම් සඳහා මිනිරන් පදනම් වූ සංයුක්ත ඉලෙක්ට්‍රෝඩය
පොලිමරික් බන්ධකවල අස්ථාවරත්වය නිසා කාබනික බන්ධක භාවිතයෙන් සැකසූ මිනිරන් පදනම් ඉලෙක්ට්‍රෝඩ සාමන්‍යයෙන් ඉහළ උෂ්ණත්වයේදී අසමත් වේ.එබැවින්, පවතින මිනිරන් පදනම් ඉලෙක්ට්‍රෝඩ අඩු උෂ්ණත්වයෙන් යුතු විද්‍යුත් රසායන යෙදුම්වලට පමණක් සීමා වේ.

ඉහළ උෂ්ණත්වයේදී ස්ථාවර ඉලෙක්ට්‍රෝඩ
මෙම අධ්‍යයනයේ පරමාර්ථය වූයේ කිසිදු අමතර බන්ධක ඇතුළත් නොකර ඉහළ උෂ්ණත්වවලදී ස්ථායී මිනිරන්-මැටි පදනම් වූ සංයුක්ත ඉලෙක්ට්‍රෝඩයක් සංවර්ධනය කිරීමයි.

පොලිතීන් මලු සඳහා අඩු වියදම් දිරා යන ප්ලාස්ටික් පටල
මෙම අධ්‍යයනයේ පරමාර්ථය වූයේ ලන්ච් ෂීට් සහ පොලිතීන් මලි භාවිතා කිරීම සඳහා සාපේක්ෂව අඩු වියදම් සහිත දිරා යන ප්ලාස්ටික් පටලයක් නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලියක් සකස් කිරීමයි.

ග්‍රැෆීන් නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා අපජල පවිත්‍රාගාරය
මෙම අධ්‍යයනයේ පරමාර්ථය වූයේ ග්‍රැෆීන් නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා නිෂ්පාදන ක්‍රියාවලි උපකරණ සහ අපජල පවිත්‍රාගාරයක් සැලසුම් කිරීමයි.

4.9 දායකත්වයන්

දක්ෂිණ කලාපයේ තිරසර සංවර්ධනය සඳහා විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව (COMSATS), කාර්මික සහ තාක්ෂණික පර්යේෂණ සංවිධාන සංගමය (WAITRO), උණ සහ වේවැල් පිළිබඳ ජාත්‍යන්තර ජාලය (INBAR), එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය (UNIDO), එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය (FAO), Deutsche Gesellschaft für Internationale Zusammenarbeit (GIZ), කැනඩාවේ ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානය (IDRC), එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP). චීනයේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය, කරච්චි විශ්ව විද්‍යාලයේ රසායනික ජීවවිද්‍යා සඳහා වන ජාත්‍යන්තර මධ්‍යස්ථානය, අර්ධ ශුෂ්ක නිවර්තන කලාප සඳහා ජාත්‍යන්තර බෝග පර්යේෂණ ආයතනය (ICRISAT) සහ එක්සත් ජනපදයේ ටොලේඩෝ විශ්ව විද්‍යාලය සමග කාර්මික තාක්ෂණ ආයතනය දීර්ඝකාලීන සහයෝගයන් සහ ඒකාබද්ධ වැඩසටහන් ඉදිරියට ගෙන ගියේය.

තාපමය නොවන ලෙස ආහාර වාණුහරණය කිරීම පිළිබඳ ඉන්දීය ශ්‍රී ලංකා සහයෝගිතාව
කාර්මික තාක්ෂණ ආයතනය සහ ඉන්දීය රසායන තාක්ෂණ ආයතනය අතර තාපමය නොවන ක්‍රියාවලියක් භාවිතයෙන් කුළුබඩු පෘෂ්ඨය වාණුහරණය කිරීම පිළිබඳ සහයෝගීතාවක් ආරම්භ කරන ලද අතර එහි අරමුණ වූයේ තෝරාගත් කුළුබඩු වර්ගවල පෘෂ්ඨය මත ක්ෂුද්‍රජීවී ගහණය ඵලදායී ලෙස තුරන් කිරීම සඳහා සිසිල් ප්ලාස්මා/UV ක්‍රියාවලි පරාමිතීන් ප්‍රශස්ත කිරීම සහ තෝරාගත් කුළුබඩු එළිමහන්ව තැබිය හැකි කාල සීමාව, සංවේදක ගුණාංග සහ භෞතරසායන මත සිසිල් ප්ලාස්මා/UV පිරියමේ ඇති බලපෑම අධ්‍යයනය කිරීමයි.

වසර තුළදී, තෝරාගත් දූෂ්‍ය වූ කුළුබඩුවල (ගම්මිරිස්, කැලි මිරිස්) ක්ෂුද්‍රජීවීන්, පුස් සහ බැක්ටීරියා හුදෙකලා කර රූපීයව සහ ජානමය ලෙස හඳුනා ගන්නා ලදී.මෙම ක්ෂුද්‍ර ජීවීන් මත UV-C පිරියම මගින් ක්ෂුද්‍රජීවී ප්‍රමාණය අඩු වීමක් පෙන්නුම් කළ අතර ගම්මිරිස් ඇට සහ කුඩු සඳහා රික්ත සිසිල් ප්ලාස්මා පිරියම යහපත් ප්‍රතිඵල පෙන්නුම් කළේය.

ස්ප්‍රේ මගින් වියලීම සහ පලතුරු හා එළවළු යුෂ සහ අල පල්ප් වලින් නිෂ්පාදන සංවර්ධනය

මුම්බායි හි රසායන තාක්ෂණ ආයතනය සහ මයිසූරයේ CFTRI සමග සහයෝගයෙන් වෙළෙඳ පොළේ ඉහළ ඉල්ලුමක් ඇති පලතුරු/එළවළු යුෂ කුඩු නිෂ්පාදනය කිරීම සඳහා ඇලෙන සුළු බව පාලනය කිරීම සඳහා වාහක කාරක පරාමිතීන් සංවර්ධනය කිරීම, කැටි ගැසීම වැළැක්වීම සහ වියලීම සම්බන්ධව ව්‍යාපෘතියක් ආරම්භ කෙරිණි. තවද ස්ප්‍රේ මගින් වියලන ලද තෝරාගත් කුඩුවල පෝෂණ ගුණ වැඩි දියුණු කිරීම සඳහා කැප්සියුලේෂන් ශිල්පීය ක්‍රම මගින් සහ අවසාන නිෂ්පාදනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා මතුපිට වෙනස් කිරීම සිදු කිරීම ද අරමුණු කෙරේ.

ජල පිරිපහදු පද්ධතියක් සඳහා රතු මැටි කැටිති සංවර්ධනය කිරීම

විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය (COSTI) සහ කොරියානු බුද්ධිමය දේපල කාර්යාලය (KIPO), කොරියානු රාජ්‍ය පරිපාලන ආයතනය (KIPA) සමඟ සහයෝගයෙන් Reverse Osmosis (RO) අංගනයක් සහිත ප්‍රජා මට්ටමේ ජල පිරිපහදු පද්ධතිය සඳහා රතු මැටි කැට යොදා ගනිමින් පූර්ව පිරිපහදු ක්‍රමයක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් දියත් විය. කාර්ය සාධන විශ්ලේෂණයක් සිදු කළ අතර නිදන්ගත වකුගඩු රෝගීන් බහුලව සිටින ප්‍රදේශවලට පූර්ව පිරිපහදු ඒකක ප්‍රශස්තකරණය කෙරිණි.

5 වන පරිච්ඡේදය:පරිසර දූෂණය අධීක්ෂණය සහ අවම කිරීම

ITI විසින් සමාලෝචිත වර්ෂය තුළ, වායු දූෂණ පාලනය සහ අවම කිරීම, අපජල පවිත්‍රකරණය, ඝන සහ අන්තරායකර අපද්‍රව්‍ය කළමනාකරණය, වාතාශ්‍රය කළමනාකරණය, ගෘහස්ථ හා එළිමහන් වාතයේ ගුණාත්මකභාවය සහ ආලෝක පරීක්ෂණ ඇතුළුව ජල තත්ත්ව අධ්‍යයන අනුකූලතා අධීක්ෂණය සහ සමීක්ෂණ, සහ පාරිසරික බලපෑම් ඇගයීම් (EIA), මූලික පාරිසරික පරීක්ෂණ (IEE) සහ අවදානම් තක්සේරු කිරීම් ඇතුළු පාරිසරික කළමනාකරණය සහ තාක්ෂණයේ විවිධ ක්ෂේත්‍රවල තාක්ෂණික 220 කට වැඩි ප්‍රමාණයක් පවත්වා ඇත.

5.1 අපජලය පවිත්‍රකරණය

කාර්මික තාක්ෂණ ආයතනයේ අපජල හා ජල තත්ත්ව විශේෂඥයින් විසින් පවිත්‍රකරණ ක්‍රියාවලිය පිළිබඳ නිදර්ශනයක් සැපයූ අතර අපජල පවිත්‍රාගාර ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ උපදේශන සැපයුවේය.සමාලෝචනයේදී කර්මාන්ත හා රෝහල්වල අපජල පවිත්‍රාගාර ඉදිකිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා ආදර්ශන සහ උපදේශන ඉදිරිපත් කරන ලදී.

ආහාරයට ගතහැකි තෙල් සහ මේද නිෂ්පාදන කර්මාන්තයක අපජලයේ ඉහළ COD මට්ටම් සඳහා වගකිව යුතු ප්‍රධාන හේතුව සහ ක්‍රියාවලිය තීරණය කිරීම සඳහා පුළුල් පර්යේෂණ සැලැස්මක් සහිත සමීක්ෂණ පදනම් වූ අධ්‍යයනයක් සිදු කරන ලදී. විශ්ලේෂණාත්මක ප්‍රතිඵල මත පදනම්ව අපජල පරාමිතීන් නියමිත සම්මත මට්ටම් තුළ පවත්වා ගැනීමට අවම කිරීමේ ක්‍රියාමාර්ග නිර්දේශ කරන ලදී.

වාහන සේවා ස්ථානවලින් බැහැර කරන අපජලය සඳහා රසායනික පිරිපහදු ක්‍රියාවලිය ජීව විද්‍යාත්මක පිරිපහදු ක්‍රියාවලියක් බවට පත් කිරීම සඳහා උපදේශනය ලබා දෙන ලදී.

5.2 වායු දූෂණය පාලනය

අවට වාතයේ ගුණාත්මකභාවය සහ දුම්කවුළු විමෝචනය අධීක්ෂණය කිරීම

1980 අංක 47 දරන ජාතික පරිසර පනතේ 32 වන වගන්තිය යටතේ 2008 අගෝස්තු 15 වන දින පළ කරන ලද 1562/22 අතිවිශේෂ ගැසට් පත්‍රයේ ජාතික පරිසර (අවට වාතයේ ගුණාත්මකබව) රෙගුලාසි තුළ නිර්දේශ කර ඇති ක්‍රම අනුව අවට වාතයේ ගුණාත්මකභාවය අධීක්ෂණය කරන ලදී. සමාලෝචන වර්ෂය තුළ, අනුරාධපුර ශ්‍රී මහා බෝධි පරිශ්‍රය, විල්පත්තු ජාතික වනෝද්‍යානය, ලක්විජය බලාගාරය, නොරොච්චලේ ගල් අඟුරු බලාගාරය සහ කොළඹ CHEC වරාය නගරය ආශ්‍රිතව වාතයේ ගුණාත්මකභාවය නිරීක්ෂණය කරන ලදී. හම්බන්තොට බනිජ තෙල් පිරිපහදුව සහ මුතුරාජවෙල එල්එන්ජී ව්‍යාපෘතිය සඳහා වාතයේ ගුණාත්මකභාවය පිළිබඳ මූලික සමීක්ෂණ සිදු කරන ලදී.

වාතයේ ගුණාත්මක බව ඇගයීම

කර්මාන්තශාලාවල සාමාන්‍ය ක්‍රියාකාරකම් හරහා මීතේන් නොවන VOC අවට පරිසරයට විමෝචනය කළ හැකිය.මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රමිතීන්ට අනුව විමෝචන මට්ටම් තක්සේරු කිරීම සඳහා සාමාන්‍ය මෙහෙයුම් වලදී ක්ෂණික මීතේන් නොවන වාෂ්පශීලී කාබනික සංයෝග (VOC) සඳහා වායු තත්ත්ව තක්සේරුවක් සිදු කරන ලදී.කැලණියේ Kent Display, රත්මලානේ ETAL සමූහය, දිවුලපිටියේ Sanken

constructions, කොටදෙණියාවේ Access Engineering PLC, පිළියන්දල Wilton Metal Box සහ මහරගම Toyota Lanka ඇතුළු කර්මාන්තවල වායු තත්ත්ව තක්සේරුව සිදු කරන ලදී.

වායු දූෂණ පාලන පද්ධති නිර්මාණය

පාරිසරික අධිකාරීන්ට අවශ්‍ය නියාමන ප්‍රමිතීන් සපුරාලීම සඳහා වායු දූෂණ පාලන පද්ධති සැලසුම් කිරීමේ සිට ක්‍රියාත්මක කිරීමේ අදියර දක්වා නවීන තාක්ෂණයන් සමඟින් කාර්මික තාක්ෂණ ආයතනය උපදේශන සේවා සපයයි. VOC මිනුම් අධ්‍යයනය කර නියමිත ප්‍රමිතීන් සමඟ ප්‍රතිඵල සංසන්දනය කිරීමෙන් පසු Vista Creation (Pvt) Ltd වෙත වායු දූෂණ පාලන පද්ධති සැලසුම් කර තාක්ෂණික උපදේශන ලබා දෙන ලදී.


5.3 ශබ්දය අවම කිරීම

විවිධ මූලාශ්‍ර සහ ක්‍රියාකාරකම්වලින් ජනනය වන ශබ්දය පරිසරය දූෂණය කරන අතර මිනිසාගේ කටයුතුවලට බාධා කරයි. එම නිසා පාරිසරික රෙගුලාසිවලට අනුව කර්මාන්ත විසින් අදාළ ප්‍රතිකර්ම ගත යුතු ය.කාර්මික තාක්ෂණ ආයතනය, එහි විශේෂඥතාව සහ උපකරණ පහසුකම් සහිතව, විශේෂයෙන්ම කර්මාන්ත සඳහා ශබ්දය අවම කිරීම සඳහා සේවාවන් සපයයි.සමාලෝචිත වර්ෂය තුළ, කාර්මික තාක්ෂණ ආයතනය තරු පහේ හෝටලයකට අමුත්තන්ට බාධා කරන ශබ්ද උත්පාදන මූලාශ්‍රයන් හඳුනාගෙන ඒවා අවම කිරීමට යෝජනාවක් සැපයුවේය.එසේම, කර්මාන්ත ශාලාවක ඉල්ලීම පරිදි එහි ජනනය වන ශබ්දය නිසා සේවකයන්ට සිදුවන අපහසුතාවයන් අවම කිරීම සඳහා, වෘත්තීය සෞඛ්‍ය සුරක්ෂිතතාව සහතික කිරීමට ශබ්ද අවම කිරීමේ විසඳුමක් ලබා දෙන ලදී.

6 වන පරිච්ඡේදය - කිරසර සංවර්ධනය

6.1 සේවා නියුක්ති සංඛ්‍යාලේඛන

ආයතනයේ මුළු ස්ථිර කාර්ය මණ්ඩලය 333 කි.මුළු ස්ථිර සේවක සංඛ්‍යාව තාක්ෂණික සේවා අංශයේ 127 (38%)කින්, පර්යේෂණ සහ සංවර්ධන අංශයේ 88 (26%)කින් සහ පරිපාලන සහ මෙහෙයුම් අංශයේ 59 (18%) කින් සමන්විත වෙයි.සභාපතිගේ කාර්යාලය, අධ්‍යක්ෂ ජනරාල්ගේ කාර්යාලය, අභ්‍යන්තර විගණන අංශය, ඉංජිනේරු සේවා අංශය, පරිගණක ඒකකය, තොරතුරු සේවා මධ්‍යස්ථානය සහ තත්ව සහතික අංශය වැනි අනෙකුත් අංශවල ස්ථිර සේවකයන් 59 (18%) ක් සේවය කරයි.රසායනික සහ ක්ෂුද්‍රජීව විද්‍යා රසායනාගාරය ආයතනයේ විශාලතම අංශය වන අතර එහි මුළු කාර්ය මණ්ඩලයෙන් 46 ක් (13.8%) ක් සේවය කරයි. රැකියා නියුක්ති සංඛ්‍යාලේඛන පහත දක්වා ඇත.




කාර්ය මණ්ඩලයේ බෙදී යාම


තාක්ෂණික අංශයට තාක්ෂණික කාර්ය මණ්ඩලයේ 76 ක්, පර්යේෂණ කාර්ය මණ්ඩලයේ 74 ක්, පරිපාලන කාර්ය මණ්ඩලය සහ කළමනාකරණ සහකාරවරුන් 23 ක් සහ අනෙකුත් කාර්ය මණ්ඩලය 33 ක් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් 9 දෙනෙකු ඇතුළත් වේ.

සහාය අංශවලට පරිපාලන සහ කළමනාකරණ සහකරුවන් 44, වෙනත් 27, තාක්ෂණික කාර්ය මණ්ඩලයේ 17 ක්, පර්යේෂණ කාර්ය මණ්ඩලයේ 05, ශිල්පීන් 17 සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් 06 දෙනෙකු අයත් වේ.කාර්ය මණ්ඩලය බෙදා හැරීම පහත ප්‍රස්ථාරවල දක්වා ඇත.

ප්‍රවර්ගය අනුව කාර්ය මණ්ඩලයේ බෙදී යාම
තාක්ෂණ අංශය




ප්‍රවර්ගය අනුව කාර්ය මණ්ඩලයේ බෙදී යාම
සහය අංශ




පර්යේෂණ කාර්ය මණ්ඩලය

පර්යේෂණ කාර්ය මණ්ඩලයට විද්‍යාඥයන් 76 ක් සහ ඉංජිනේරුවන් 16ක් ඇතුළත් වේ.පර්යේෂණ කාර්ය මණ්ඩලයේ 22 ක් ආචාර්ය උපාධි ලබා ඇති අතර 29 දෙනෙකු විද්‍යාපති/දර්ශනපති/පශ්චාත් උපාධි ඩිප්ලෝමා ලබා ඇත.පර්යේෂණ කාර්ය මණ්ඩලයේ අධ්‍යාපනික පසුබිම පහත ප්‍රස්තාරවල දක්වා ඇත.

පර්යේෂණ කාර්ය මණ්ඩලය - අධ්‍යාපන පසුබිම



පර්යේෂණ කාර්ය මණ්ඩලය - විද්‍යාඥයන්/ඉංජිනේරුවන්



පර්යේෂණ කාර්ය මණ්ඩලයේ විශේෂඥතාව

ආයතනයේ පර්යේෂණ සහ සංවර්ධන අංශය පර්යේෂණ සහ සංවර්ධන ශාඛා පහකින් සමන්විත වෙයි; ආහාර තාක්ෂණය, ඖෂධ තාක්ෂණය, ද්‍රව්‍ය තාක්ෂණය, පරිසර තාක්ෂණය සහ ජෛව තාක්ෂණයපර්යේෂක කාර්ය මණ්ඩලය, මාලබේ සහ කොළඹ පිහිටා ඇති නවීන පර්යේෂණ හා සංවර්ධන සංකීර්ණයේ නවීන පර්යේෂණ සහ සංවර්ධන රසායනාගාර හරහා බහුවිධ ක්ෂේත්‍රවල ඉල්ලුම මත පදනම්


වූ, ජාතික වැදගත්කමකින් යුත් අධි තාක්ෂණික පර්යේෂණ පිළිබඳ ඔවුන්ගේ විශේෂඥ ක්ෂේත්‍රවල පර්යේෂණ සහ සංවර්ධන සහ නවෝත්පාදන සිදු කරයි.පර්යේෂණ සහ සංවර්ධන අංශයේ පර්යේෂණ කාර්ය මණ්ඩලය, විසඳුම් අභිමුඛ නවෝත්පාදනයන් සපයන අතර තාක්ෂණික පැවරීම, තාක්ෂණයන් ගලපා ගැනීම සහ කාර්මික ප්‍රවර්ධනය, ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්, ආරම්භක ව්‍යාපාර, කාන්තා ව්‍යවසාය සහ කුඩා ව්‍යාපාර ඉලක්ක කරගනිමින් ව්‍යවසාකත්ව සංවර්ධනය හා සම්බන්ධ කාර්යයන්ගේ නියැලෙයි.අපනයන කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා සහ ආනයන විකල්ප සහ දේශීය අගය එකතු කිරීම සඳහා තාක්ෂණය සැපයීමටද පර්යේෂණ කාර්ය මණ්ඩලය සම්බන්ධ වේ.පාරිසරික තාක්ෂණ ක්ෂේත්‍රය තුළ අපි, කාර්මික දූෂණ පාලනය සහ ශබ්ද හා කම්පන අධික්ෂණය ඇතුළු පාරිසරික අධික්ෂණ අංශ තුළ ප්‍රධාන වැඩ කොටසක් ඉටු කරන්නෙමු.


කාර්මික තාක්ෂණ ආයතනයේ තාක්ෂණික සේවා අංශය රසායනාගාර පරීක්ෂණ සහ ක්‍රමාංකන සේවාවන්හි පුරෝගාමියා බවට පත් වී ඇති අතර එහි ප්‍රතීතන විෂය පථය පුළුල් කරගනිමින් එහි පරීක්ෂණ වාර්තා සහ සේවාවන්හි නිරවද්‍යතාවය සහ ජාත්‍යන්තර පිළිගත හැකි බව සහතික කරයි.රටේ ශීඝ්‍ර කාර්මීකරණයට සහය වීම සඳහා මෙම පහසුකම සතුව ඉහළ මට්ටමේ විශ්ලේෂණ පරීක්ෂණ සහ නවීන අධික්ෂණ උපකරණ මෙන්ම ජංගම විද්‍යාගාරද ඇත.කාර්මික තාක්ෂණ ආයතනය යනු අපනයනකරුවන්, රාජ්‍ය සංවිධාන සහ දේශීය හා ජාත්‍යන්තර නියාමන අධිකාරීන් සඳහා බලයලත් පරීක්ෂණාගාරයයි.පර්යේෂණ කාර්ය මණ්ඩලයට තොරතුරු කළමනාකරණය සහ තත්ත්ව කළමනාකරණ පද්ධති පිළිබඳ විශේෂඥ දැනුමක් ද ඇත.


ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂය තුළ කාර්මික තාක්ෂණ ආයතනය තම කාර්ය මණ්ඩලයට ස්ථිර සේවකයන් 65ක් බඳවා ගත්තේය.අනුමත සේවක සංඛ්‍යාව 439 ක් වුවද දැනට ආයතනයේ ඇති ස්ථිර කාර්ය මණ්ඩලය 333 දෙනෙකුගෙන් සමන්විත වේ.වසර තුළදී, පර්යේෂණ කාර්ය මණ්ඩලය 3% ක වැඩි වීමක් පෙන්නුම් කළද තාක්ෂණික කාර්ය මණ්ඩලය 2% ම අඩුවීමක් පෙන්නුම් කළේය.පරිපාලන, ලිපිකරු, ශිල්පීය සහ වෙනත් තනතුරුවල ප්‍රතිශතය නොවෙනස්ව පවතී.

2015 සිට 2019 දක්වා කාලය තුළ ආචාර්ය උපාධිය සහ පශ්චාත් උපාධි ලබාගත් සේවකයන් සංඛ්‍යාව 125 කින් වැඩි විය.පර්යේෂන විද්‍යාඥයින් සහ පර්යේෂණ ඉංජිනේරුවන් අතර අනුපාතය වන 1:4 නොවෙනස්ව පැවතුනි.







6.2 තත්ත්ව සහතික

ISO/IEC 17043:2010 ප්‍රවීණතා පරීක්ෂණ සඳහා ප්‍රතීතනය

ශ්‍රී ලංකා කාර්මික තාක්ෂණ ආයතනය (ITI) වෙත, ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය (SLAB) විසින් ISO/IEC 17043:2010 ප්‍රවීණතා පරීක්ෂණ සඳහා ප්‍රතීතනය ප්‍රදානය කළ අතර ඒ අනුව කාර්මික තාක්ෂණ ආයතනය ශ්‍රී ලංකාවේ පිළිගත් පළමු ප්‍රවීණතා පරීක්ෂණ සැපයුම්කරු බවට පත් විය.ජාතික තත්ත්ව යටිතල පහසුකම්වල ඉතා වැදගත් අංගයක් වන ප්‍රවීණතා පරීක්ෂණ, කාර්මික තාක්ෂණ ආයතනය විසින් ශ්‍රී ලංකාවේ රසායනාගාර වෙත ලබා දෙනු ඇත. ජල ක්ෂුද්‍ර ජීව විද්‍යාව, ආහාර ක්ෂුද්‍රජීව විද්‍යාව සහ සිමෙන්ති පිළිබඳ රසායනික හා භෞතික පරීක්ෂණ යන ක්ෂේත්‍රවල ප්‍රවීණතා පරීක්ෂණ වැඩසටහන් හරහා ඔවුන්ගේ නිපුණතාවය පිළිබඳ සාක්ෂි සනාථ කිරීම සඳහා කාර්මික තාක්ෂණ ආයතනය දැනට රසායනාගාර විශාල සංඛ්‍යාවකට සේවය කරයි.

කාර්මික තාක්ෂණ ආයතනයේ යටිතල පහසුකම්වල තත්ත්වය වැඩි දියුණු කිරීම

ජර්මනියේ Physikalisch-Technische Bundesanstait (PTB) සහ ශ්‍රී ලංකාවේ වෙනත් ජාතික තත්ව යටිතල පහසුකම් සපයන ආයතන (SLS, SLAB) සමග ඒකාබද්ධව රටේ තත්ව යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමට සහ දිවයිනේ උතුරු පළාතේ පිහිටා ඇති කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්තවල, ජාත්‍යන්තර යහපත් පරිචයන් මත පදනම් තත්ව සහතික සේවා දියුණු කිරීමට ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී.මෙම සහයෝගීතාවය ISO 17043 ප්‍රතීතනය ලබා ගැනීමේ ප්‍රවීනතා පරීක්ෂණ (Proficiency Testing - PT) සැපයුම්කරුවෙකු ලෙස සුදුසුකම් ලැබීමේ තත්ත්ව පද්ධතිය වැඩිදියුණු කිරීමට කාර්මික තාක්ෂණ

ආයතනයට අරමුදල් සපයන අතර, කාර්මික තාක්ෂණ ආයතනය 1 වන ශ්‍රී ලාංකික ප්‍රවීනතා පරීක්ෂණ සපයන්නා බවට පත්වෙමින් ප්‍රතිඥනය ලැබීය.
ITI හි දැනට පවතින රසායනාගාර තත්ත්ව කළමනාකරණ පද්ධතිය වන ISO/IEC 17025:2005, සමාලෝචිත වර්ෂය තුළ ISO/IEC 17025:2017 බවට පරිවර්තනය කරන ලදී.

පරාමිතීන් සඳහා ප්‍රතිඥනය
පළිබෝධනාශක, පාන වර්ග, ධාන්‍ය වර්ග සහ ජලය සහ අපජලය යන පරාමිති 115 සඳහා ශ්‍රී ලංකා ප්‍රතිඥන මණ්ඩලය වෙත අයදුම්පත් ඉදිරිපත් කරන ලද අතර, එහි විශ්ලේෂණ සේවා පුළුල් කිරීමේ විෂය පථය සමගින්, රසායනාගාර ප්‍රතිඥනය ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක විශ්ලේෂණය කෙරෙහිද ව්‍යාප්ත කරන ලදී.

6.3 තොරතුරු සේවාවන්

තොරතුරු සේවා මධ්‍යස්ථානය පර්යේෂකයන්ට, තාක්ෂණවේදීන්ට සහ කර්මාන්තකරුවන්ට තොරතුරු සපයන්නෙකු ලෙස එහි සම්පත් සංවර්ධනය කරමින් සහ විද්‍යාත්මක හා තාක්ෂණික සංවර්ධනය ඇති කිරීමේ අරමුණින් තොරතුරු බෙදා හරිමින් එහි කාර්යයන් අඛණ්ඩව පවත්වාගෙන යන ලදී.මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා මධ්‍යස්ථානය නොමිලේ විවෘතව පවතී.
විවිධ මූලාශ්‍රයන්ගෙන් විද්‍යාව හා තාක්ෂණයට අදාළ තොරතුරු එක් රැස් කරගන්නා ලද අතර සමාලෝචිත වර්ෂය තුළ පොත් 10 ක් මිලදී ගැනීමත් පොත් 155 ක් ප්‍රදාන ලෙසින් භාරගැනීමත් සිදු විය.තාක්ෂණික සේවා අංශයේ ඉල්ලීම් මත ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් ප්‍රමිති 78ක් මිලදී ගන්නා ලදීකාර්මික තාක්ෂණ ආයතනයේ දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවලට අදාළ පර්යේෂණ ලිපි 330 ක් සහ වර්තමාන විද්‍යා හා තාක්ෂණ ප්‍රවණතාවලට අදාළ ලිපි එකතුවට එක් කරන ලදී.අඛණ්ඩව 13 වන වසර සඳහා Science Direct හි අංශ හතර රසායන විද්‍යාව, ද්‍රව්‍ය, කෘෂිකර්ම සහ ජීව විද්‍යා සහ ඖෂධවේදය, විෂ විද්‍යාව, සහ ඖෂධ විද්‍යාව වෙත දායකත්වය ලබාගන්නා ලදී.
රසායනාගාර සහායකයින් සඳහා සහතික පත්‍ර පාඨමාලාවක් වන ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) පාඨමාලාව සම්බන්ධීකරණය කිරීමට ISC වෙත පවරන ලදී.ISC විසින් කාර්මික තාක්ෂණ ආයතන වෙබ් අඩවියේ සහ අභ්‍යන්තර වෙබ් අඩවිය වන i.net හි අන්තර්ගත කළමනාකරණය අඛණ්ඩවම සිදු කළේය.

6.4 සම්මාන

ජාතික නව නිපැයුම්කරුවන්ගේ කොමිෂන් සභාව විසින් සංවිධානය කරන ලද සම්මාන උළෙලේදී පිරිනැමීමට සූදානම් කෝමාරිකා පානය, වෙනුවෙන් වාණිජකරණය කරන ලද නිෂ්පාදන අංශයේ රන් පදක්කම ආචාර්ය ඉල්මි හේවාජුලිගේ, රම්‍යා පිටිපනආරච්චි මෙනවිය, සචිනි ජයවර්ධන මෙනවිය සහ හසිනි මහානාම මහත්මිය දිනා ගත්හ.

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිෂන් සභාව විසින් සංවිධානය කරන ලද සම්මාන ප්‍රදානෝත්සවයේදී භෝග වල පිටිමකුණන් මර්දනය සඳහා ජෛව පළිබෝධනාශකයක් වන MASAK P සංවර්ධනය කිරීම වෙනුවෙන්, කෘෂිකර්ම තාක්ෂණ ක්ෂේත්‍රයේ වාණිජකරණය කළ කාණ්ඩයේ රන් පදක්කම ආචාර්ය ආර්.එම්. ධර්මදාස දිනා ගත්තේය.

“නැනෝ තාක්ෂණය භාවිතයෙන් පලතුරු සංරක්ෂණය වැඩි දියුණු කිරීම” පිළිබඳ පර්යේෂණ සැලකිල්ලට ගනිමින් කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති කවුන්සිලය විසින් සංවිධානය කරන ලද 2019 වැවිලි

නොවන බෝග කාණ්ඩයේ විශිෂ්ටතා සඳහා පළමු ත්‍යාගය ආචාර්ය ඉල්මී හේවාජුලිගේ, වෛද්‍ය ශාන්ති විල්සන්, නිසල ගුණසේකර, යෝගා මිලානි, ශිරන්ති පෙරේරා, දිනෙත් සමරවික්‍රම, අනුර සූරියආරච්චි සහ මනෝරි විජේමාන්න යන මහත්ම මහත්මීහු දිනා ගත්හ.

''ලංකාවේ කුරුඳු වල ජෛව ක්‍රියාකාරීත්වය'' පිළිබඳ පර්යේෂණ සැලකිල්ලට ගනිමින්, කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති පිළිබඳ කවුන්සිලය විසින් සංවිධානය කරන ලද වැවිලි ක්ෂේත්‍රයේ කෘෂිකාර්මික පර්යේෂණ 2019 විශිෂ්ටත්වය සඳහා වන පළමු ත්‍යාගය ආචාර්ය කෞෂල්‍ය අබේසේකර සහ ආචාර්ය සිරිමල් ප්‍රේමකුමාර දිනා ගත්හ.

"Formation of a para-pheromone from local varieties of *Ocimum sanctum* L. for the control of local fruit and melon flies" පිළිබඳ පර්යේෂණය සඳහා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති පිළිබඳ කවුන්සිලය විසින් සංවිධානය කරන ලද වැවිලි නොවන භෝග අංශයේ ප්‍රශංසා සහතිකය ආචාර්ය ආර්.එම්.ධර්මදාස සහ ආචාර්ය සී.එච්.මනෝරත්න හිමිකර ගත්හ.

ආචාර්ය රාධිකා සමරසේකර ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනම විසින් සංවිධානය කරන ලද SUSRED (පර්යේෂණ උපාධි අධීක්ෂණය සඳහා ආධාරක යෝජනා ක්‍රමය) සම්මානයෙන් පිදුම් ලැබුවාය.

6.5 ධාරිතා සංවර්ධනය
පශ්චාත් උපාධි අධ්‍යයන

ආචාර්ය රධිකා සමරසේකර, මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති සහ ආචාර්ය ජගත් වීරසේනගේ අධීක්ෂණය මත Chemical characterization and *in vitro* bioactivity studies of constituents of *Osbeckia octandra* DC. and *Dillenia retusa*. සම්බන්ධ අධ්‍යයනය සඳහා එච්.ඩී.එස්.එම්. පෙරේරා මෙය වෙත කොළඹ විශ්ව විද්‍යාලය වෙතින් ආචාර්ය උපාධියක් ප්‍රදානය කරන ලදී.

ඩබ්ලිව් ආර් ඩී වීරසූරිය කොළඹ විශ්වවිද්‍යාලයෙන් විශ්ලේෂණ රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධියක් ලැබුවේය.

S M R වීරසේකර මෙනවිය පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් විශ්ලේෂණ රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධියක් ලබා ගත්තාය.

6.6 විදේශ පුහුණු වැඩසටහන්

එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සාජාහි මෙට්‍රෝම් යෙදුම් රසායනාගාරයේ (ජනවාරි 12 - 17) ''රාමන් වර්ණාවලීක්ෂය යොදා ගැනීම'' පිළිබඳ වැඩසටහනකට ආචාර්ය එච්.පී.පී.එස්. සෝමසිරි සහභාගී විය.

එම්. ආර්. පී. දසනායක Ion chromatography, titration and Spectroscopy (Raman)", Metrohm (ජනවාරි 13 සිට 15 දක්වා) පිළිබඳ පුහුණුවකට සහභාගී විය.

ඉංජිනේරු එන්.ඒ.ටී.ඩී.ඩී.ගුණසේකර, පකිස්ථානයේ ඉස්ලාමාබාද්, කොම්සාටස් විශ්වවිද්‍යාලයේ ලාහෝර් මණ්ඩපයේ "බලශක්ති විගණනය" පිළිබඳ පුහුණු වැඩසටහනකට (ජනවාරි 21 - පෙබරවාරි 02) සහභාගී විය.

ආචාර්ය ආර් සමරසේකර COMSATS විසින් සංවිධානය කරන ලද සහ ටියැන්ජින් කාර්මික ජෛව තාක්ෂණ ආයතනය සහ චීනයේ Tianjin Institute of Industrial Biotechnology and Chinese Academy of Sciences (2019 අප්‍රේල් 16 - 18) විසින් සංවිධානය කරන ලද "COMSATS සම්බන්ධීකරණ කවුන්සිලයේ 22 වන රැස්වීමට" සහභාගී විය.

ආචාර්ය ආර් සමරසේකර, මැලේසියාවේ ප්‍රමිති සහ කාර්මික පර්යේෂණ ආයතනය (SIRIM) WAITRO සහ විසින් සංවිධානය කරන ලද මැලේසියාවේ ෂා අලාම්, සෙලන්ගෝර් හි කොන්කෝඩ් හෝටලයේ පැවති (අප්‍රේල් 29 සිට මැයි 3 දක්වා) "WAITRO ජ්‍යෙෂ්ඨ කළමනාකරණ පර්යේෂණ තාක්ෂණ සංවිධානයේ වැඩසටහනට" සහභාගී විය.

ආචාර්ය තේජා හේරත්, මැලේසියාවේ ප්‍රමිති සහ කාර්මික පර්යේෂණ ආයතනය (SIRIM) WAITRO සහ විසින් සංවිධානය කරන ලද මැලේසියාවේ ෂා අලාම්, සෙලන්ගෝර් හි කොන්කෝඩ් හෝටලයේ පැවති (අප්‍රේල් 29 සිට මැයි 3 දක්වා) "WAITRO-SIRIM ධාරිතා සංවර්ධන වැඩසටහන 2019- පර්යේෂණ සහ නවෝත්පාදන වාණිජකරණය පිළිබඳ වැඩමුළුවට" සහභාගී විය.

සී.එච් මනෝරත්න මහතා, මැලේසියාවේ ප්‍රමිති සහ කාර්මික පර්යේෂණ ආයතනය (SIRIM) විසින් සංවිධානය කරන ලද මැලේසියාවේ ෂා අලාම්, සෙලන්ගෝර් හි කොන්කෝඩ් හෝටලයේ පැවති (අප්‍රේල් 29 සිට මැයි 3 දක්වා) "කාර්මික යෙදවුම් සඳහා සූර්ය තාප තාක්ෂණය" පිළිබඳ WAITROධාරිතා සංවර්ධන වැඩසටහනට සහභාගී විය.

ආචාර්ය සී. විජයසිරිවර්ධන, මැලේසියාවේ ප්‍රමිති සහ කාර්මික පර්යේෂණ ආයතනය (SIRIM) විසින් සංවිධානය කරන ලද මැලේසියාවේ ෂා අලාම්, සෙලන්ගෝර් හි කොන්කෝඩ් හෝටලයේ පැවති (අප්‍රේල් 29 සිට මැයි 3 දක්වා) "පුද්ගල සනීපාරක්ෂක නිෂ්පාදන සංවර්ධනය තුළ කාන්තාවන් සවිබල ගැන්වීම" පිළිබඳ වැඩසටහනකට සහභාගි විය.

ආචාර්ය එච්.පී.පී. එස් සෝමසිරි NABL India "ISO 17043 අනුව ප්‍රවීණතා පරීක්ෂණ සපයන්නන් (PTP) ඇගයීමේ ප්‍රායෝගික පුහුණුව" වැඩසටහනට සහභාගි විය (මැයි 29-30)

ආචාර්ය ඉල්මි හේවාජුලිගේ ජපානයේ ටෝකියෝ සහ ෆුකුෂිමා හි (ජූනි 10 සිට 14 දක්වා) "යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) සහ උසස් පසු අස්වනු හැසිරවීමේ තාක්ෂණයන් පිළිබඳ බහු ප්‍රාන්ත නිරීක්ෂණ අධ්‍යයන මෙහෙයුමකට සහභාගී විය.

ආචාර්ය පී. රණසිංහ 2019 දකුණු සහ අග්නිදිග ආසියාවේ තාක්ෂණ හුවමාරු ගැලපීමේ සම්මන්ත්‍රණය සහ චීන-දකුණු ආසියා තාක්ෂණ හුවමාරු මධ්‍යස්ථානයේ (CSTTC) චීන-දකුණු ආසියාවේ තාක්ෂණ හුවමාරු උප මධ්‍යස්ථාන වැඩ සම්මන්ත්‍රණ මාලාවේ ක්‍රියාකාරකම්, (ජූනි 11 සිට 20 දක්වා) සඳහා සහභාගී විය.

ඉංජිනේරු ඩබ්.ආර්.එල්. විජේසේකර චීනයේ බීජිංහි චීන විද්‍යා ඇකඩමියේ, වායුගෝලීය භෞතික විද්‍යා ආයතනයේ, කාලගුණ සහ පරිසර විද්‍යා CAS-TWAS මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද "වායු සහ දේශගුණික විපර්යාස පිළිබඳ 18 වන CTWF ජාත්‍යන්තර සම්මන්ත්‍රණය සහ පුහුණු වැඩසටහන: වායුගෝලීය නිරීක්ෂණ, ආකෘති නිර්මාණය සහ අන්තර්ක්‍රියා" වැඩසටහනට සම්බන්ධ විය (ජූලි 15-21)

ඉංජිනේරු ඩී.එම්.එච්.එස් දිසානායක කත්මන්ඩු හි පැවති "දකුණු ආසියාව සඳහා පිරිසිදු වාතය" පිළිබඳ තාක්ෂණික කඳවුර සඳහා , (ජූලි 29 සිට 31 දක්වා) සහභාගී විය.

ආචාර්ය ආර් සමරසේකර ඉන්දියාවේ නවදිල්ලියේ විද්‍යා හා තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද ‘‘ඉන්දු-ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණ ඒකාබද්ධ කමිටුවේ 4 වන රැස්වීමට’’ (2019 අගෝස්තු 13 සිට 14 දක්වා) සහභාගී විය.

ආචාර්ය එච්.පී.පී.එස්. සෝමසිරි, ජර්මනියේ Ettlingen හි Bruker Optics GmBH හි "Bruker Optics Training Courses 2019- FT-IR පුහුණුව" සඳහා සහභාගී විය (ඔක්තෝබර් 1 සිට 14 දක්වා).

එක්සත් ජාතීන්ගේ පරිසරයේ ගෝලීය රසදිය හවුල්කාරිත්ව රැස්වීමට සමගාමීව ගල් අඟුරු දහනයෙන් රසදිය විමෝචනය අවම කිරීම පිළිබඳ ‘‘ආසියා-පැසිෆික් කලාපීය වැඩමුළුව සඳහා ශ්‍රී ලාංකික විශේෂඥයා ලෙස ඉංජිනේරු ඩී.එම්.එච්.එස්. දිසානායක (ඔක්තෝබර් 30 - නොවැම්බර් 01) සහභාගි වූවාය.

The Young Affiliates Network (TYAN) විසින් සත්කාරකත්වය දරන 'කෘෂිකර්මාන්තය, පෙෂව තාක්ෂණය සහ ආහාර සුරක්ෂිතතාව: තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයේ කාර්යභාරය' පිළිබඳව ටියුනීසියාවේ පැවති 5 වැනි COMSATS-ISESCO-INIT ජාත්‍යන්තර සම්මන්ත්‍රණයට උපේක්ා රාජවර්ධන මහත්මිය ‘‘Beneficial Microorganisms from Sri Lankan Dairies as Candidates in Nutrition, Healthcare and Biochemical Industries’’ යන මැයෙන් දේශනයක් පැවැත්වීමට සහභාගී වූවාය. (නොවැම්බර් 4 - 6).

තාරක ගුණවර්ධන මහතා දකුණු අප්‍රිකාවේ ප්‍රිටෝරියා හි පැවති "විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන රාජ්‍ය තාන්ත්‍රිකත්වය" පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩසටහනකට (නොවැම්බර් 27 - දෙසැම්බර් 7) සහභාගී විය.

ආචාර්ය ඉල්මි හේවාජුලිගේ සහ ආචාර්ය ඩබ්ලිව් එම් එස් විජේසිංහ තුර්කියේ ගෙබ්සේ හි පැවති (දෙසැම්බර් 3 - 5) "තිරසාරත්වය, තිරසර සංවර්ධන ඉලක්ක සහ ගෝලීය අභියෝග පිළිබඳ වැඩමුළුවකට" සහභාගී විය.

6.7 කාර්මික තාක්ෂණ ආයතනයේ යහපැවැත්ම

කුකුළේගඟ පුහුණු වැඩසටහන

2019 මැයි 31 සහ ජූනි 1 වැනි දින කුකුළේගඟ ලයා ලෙෂර් හිදී බැහැරගත පුහුණු වැඩසටහනක් පැවැත්විණි.තොරතුරු තාක්ෂණ ආයතනයෙ ක්‍රියාකාරකම් විධිමත් කිරීම සහ වඩා හොඳ නිමැවුමක් සඳහා සේවකයින්ගේ හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා මෙම වැඩසටහන සංවිධානය කරන ලදී.නවෝත්පාදන තුළින් ව්‍යාපාර වැඩිදියුණු කිරීමට උපකාරී වන ප්‍රමුඛ පෙළේ තාක්ෂණ සමාගමක් වන n*able Pvt Ltd හි ප්‍රධාන විධායක නිලධාරී සහ කළමනාකාර අධ්‍යක්ෂ පීටර් ඩි අල්මේදා මහතා විසින් පවත්වන ලද මෙම පුහුණු වැඩසටහන සඳහා සේවකයින් 60 ක් පමණ සහභාගී වූහ.

සුඛසාධන සහ විනෝදාස්වාද සංගමය

2019 ජනවාරි 01 වෙනිදා පිරිත් සජ්ඣායනාවෙන් පසු තේ පැන් සංග්‍රහය සංවිධානය කිරීමත් සමඟ වසර සඳහා කටයුතු ආරම්භ විය.සමාලෝචනය කරන ලද වර්ෂය තුළ සුභසාධක සංගමය විසින් සේවයේ යෙදී සිටියදී හදිසි අනතුරු හෝ රෝගාබාධ හේතුවෙන් ජීවිත අහිමි වූ හෝ රැකියාවෙන් ඉවත් වූ සේවකයින්ගේ දරුවන්ට උපකාර කිරීම සඳහා දිරි දරු සරණ නමින් අරමුදලක් ආරම්භ කළේය.මෙම අරමුදල මගින්

දරුවන්ගේ සම්පූර්ණ අධ්‍යාපන කටයුතු සඳහා ආධාර කරනු ඇත.රිය අනතුරකින් ජීවිතය අහිමි වූ නිලධාරියෙකුගේ දරුවන්ට උපකාර කිරීම සඳහා මෙම අරමුදල ආරම්භ කරන ලදී.අනතුරකට ලක්වූ සේවකයකුගේ ශල්‍යකර්මයක් සඳහා අරමුදල් රැස්කිරීම සඳහා අපේ ගම දී ලෝරෙන්සෝගේ මනමාලි වේදිකා නාට්‍යය වේදිකාගත කෙරිණි.තොරතුරු තාක්ෂණ ආයතනයේ ඉන්වෙන්ටරිවලින් ඉවතලන අනවශ්‍ය භාණ්ඩ විකුණා එම ආදායම සුබසාධන හා විනෝදාස්වාද සංගම් අරමුදලට ගෙන යන ලදී.

බෞද්ධ සංගමය

ජනවාරි 1 වැනිදා කොළඹදී සහ ජනවාරි 2 වැනිදා මාලඹේ පරිශ්‍රයේදී පිරිත් සජ්ජායනයක් පැවත්වීමෙන් වසර ආරම්භ විය.වාර්ෂික වෙසක් කූඩු තරගය කොළඹ පරිශ්‍රයේ පැවැත්විණි.පොසොන් පොහොය නිමිත්තෙන් පූජ්‍ය මාවරලේ භද්දිය හිමියන්ගේ ධර්ම දේශනාවක් මාලඹේ ආහාර තාක්ෂණ අංශයෙන් සංවිධානය කර තිබූ අතර පූජ්‍ය කුකුල්පනේ සුද්දස්සි හිමියන්ගේ ධර්ම දේශනාවක් කොළඹදී පැවැත්විණි.කලවාන කුකුළේගම ශ්‍රී සුමන ලෙන් විහාරයේ වස් සමයට අනුග්‍රහය දැක්වූ අතර් වස් සමය තුළ භික්ෂූන්ගේ සහ විහාරස්ථානයේ අවශ්‍යතා සොයා බැලීය.ඔක්තෝම්බර් මාසයේ පැවති කයින පිංකමට බෞද්ධ සංගමයේ සාමාජිකයින් 50 දෙනෙකු පමණ සහභාගී විය.

5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයෙන් හොඳින් සමත් වූ සහ අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශය ලැබූ සිසුන්ට ත්‍යාග ප්‍රදානය කිරීම අඛණ්ඩව සිදු කරන ලදී.

සේවා වනිතා ඒකකය

ආයතනයේ සේවා වනිතා ඒකකය මේ වසරේදීත් අඛණ්ඩව සේවකයන්ට සේවා සැපයීම සිදු කළේය.සාමාජිකයින්ගේ සුබසාධනය සඳහා වසර තුළ ව්‍යාපෘති පහක් ක්‍රියාත්මක කරන ලදී.

- අවශ්‍යතා ඇති සේවකයින්ගේ දරුවන් සඳහා පාසල් පොත් බෙදාදීම.
- සේවකයින් සඳහා වට්ටම් මිලකට ඔෂානි ලිනන් විකිණීම.
- කාර්ය මණ්ඩලය සඳහා හේමාස් රෝහල හරහා සෞඛ්‍ය කඳවුරක් සංවිධානය කරන ලදී
- අවුරුදු සහ නත්තල් සමයේ ප්‍රවර්ධන අලෙවි කටයුතු.
- නව සාමාජිකයින් සමඟ සාමාජිකත්වය වැඩි කිරීම

2019 වාර්ෂික මහා සභා රැස්වීම 2020 පෙබරවාරි 18 වැනි දින තොරතුරු තාක්ෂණ ආයතන ප්‍රධාන ශ්‍රවණාගාරයේදී පැවැත්විණි.උප සභාපතිවරයා ලෙස ආචාර්ය මේනුකා ඇරැව්වාවල පත් කෙරිණි.ලේකම් ලෙස තුෂාරි දෙහෙරගොඩ මෙය පත් විය.

6.8 ප්‍රවර්ධන අවස්ථා

විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන පිළිබඳ නව දැනුම සාමාන්‍ය ජනතාව අතරට ගෙන යාමටත්, රට පුරා විසිරී සිටින නවෝත්පාදකයින් ආයෝජකයින් හමුවීමට ව්‍යාපාර සිට මහජනතාවට (B2P) වේදිකාවක් නිර්මාණය කිරීමටත් අදහස් කරමින්, විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය 'ශිල්පසේනා - ශ්‍රී ලංකා තාක්ෂණ විප්ලවය' ලෙස නම් කර ඇති විද්‍යා තාක්ෂණය සහ නවෝත්පාදන පිළිබඳ ප්‍රදර්ශනය ලෙස ජාතික වැඩසටහනක් සංවිධානය කළේය.

අමාත්‍යාංශය යටතේ පවතින ආයතන 12, එක් එක් තේමා කලාප 12 සහ විද්‍යා ජාලය යටතේ ප්‍රමුඛ වූ විට ඒවා තාක්ෂණ සහ දැනුම හුවමාරුව හා කාර්මික ව්‍යාපාර සඳහා වන මධ්‍යස්ථාන බවට පත්වනු ඇත.

කාර්මික තාක්ෂණ ආයතනයට "BIOTECHNOLOGY" කලාපයේ සම්පූර්ණ වගකීම පැවරී ඇති අතර සිදු කරන ලද පර්යේෂණ බොහොමයක් කාර්මික තාක්ෂණ ආයතනය විසින් වීඩියෝ, ප්‍රස්ථාර සහ ආකෘති මත ප්‍රදර්ශනය කරන ලදී.මෙම අවස්ථාවට කර්මාන්ත පාර්ශවකරුවන්, විශ්වවිද්‍යාල සිසුන් සහ ජෛව තාක්ෂණ අංශයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් රැසක් සහභාගී විය.මෙම උත්සවය කොළඹ සහ පොළොන්නරුව ප්‍රදේශවල පැවැත්වුණු අතර ජෛව තාක්ෂණයේ භාවිතය පිළිබඳ තොරතුරු සාමාන්‍ය ජනතාව අතරට බෙදා හැරීමට හැකි විය.


07 පරිච්ඡේදය - මූල්‍ය කාර්ය සාධනය


මූල්‍ය වාර්තාව

ආදායම්

ව්‍යාපාර කටයුතුවලින් ලැබෙන ආයතනයේ ආදායම පසුගිය වසර පහ තුළ සාමාන්‍ය ආදායමට වඩා 14% ක වැඩි වීමක් පෙන්නුම් කළ අතර එය රු.මි. 266 සිට 2019 වසරේදී රු.මි.304 දක්වා වැඩි විය. 2019 වසරේදී 5% ක වැඩි වීමක් පෙන්නුම් කළේය.

ආයතනයේ ප්‍රධානතම ආදායම් උත්පාදනය මෙවරත් පරීක්ෂණ සහ ක්‍රමාංකන සේවා වූ අතර එය මුළු ආදායමෙන් 63% ක් (රු.මි.191.2) විය. 2019 වසරේ පාස්කු ප්‍රහාරය, රටේ අපනයන වෙළෙඳපොළට දැඩි බලපෑමක් ඇති කළ නිසා එය 2018 වසරට වඩා රු.මි.22 ක අඩුවක් පෙන්නුම් කළේය.උපදේශන සේවා, කොන්ත්‍රාත් ව්‍යාපෘති සහ තාක්ෂණ හුවමාරු ආදායම පිළිවෙලින් රුපියල් මිලියන 5.6කින් රුපියල් මිලියන 27.56කින් සහ රුපියල් මිලියන 4.3කින් වැඩි වී ඇත.වසර තුළ පුහුණු ආදායම මඳ වශයෙන් පහළ වැටී ඇත.







වියදම්- පුනරාවර්තන

කාර්මික තාක්ෂණ ආයතනයට රු.මි 37 ක ආන්තික වැඩිවීමක් සමග මෙහෙයුම් වියදම් පවත්වාගැනීමට හැකි වූ අතර 2018 දී රු මි 551.7 ක් වූ එය 2019 වසරේදී රු මි 588.7 ක් විය.

පසුගිය වසරේ රුපියල් මිලියන 744 ට සාපේක්ෂව ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය සමඟ මුළු වියදම් රුපියල් මිලියන 813 කි.මෙය 2018 මුළු වියදම්වලට සාපේක්ෂව 9.3% ක වැඩිවීමකි.


ආයතනය වසර සඳහා නියම කරන ලද සමස්ත ආදායම් ඉලක්කයක් සපුරා ගැනීම හේතුවෙන් කාර්ය සාධනය පදනම් කරගත් දිරි දීමනා අඛණ්ඩව 16 වැනි වසර සඳහාත් කාර්ය මණ්ඩලය වෙත ගෙවන ලදී.





ප්‍රතිසාධන අනුපාතය

කාර්මික තාක්ෂණය ආයතනයේ වියදම් ප්‍රතිසාධන අනුපාතය මත ආදායම 51.5%ක් ලෙස සටහන් වී ඇති අතර එය පෙර වසරේ පැවති 52.4%ට වඩා සුළු වශයෙන් අඩු වීමකි.



ලැබූ ප්‍රදාන

ආරක්ෂණ ඇප තැන්පතු (ණයවර ලිපි), පාරිතෝෂික ගෙවුම් සහ කාරක ප්‍රාග්ධන වෙන්කිරීම්		160,226,000	160,226,000
මුදල් සහ බැංකු ශේෂය	**22**	**336,884,346**	**382,526,411**
(සටහන - 3 ඈ)		**497,110,346**	**542,752,411**

කාර්මික තාක්ෂණ ආයතනය (අනුප්‍රාප්තික ලං.වී. හා කා.ප.ආ)
2019 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය සඳහා සටහන්

	සටහන	2019 රු.	2018 රු.
ජංගම බැරකම් (සටහන 4)			
වෙළඳ ණය හිමියෝ	**18ආ**	6,097,745	2,599,690
විවිධ ණය හිමියෝ	**15ආ**	102,441,454	23,483,088
ටෙන්ඩර් හා ආරක්ෂණ තැන්පත්	**24**	792,695	764,880
සේවක සමූහ වෛද්‍ය රක්ෂණ පාලක ගිණුම		1,565,075	1,609,508
අනුග්‍රාහක ව්‍යාපෘති	**23**	72,877,265	81,305,247
(සටහන - 4අ)		**183,774,234**	**109,762,412**
ගෙවිය යුතු වියදම් **(සටහන - 4ආ)**	**25**	144,077,635	129,893,150
ලැබිය යුතු එකතු කළ අගය මත බදු සඳහා වෙන් කිරීම්		33,452,869	24,690,471
පාරිතෝෂික සඳහා වෙන් කිරීම් **(සටහන - 5ඇ)**	**26**	11,270,531	8,680,141
ජංගම නොවන වත්කම් (සටහන 5)			
පාරිතෝෂික සඳහා වෙන් කිරීම් **(සටහන - 5 ඇ)**	**26**	**108,432,373**	104,167,663
සංවිත - බැඳුම්කර කඩකළ සේවක		16,907,162	8,255,638
විද්‍යා සම්මාන අරමුදල (මහාචාර්ය විජය කුමාර් නිර්මාතෘක)		393,445	393,445
සේවක මණ්ඩල ක්‍රියාකාරකම් අරමුදල		2,199,449	2,033,209
කැස්පර් ආංශික අරමුදල		20,065	20,065
(සටහන - 5 අ)		**19,520,122**	**10,702,357**

කාර්මික තාක්ෂණ ආයතනය (අනුප්‍රාප්තික ලං.වි. හා කා.ප.ආ)
2019.12.31 දිනට මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන්

	2019		2018	
රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදානය සඳහා ක්‍රමක්ෂය (5අ1)	රු.	රු.	රු.	රු.
(ගිණුම් අංක - 604440-70700)				
ක්ෂය - 2002 දක්වා ජංගම නොවන වත්කම් සඳහා				
2003 සිට ජංගම නොවන වත්කම් සඳහා	115,945,950		115,135,954	
පරිත්‍යාගික ජංගම නොවන වත්කම්	52,793,464	168,739,413	49,726,562	164,862,516
පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති සහ මානව සම්පත් සංවර්ධන				
මහා භාණ්ඩාගාර ප්‍රදානිත	23,526,215		7,958,736	
පර්යේෂණ හා සංවර්ධන	354,042		928,759	
මානව සම්පත් සංවර්ධන ප්‍රතිපූර්ණ කිරීම්	1,072,047		390,255	
දායක මුදල්	3,719,738		2,807,280	
පුස්තකාල විද්‍යා සඟරාව	9,164,563		7,785,258	
තත්ත්ව පද්ධතිය වැඩිදියුණු කිරීම සහ ශිල්ප සේනා	7,192,921			
පර්යේෂණ හා සංවර්ධන වැය	-	45,029,526	-	19,870,287
පුනරුත්ථාපන සහ ප්‍රතිෂ්ඨාපන - ගොඩනැගිලි සහ ආකෘති	9,317,611		2,975,807	
යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	1,083,597		3,879,082	
රථවාහන වැඩිදියුණු කිරීම	199,500		651,891	
වෙනත් ස්ථාවර වත්කම් වැඩිදියුණුව සඳහා	187,535	10,788,244	539,403	8,046,182
		224,557,183		**192,778,985**

අසම්භාව්‍ය අය (සටහන 5 ආ)				
රාජ්‍ය දායකත්වය - ප්‍රාග්ධන - 2003 සිට	රු.	රු.	රු.	රු.
(ගි.අං.- 300102-29755 සහ ගි.අං. - 300104)				
2019.01.01 දිනට ශේෂය	992,342,590		814,654,980	
වසර තුළ වකතු කිරීම් -				
මාළඹේ නවීන පර්යේෂණ සහ සංවර්ධන සංකීර්නය සඳහා ප්‍රාග්ධන ප්‍රදානය	-		216,000,000	1,030,654,980
කාර්මික තාක්ෂණ ආයතනය සඳහා ප්‍රාග්ධන ප්‍රධාන	121,000,000	1,113,342,590	104,740,034	1,135,395,014
උපලේඛණ ගැලපුම්				
ක්‍රමක්ෂය (ජංගම නොවන වත්කම් ක්ෂය)	(115,945,950)		(115,135,954)	
ක්‍රමක්ෂය (පර්යේෂණ හා සංවර්ධන - (ප්‍රතීතන)	(354,042)		(928,759)	
ක්‍රමක්ෂය (භාණ්ඩාගාර ප්‍රදානිත ව්‍යාපෘති වැය)	(23,526,215)		7,958,736	
ක්‍රමක්ෂය (පුනරුත්ථාපන වැය)	(10,788,244)		(8,046,182)	
ක්‍රමක්ෂය (මානව සම්පත් සංවර්ධන)	(1,072,047)		(390,255)	
ක්‍රමක්ෂය (පුස්තකාල විද්‍යා සඟරාව සඳහා වාර්ෂික දායක මුදල)	(9,164,563)		(7,785,258)	
ක්‍රමක්ෂය (දායක මුදල්)	(3,719,738)		(2,807,280)	
ක්‍රමක්ෂය (තත්ත්ව පද්ධතිය වැඩිදියුණු කිරීම සහ ශිල්ප සේනා)	(7,192,921)			
ක්‍රමක්ෂය (පර්යේෂණ හා සංවර්ධන)	-	(171,763,719)		
				(143,052,423)
2019.12.31 වන දිනට ශේෂය		**941,578,871**		**992,342,590**

	2019		2018	
සමුච්චිත අරමුදල (සටහන - 6 අ)				
රාජ්‍ය දායකත්වය ප්‍රාග්ධන - 2002 දක්වා සහ	රු.	රු.	රු.	රු.
ආදායම් සහ වියදම් ගිණුමෙහි ශේෂය				
(ගි.අං.- 300101-30000 සහ ගි.අං. - 300300-30400)				
2002 දක්වා රාජ්‍ය දායකත්වය - ප්‍රාග්ධන - 2019.01.01	619,826,595		636,826,595	
ආදායම් සහ වියදම් ගිණුම - 2019.01.01	80,889,950	700,716,546	68,637,525	
කාර්මික තාක්ෂණ ආයතනය සඳහා වසර තුල ප්‍රාග්ධන දායකත්වය	121,000,000		87,740,034	
උපලේඛණ ගැලපුම්	(121,000,000)		(104,740,034)	688,464,120
පාරිතෝෂික අරමුදල ප්‍රතිසටහන		(263,263)		
ක්‍රමක්ෂය - ප්‍රාග්ධන			12,252,426	
2019 කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය	(4,058,920)		56,290,243	
		(4,058,920)		**12,252,426**
2019.12.31 වන දිනට ශේෂය		**696,394,362**		**700,716,546**

කාර්මික තාක්ෂණ ආයතනය (අනුප්‍රාප්තික ලං.වි. හා කා.ප.ආ)

2019.12.31 දිනට පරිත්‍යාග සහ ප්‍රදානයන්

සටහන් 6ආ

පරිත්‍යාග	ශේෂය 01.01.2019	ශේෂය 01.01.2019 රු.	වසර තුළ එකතු කළ අගය	වසර තුළ නිමිසමය	ශේෂය 31.12.2019 රු.
යුනිඩෝ - ආධාර	300202	11,049		11,049	(0)
ප්‍රාග්ධන සංචිත	300205	1,523,209			1,523,209
ආසියානු සංවර්ධන බැංකු පරිත්‍යාග	300207	4,488,682		1,122,175	3,366,507
වෙනත් පරිත්‍යාග	300204	106,145		53,072	53,072
ජයිකා ආයතනිය ත්‍යාගය - එප්පි 42	300213	29,495		7,374	22,122
එම්.එච්.අයි.එම් ත්‍යාගය - එප්පි 36	300214	2,367		592	1,775
කාප් ත්‍යාගය - එප්පි 48	300215	1,800		450	1,350
ටී.වී.ර්.සී ත්‍යාගය	300219	11,656		2,914	8,742
ජපන් 2කේආර් ව්‍යාපෘතිය	300222	17,977		1,731	16,247
ජාත්‍යන්තර පරමාණු බලශක්ති අධිකාරිය - පරිත්‍යාග	300226	567,538		567,538	(0)
ජාතික විද්‍යා පදනම සුනාමි ව්‍යාපෘතිය	300227	-			-
ජාතික විද්‍යා පදනම - ස්කැනිං ඉලෙක්ට්‍රෝන් මයික්‍රොස්කෝප් උපාංග	300228	222,000		111,000	111,000
අයි.සී.ඩී.ආර් ජාත්‍යන්තර මධ්‍යස්ථානය - උණබම්බු ව්‍යාපෘති සඳහා	300229	271,412		271,412	0
ග්‍රාමීය කර්මාන්ත සහ ස්වයං රැකියා අමාත්‍යාංශය	300230	5,116		5,116	-
වෙළඳ ද්‍රව්‍ය පිළිබඳ පොදු අරමුදල	300231	175,650		43,138	132,513
භාණ්ඩාගාර ප්‍රදානය - කැබි රථය (තා.ප.අමාත්‍යාංශය)	300232	2,565,110		1,595,000	970,110
ජෙව තාක්ෂණ අංශය සඳහා පරිත්‍යාගය	300234	783,752		195,938	587,814
මහා භාණ්ඩාගාර ප්‍රදානිත - මෝටර් රථ (චෝගම්)	300235	1,312,932		1,312,932	0
මහා භාණ්ඩාගාර ප්‍රදානිත - මෝටර් කාර් සහ වෑන්	300236	806,519		806,519	0
ලයන් බ්‍රෑවරි සමාගම - ත්‍යාග	300237	6,719,639		1,120,451	5,599,187
එන් ආර් සී වෝටර්ස් එච්පීඑල්සී	300238	2,312,877		350,000	1,962,877
ජාතික විද්‍යා පදනම - පරිත්‍යාග	300239	369,539		52,791	316,748
ආයුර්වේද දෙපාර්තමේන්තුව	300240	29,750		4,250	25,500
ජපන් 2කේආර් ප්‍රතිරූප අරමුදල	300241	748,128,470		41,562,693	706,565,778
ජාතික විද්‍යා පදනම - එප්පී 99	300242	340,232		37,804	302,428
ග්ලෝරියා මුණ්ඩි බලශක්ති ආයතනය පීඑප් 112	300243	132,255		14,695	117,560
සමුද්‍ර විද්‍යා තාක්ෂණය පිළිබඳ කොරියානු ආයතනය එප්පී 117	300244	56,676		6,297	50,378
ජාතික විද්‍යා පදනම - එප්පී 113	300245	344,857		40,780	304,077
සීඅයිඩීඒ - අයිඩීආර්සී ව්‍යාපෘතිය	300403	22,301,106		3,495,754	18,805,352
එකතුව		**793,637,809**		**52,793,464**	**740,844,345**

කාර්මික තාක්ෂණ ආයතනය (අනුප්‍රාප්තික ලං.වි. හා කා.ප.ආ)
2019.12.31 වන දිනට ප්‍රත්‍යාගණන ශේෂය

සටහන - 6 ඇ

	2019	2018
2008 ප්‍රත්‍යාගණනය	රු.	රු.
යන්ත්‍ර සුත්‍ර සහ රසායනාගාර උපකරණ	26,950,099	26,950,099
ලීබඩු වැද්දුම් සහ කාර්යාල උපකරණ	6,404,627	6,404,627
පරීක්ෂණාක උපකරණ	(7,197,654)	(7,197,654)
	26,157,073	**26,157,073**
2009 ප්‍රත්‍යාගණනය		
ගොඩනැගිලි	102,685,357	102,685,357
	128,842,430	**128,842,430**
2016 ප්‍රත්‍යාගණනය		
මෝටර් රථවාහන	24,600,000	24,600,000
	153,442,430	**153,442,430**

කාර්මික තාක්ෂණ ආයතනය (අනුප්‍රාප්තික ලං.වි. හා කා.ප.ආ)
2019 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන්වූ කාල පරිච්ඡේදය සඳහා ආදායම් ප්‍රකාශය පිළිබඳ සටහන්

	2019		2018	
ආදායම් (සටහන 7 අ)	**රු.**	**රු.**	**රු.**	**රු.**
ආදායම් ප්‍රමිත සේවා	172,564,965		197,741,067	
අඩුකලා : නැවත ගෙවීම්	533,168	172,031,797	1,122,312	196,618,755
ආදායම් - උපදේශණ සේවා		28,531,332		22,848,833
ආදායම් - තාක්ෂණ නුවමාරු		7,515,894		3,244,993
ආදායම් - ගිවිසුම්ගත ව්‍යාපෘති	57,013,235		29,251,463	
අඩුකලා : වියදම් - අනු ගිවිසුම් ව්‍යාපෘති	155,345	56,857,890	-	29,251,463
ආදායම් - වරණාත්මක සේවා		19,719,157		17,299,887
ආදායම් - පුහුණු කිරීම්		18,078,448		19,948,847
ලද කතෘභාග		1,515,532		104,511
		304,250,050		**289,317,289**
වෙනත් ආදායම් (සටහන - 7 ආ)				
වෙනත් මෙහෙයුම් ආදායම්				
ආදායම් - පුස්ථකාල	140,074		156,444	
ආදායම් - වෙනත් / පොදු	11,069,641	**11,209,715**	4,844,674	**5,001,118**
වෙනත් මෙහෙයුම් නොවන ආදායම්				
සේවක මණ්ඩල ණය පොළි	1,351,337		1,070,507	
ආයෝජන පොළි (කාරක ප්‍රාග්ධන, පාරිතෝෂික, ණයවර ලිපි තැන්පත්)	17,089,735		27,959,619	
ව්‍යාපෘති දායකත්වය	-		72,140	
විනිමය ලාභ/අලාභ	9,809		491,184	
අඩුකලා : වත්කම් අපහරණය ලාභ/අලාභ	763,400	**19,214,282**	-	**29,593,450**
		30,423,997		**34,594,568**

කාර්මික තාක්ෂණ ආයතනය (අනුප්‍රාප්තික ලං.වි. හා කා.ප.ආ)

2019.12.31 වන දිනෙන් අවසන්වූ කාල පරිච්ඡේදය සඳහා ආදායම් ප්‍රකාශය පිළිබඳ සටහන්

	2019	2018
සේවක ප්‍රතිලාභ (සටහන - 8 අ)		
වැටුප් හා වේතන	232,130,192	215,397,674
අනියම් සේවක වැටුප්	9,288,246	8,892,736
කාර්ය්‍ය මත පදනම් සේවක වැටුප්	5,473,684	17,425,191
පර්යේෂණ සහ සංවර්ධන දීමනා	18,310,576	10,648,479
සේවක අර්ථසාධක අරමුදල	31,930,327	28,172,710
සේවක භාරකාර අරමුදල	6,384,501	5,634,542
පාරිතෝෂික දීමනා	20,624,734	15,383,131
අතිකාල දීමනා	11,840,672	7,424,985
ගරු සේවා දීමනා - පාලක මණ්ඩල සාමාජික	480,300	751,575
වෛද්‍ය ගාස්තු ප්‍රතිපූර්ණය	2,965,171	1,678,848
දිරි දීමනා (කාර්ය්‍ය සාධනයමත පදනම්)	4,725,445	6,436,866
දිරි දීමනා - රා. මු. චක්‍රලේඛ අංක 380	26,648,870	32,210,976
සමූහ සේවක මණ්ඩල වෛද්‍ය රක්ෂණය	2,628,232	2,821,754
	373,430,949	**352,879,467**
ගමන් වියදම් (සටහන - 8 ආ)		
ගමන් වියදම් - දේශිය	1,638,522	1,766,904
ගමන් වියදම් - විදේශිය	9,640,927	8,646,280
ගමන් වියදම් - සමූහ ප්‍රවාහන	3,356,539	3,188,152
	14,635,988	**13,601,336**

කාර්මික තාක්ෂණ ආයතනය (අනුප්‍රාප්තික ලං.වි. හා කා.ප.ආ)
2019.12.31 වන දිනෙන් අවසන්වූ කාල පරිච්ඡේදය සඳහා ආදායම් ප්‍රකාශය පිළිබඳ සටහන්

	2019	2018
සැපයුම් හා පරිභෝජන (සටහන - 8 ඇ)	රු.	රු.
රසායන ද්‍රව්‍ය	10,687,571	13,069,577
රසායනාගාර උපකරණ	8,208,573	4,324,224
විද්‍යුත් මෙවලම්	273,926	144,332
ලිපිද්‍රව්‍ය	6,257,108	3,355,909
අනෙකුත් සැපයුම්	1,572,419	1,764,234
වෙනත් / අර්ධ ස්ථාවර	2,738,042	356,729
උවදුරු මැඩලීමේ මෙවලම්	315,502	532,319
නිල ඇඳුම් - මුරකරු, රියදුරු ආදි	952,849	1,055,828
ක්‍රීඩා ඇතුළු සුභසාධන	123,217	84,714
ඉන්ධන	6,541,497	7,156,112
	37,670,704	**31,843,979**
නඩත්තු (සටහන - 8 ඇ)		
ගොඩනැගිලි සහ පරිශ්‍රය	15,139,592	13,016,885
යන්ත්‍ර සූත්‍ර	7,457,416	14,962,894
ලීබඩු උපකරණ	2,918,675	2,744,286
පුස්තකාල පොත්	-	6,900
රසායනාගාර උපකරණ	97,142	1,018,251
පරීක්ෂණාක	7,150,008	5,754,624
ආපනශාලාව	69,530	100,272
විදුලිජනක යන්ත්‍රය	1,374,107	535,742
රථවාහන	7,052,445	7,090,511
	41,258,914	**45,230,365**
ගිවිසුම්ගත සේවා (සටහන - 8 ඉ)		
විදුලි ගාස්තු	32,249,501	33,203,990
දුරකථන සහ අන්තර්ජාල ගාස්තු	13,504,864	12,729,478
තැපැල් ගාස්තු	396,694	381,853
වරිපනම් සහ බදු	2,023,560	2,135,980
ආරක්ෂක සේවා ගාස්තු	10,086,189	9,666,615
ජල ගාස්තු	1,374,256	1,963,362
	59,635,064	**60,081,277**

කාර්මික තාක්ෂණ ආයතනය (අනුප්‍රාප්තික ලං.වී. හා කා.ප.ආ)
2019.12.31 වන දිනෙන් අවසන්වූ කාල පරිච්ඡේදය සඳහා ආදායම් ප්‍රකාශය පිළිබඳ සටහන්

	2019	2018
<u>ව්‍යාපෘති සහ මානව සම්පත් සංවර්ධන (සටහන - 8 ඊ)</u>	**රු.**	**රු.**
මහා භාණ්ඩාගාර ප්‍රදානිත ව්‍යාපෘති වැය	23,526,215	7,958,736
පර්යේෂණ සහ සංවර්ධන (ප්‍රතීතන)	354,042	928,759
මානව සම්පත් සංවර්ධන - පුහුණුකිරීම්	1,072,047	390,255
සාමාජික මුදල්	3,719,738	2,807,280
පුස්තකාල විද්‍යා, සඟරාව - වාර්ෂික - දායක මුදල්	9,164,563	7,785,258
තත්ත්ව පද්ධතිය වැඩිදියුණු කිරීම සහ ශිල්ප සේනා	7,192,921	
	45,029,526	**19,870,287**
<u>ක්ෂය සහ ක්‍රමක්ෂය වැය (සටහන - 8 උ)</u>		
ගොඩනැගිලි	56,717,152	58,752,358
යන්ත්‍ර සූත්‍ර	68,917,543	64,667,496
ලීබඩු සහ උපකරණ	3,599,122	3,517,414
පරීක්ෂණාක	8,305,885	6,365,195
රථවාහන	17,525,960	18,843,823
මෘදුකාංග	11,662,482	10,663,510
පුස්තකාල පොත්	2,011,269	2,052,721
	168,739,413	**164,862,516**
<u>පුනරුත්ථාපන වියදම් (සටහන - 8 ඒ)</u>		
ගොඩනැගිලි සහ ආකෘති වැඩිදියුණු කිරීම	9,317,611	2,975,807
යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ පුනරුත්ථාපනය	1,083,597	3,879,082
මෝටර් රථවාහන වැඩිදියුණු කිරීම	199,500	651,891
වෙනත් ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපන සහ වැඩිදියුණු කිරීම	187,535	539,403
	10,788,244	**8,046,182**

කාර්මික තාක්ෂණ ආයතනය (අනුප්‍රාප්තික ලං.වී. හා කා.ප.ආ)
2019.12.31 වන දිනෙන් අවසන්වූ කාල පරිච්ඡේදය සඳහා වත්කම් ප්‍රකාශය පිළිබඳ සටහන්

	2019	2018
වෙනත් මෙහෙයුම් වියදම් (සටහන 8 දෘ)	**රු.**	**රු.**
සේවක මණ්ඩල පුහුණු කිරීම්	1,030,673	1,748,532
නියැදි ගාස්තු	4,717,365	3,691,800
සංයුක්ත දීමනා	3,020,427	2,769,320
දායක මුදල් - දේශීය / විදේශීය / වෙනත්	222,271	454,587
රසායනාගාර සාමාජික ගාස්තු (දේශීය)	275,818	842,145
ගරු සේවා දීමනා	1,257,118	1,490,689
වෛද්‍ය පරීක්ෂණ ගාස්තු (නව බඳවා ගැනීම්)	324,900	43,729
සංග්‍රහ දීමනා	460,529	399,696
රක්ෂණ ගාස්තු	2,237,729	2,241,488
මුද්‍රණ ගාස්තු	1,054,956	450,622
පුවත්පත් සහ සාමාජික ගාස්තු	79,878	60,136
විගණන ගාස්තු	1,536,000	3,296,400
නීතිඥ ගාස්තු	303,000	315,085
බැංකු ගාස්තු	124,143	55,632
ණයපත් කොමිස්	166,930	170,800
දැන්වීම් පළකිරීම්	1,828,714	2,473,330
සඟරා - වාර්ෂික වාර්තා	396,279	439,131
ප්‍රවර්ධන සහ ප්‍රචාරක වියදම්	578,904	1,670,890
ප්‍රතික්ෂේපිත චකතු කල අගය මත බද්ද	8,762,398	8,235,511
ආර්ථික බදු	-	1,480,813
ජාතිය ගොඩනැගීමේ බදු	1,337,351	73,707
සමීක්ෂණ ගාස්තු - සමීක්ෂණ මණ්ඩල	229,820	801,300
පේටන්ට් සහ උපදේශණ ගාස්තු	940,422	385,350
වියදම් - ප්‍රමිතසේවා	964,769	1,633,191
වියදම් - උපදේශක සේවා	825,742	827,315
වියදම් - තාක්ෂණ හුවමාරුව	316,272	64,205
වියදම් - ගිවිසුම්ගත සේවා	2,854,274	631,374
වියදම් - වරණාත්මක සේවා	394,677	430,910
වියදම් - පුහුණු කිරීමේ කටයුතු	3,395,908	1,425,434
පර්යේෂණ සහ සංවර්ධන සහ තාක්ෂණ සේවා වැය	183,431	341,869
නිශ්කාෂණ ගාස්තු	130,666	31,906
කාර්මික තාක්ෂණ ආයතන වාර්ෂික පර්යේෂණ වැඩමුළුව- පර්යේෂණ සහ සංවර්ධන	1,579,426	-
ප්‍රදර්ශන වැය (කාර්මික තාක්ෂණ ආයතනය)	246,927	286,154
ප්‍රදර්ශන/විදාතා/අමාත්‍යාංශ කාර්යන්	1,457,420	1,100
ශිල්පසේනා ප්‍රදර්ශනය	7,147,498	
කොමිසැට් රැසවීම් සඳහා වැය	16,640	68,654
මුද්දර බදු	61,850	73,475
අර්ථසාධක අරමුදල සඳහා ලිපිද්‍රව්‍ය	178,433	149,222
පරිත්‍යාග	-	100,000
විවිධ වියදම්	34,316	28,409
සෙන්ටෙක් ප්‍රදර්ශන - ප්‍රතිශත දායකත්වය	184,000	391,000
ඒඑස්ඕඑම්පීඑස් සභාපතිතුමන්ගේ පැමිණීම		11,798
තත්ත්ව යටිතල පහසුකම්	3,718,318	1,217,555
මාළඹේ විතැන්වීමේ වැය	45,918	-
	54,622,110	**41,304,263**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } පීඊසී/ඒ/අයිටිඅයි/02/18/2019 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2020 අගෝස්තු 21 දින

සභාපති,
කාර්මික තාක්ෂණ ආයතනය

කාර්මික තාක්ෂණ ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය කළ මතය

කාර්මික තාක්ෂණ ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ආයතනය විසින් කාර්යසාධන බැඳුම්කරයක් නිදහස් කර ගැනීමට එරෙහිව පුද්ගලික සමාගමක් විසින් රු.6,355,550 ක් ගෙවීම් කරන ලෙස ඉල්ලා ආයතනයට එරෙහිව නඩු පවරා තිබූ අතර ඒ හේතුවෙන් එකී වටිනාකමට අසම්භව්‍ය බැරකමක් ඇති වීමට ඉඩකඩ පවතින නමුත් ඒ පිළිබඳ ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රමිත අංක 08හි (100) වගන්තියට අනුව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 09 ප්‍රකාරව අවසන් තොගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් වඩා අඩු අගයට තක්සේරු කිරීමට කටයුතු නොකර අවසන් තොගයෙහි අගය රු.මිලියන 25.1 ක් ලෙස සරල සාමාන්‍ය පිරිවැය මත අගය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) මාලඹේ පර්යේෂණ හා සංවර්ධන ගොඩනැගිල්ල පිහිටි ඉඩම පිරිවැය මත සියයට 5 බැගින් ඉකුත් වර්ෂය තුළ ක්ෂය කිරීම නිසා රු.2,000,000 ක් ක්ෂය වෙන් කිරීමේ ගිණුමෙහි ඇතුළත්ව තිබීමේ වරද ප්‍රවර්තන වර්ෂය තුළදී ද නිවැරදි කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති හඳුනා නොගත් බැංකුවට සෘජුව කළ බැර කිරීම් රු.6,993,491 ක් හඳුනාගෙන ගිණුම්වල ගැලපීමට කටයුතු නොකර ජංගම බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මේ හේතුවෙන් ඉහත ප්‍රමාණයෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම අඩුවෙන්ද ජංගම වගකීම් වැඩියෙන්ද මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කෙරුණි.

(ඉ) රු.9,476,908 ක් වූ නොපියවූ අත්තිකාරම් වෙනුවෙන් අඩමාන ණය ලෙස රු.1,134,572 ක් වෙන්කර තිබුණි. මේ හේතුවෙන් ප්‍රවර්තන වර්ෂයේ ඌනතාවය රු.1,134,572 කින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කෙරුණි.

(ඊ) 2019 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද වත්කම්වල වටිනාකම් රු.790,816,686 ක් ලෙස දක්වා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු නමුත් විගණනයට ඉදිරිපත් වූ උපලේඛනය අනුව එම වටිනාකම රු.786,800,587 ක් වූයෙන් එම අගයන් අතර රු.4,016,099 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, මෙම වත්කම් ආයතනයේ කටයුතුවලට යොදවාගෙන

තිබූ නමුත් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව එම වත්කම්වල ඇස්තමේන්තුගත දෝෂය නිවැරදි කර නැවත අගය කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) 2019 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැති වටිනාකම රු.29,791,016 ක් වුවත් එම ශේෂය සනාථ කර ගැනීම සඳහා ශේෂ තහවුරුකර ගැනීමේ ලිපි විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීමයන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ තත්ත්වාගණනය කළ මනය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝවෙනත් විකල්පයක් නොමැති විටදීමෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම,පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීනමූල්‍ය ප්‍රකාශනපිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම් වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

  මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව,මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර,විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (අ) හා (ඇ) ඡේදයේ දක්වා ඇති කරුණු හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති/විධිවිධානවලට යොමුව	විස්තරය
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි අංක 507 (2) හා 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන චක්‍රලේඛයේ 7.4.5 වගන්තිය	ආයතනයේ රු.මිලියන 2,952 ක් වූ ජංගම නොවන වත්කම් සම්බන්ධව සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.
(ii) මුදල් රෙගුලාසි අංක 395 (ඇ)	බැංකු ගිණුමක් ඇති සෑම ආයතනයක් විසින්ම එක් එක් මාසය අවසානයේදී ඇති ගණුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශනයක් පිළියෙල කළ මුත් ආයතනය එක් එක් මාසය වෙනුවෙන් වෙන් වෙන්ව මාසිකව බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල නොකොට 2019 දෙසැම්බර් 31 දිනට 2019 වර්ෂය සඳහා එක් බැංකු සැසඳුමක් පමණක් පිළියෙල කර තිබුණි.
(iii) අංක 396 (ඇ) වගන්තිය	2019 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත්වල වටිනාකම රු.11,414,070 කි. එම වටිනාකමෙන් මාස 06 ක වලංගු කාලය ඉක්මවා තිබූ රු.1,031,917 ක චෙක්පත් වෙනුවෙන් මෙම මුදල් රෙගුලාසිය අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) 2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

(i) 4 .2.1 (ඇ) වගන්තිය	ඊළඟට එළඹෙන වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳව විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත් ආයතනය විසින් 2019 වර්ෂය සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.
(ii) 4.2.2 (අ) වගන්තිය	ප්‍රසම්පාදන ක්‍රියාවලියක ආරම්භක අවස්ථාවේ සිට අවසන් කරන තුරු එක් එක් ක්‍රියාවලීන් වෙනුවෙන් කාල ක්‍රමානුකූලව විස්තර කරමින් ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කළ යුතු වුවත් ආයතනය 2019 වර්ෂයේදී එසේ කටයුතු කර නොතිබුණි.
(iii) 6.2.2 වගන්තිය	ජාතික තරඟකාරී ලංසු ක්‍රමය හා සීමිත ජාතික තරඟකාරී ලංසු ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී ලංසු ඉදිරිපත් කිරීමට දින 21 ක අවම කාල සීමාවක් ලබාදිය යුතු වුවත් 2019 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ප්‍රසම්පාදනයන් 3 ක් වෙනුවෙන් දින 15 ක අවම ලංසු කාලසීමාවක් පමණක් ලබාදී තිබුණි.
(iv) 5.3.11 (අ) වගන්තිය	ලංසු ඉදිරිපත් කරන්නන් විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව නියමිත ආකෘතියක් යටතේ ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතු වුවත් 2019 වර්ෂයේදී ප්‍රසම්පාදනය කරන ලද රු.21,261,110 ක් වටිනා ප්‍රසම්පාදනයන් 8 ක් වෙනුවෙන් ලංසු සුරක්ෂණයන් ලබානොගෙන ඔවුන්ගේ ලංසු පිළිගෙන ප්‍රසම්පාදන ක්‍රියාවලිය පවත්වාගෙන ගොස් තිබුණි.
(v) 5.4.4 (i) වගන්තිය	මාලඹේ පිහිටි කාර්යාල සංකීර්ණය වෙනුවෙන් ආපනශාලාවක් ඉදිකිරීම සඳහා පුද්ගලික සමාගමක් සමඟ එළඹ තිබූ කොන්ත්‍රාත් ගිවිසුම අනුව ඉදිකිරීම් අත්තිකාරම් ලෙස රු.4,136,214 ක් 2016 ජූනි 09 දින

	ගෙවීම් කර තිබුණද ඒ වෙනුවෙන් ඇප අත්තිකාරම් සහතිකයක් (Advanced payment guarantee) ලබාගෙන නොතිබුණි.
(vi) 5.4.4 (iii) වගන්තිය	කොන්ත්‍රාත්කරු වෙත සිදු කරන ගෙවීම්වලින් සියයට 90 ක ප්‍රතිශතයක් වනවිට ගෙවීම් කරන ලද අත්තිකාරම් මුදල් මුළුමනින්ම අයකරගත යුතු වුවත් මාලඹේ පිහිටි කාර්යාල සංකීර්ණය වෙනුවෙන් ආපන ශාලාවක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්කරු වෙත 2018 ජූලි 12 වන දින අවසාන ගෙවීම් සිදු කරන අවස්ථාව වන විටත් රු.4,136,214 ක අත්තිකාරම් මුදල සම්පූර්ණයෙන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.
(vii) 8.9.1 වගන්තිය	කොන්ත්‍රාත්කරු පිළිගැනීමෙන් පසු විධිමත් ගිවිසුමකට එළඹිය යුතු වුවත් වටිනාකම රු.20,681,068 ක් වූ මාලඹේ කාර්යාල සංකීර්ණය වෙනුවෙන් ආපනශාලාවක් ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව 2016 අප්‍රේල් 22 දින පුද්ගලික ආයතනයක් වෙත පවරා තිබුණද ඉදිකිරීම් කටයුතු පිළිබඳව ගිවිසුමකට එළඹ තිබුණේ 2016 ජුනි 28 දිනදීය.
(ඇ) 2014 පෙබරවාරි 11 දිනැති අංක 2/2014 දරන කළමනාකරණ සේවා වක්‍රලේඛය	
5 (i) (ඇ) හා 5 (ii) වගන්තිය	නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන පරීක්ෂණ යෝජනා විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම්ගේ සහභාගීත්වයෙන් යුත් වෙනත් රාජ්‍ය ආයතන කීපයක නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් වෙත ඉදිරිපත් කර ඒ සඳහා අනුමැතිය ලබාගත යුතු වුවත් ආයතනය එසේ කටයුතු කර නොතිබුණි.

6 (i) වගන්තිය	භාණ්ඩාගාර අරමුදල් පර්යේෂණ ව්‍යාපෘති සඳහා යොදවා නොගත යුතු බවත් ඒ සඳහා ජාතික පර්යේෂණ කවුන්සිලය හෝ ජාතික විද්‍යා පදනමෙන් ප්‍රතිපාදනයන් ලබාගත යුතු වුවත් එසේ කටයුතු නොකොට 2015 සිට 2019 වර්ෂ දක්වා පර්යේෂණ ව්‍යාපෘති 87 ක් සඳහා භාණ්ඩාගාර අරමුදල් යොදාගෙන තිබුණි.
4 (ii) වගන්තිය	පර්යේෂණ ආරම්භ කල දින සිට මාස 6 ක් ඇතුලත පර්යේෂණ යෝජනාවට අදාළ ක්‍රියාකාරී සැලසුමට අනුව ප්‍රගතිය ඇතුලත් අතුරු පරීක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) වසර 03 සිට වසර 10 කාල සීමාවක් දක්වා කාල පරාසය සිට පැවත එන අයිතමයන් 6 කින් සමන්විත වූ රු.1,272,918 ක අගයකින් යුක්ත උපචිත වියදම් පියවා දැමීමට ආයතනය කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂ ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් වූ අයිතම 10 කින් සමන්විත එකතුව රු.14,158,958 ක ණයගැති ශේෂ සමාලෝචිත වර්ෂයතුලදීද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වර්ෂ ගණනාවක සිට අයවිය යුතු විදේශ ශිෂ්‍යත්ව ගිවිසුම්වල කොන්දේසි කඩකළ නිලධාරීන් 20 දෙනෙකුගෙන් අයවිය යුතු රු.16,899,429 ක් වූ මුදල 2019 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ඈ) 2019 දෙසැම්බර් 31 දිනට වෙළඳ ලැබිය යුතු දෑ ශේෂය රු.29,378,901 ක මුදල තුළ වසර 06 කට වැඩි කාලයක සිට අයවිය යුතු ණය ශේෂ 448 ක් පවතින අතර එම වටිනාකම රු.10,612,617 ක් විය.

(ඉ) තාක්ෂණික උපකරණවල ජාත්‍යන්තර වෙළඳපල තුල පවත්නා මිල ගණන් හඳුනා ගැනීමට විධිමත් ක්‍රමවේදයක් ආයතනය විසින් හඳුන්වා නොදීම නිසා එකී ප්‍රසම්පාදනයන්ට අදාල පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දුර්වලතා පැවතුණි. මේ හේතුවෙන් 2019 වර්ෂය තුලදී මිලදී ගන්නා ලද උපකරණ 12 ක් සඳහා පිළියෙල කර තිබූ පිරිවැය ඇස්තමේන්තුවල සියයට 25 සිට සියයට 107 දක්වා මිල වැඩි වීම් නිරීක්ෂණය විය.

(ඊ) රසායන හා ක්ෂුද්‍ර ජීවී විද්‍යාගාරය වෙත 2019 නොවැම්බර් 19 දින ප්‍රසම්පාදනය කරන ලද රු.665,900 ක් වටිනා Tablet Friability Tester උපකරණය 2020 පෙබරවාරි 07 දින වන විටත් භාවිතයට ගෙන නොතිබුණි.

(උ) LIMSපරිගණක පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා පරිගණක අංශය වෙත ප්‍රසම්පාදනය කරන ලද රු.2,549,321 ක් වටිනා Rack Mountable Server පද්ධතිය 2019 සැප්තැම්බර් 05 දින ආයතනය වෙත ලැබී තිබුණද 2020 ජුනි 23 දින වනවිටත් එය භාවිතයට ගෙන නොතිබුණි.

(ඌ) කාර්මික තාක්ෂණ ආයතනය විසින් 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ නිමකළ යුතු පර්යේෂණ ව්‍යාපෘති 56 ක් අතරින් ව්‍යාපෘති 25 ක් අවසන් පරීක්ෂණ වාර්තා නිකුත් කර නොතිබුණි. මේ හේතුවෙන් එකී කාල පරිච්ඡේදය තුල සිදුකරන ලද පර්යේෂණ ව්‍යාපෘතිවලින් අපේක්ෂිත අරමුණු ඉටුකරගෙන නොතිබුණි.

(එ) 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ කාර්මික තාක්ෂණ ආයතනය සිදුකරන ලද පර්යේෂණ මඟින් තාක්ෂණය පැවරීම් වෙනුවෙන් රු.1,610,000 ක ආදායමක් උපයාගෙන තිබූ බවට හඳුනාගෙන තිබූ අතර එම කාලපරිච්ඡේය තුළ පර්යේෂණ ව්‍යාපෘති සඳහා රු.61,449,858 ක වියදමක් හා පර්යේෂණ දීමනා ගෙවීම සඳහා රු.33,980,404 ක් ලෙස එකතුව රු.95,430,262 ක් වැයකර තිබුණි. ඒ අනුව පර්යේෂණ ව්‍යාපෘතිවලට වැය කරන ලද මුදල්වලට ආර්ථික ප්‍රතිලාභයක් ලබාගෙන නොතිබුණි.

(ඒ) එකතුව රු.3,066,925 ක් වූ බැංකු ගිණුම් ශේෂ 05 ක් අක්‍රීය බැංකු ගිණුම් ලෙස වසර 05 කට අධික කාලයක සිට පවත්වාගෙන ගොස් තිබුණි.

(ඔ) ප්‍රවර්ථන වර්ෂයතුලදී මාණ්ඩලික, මාණ්ඩලික නොවන හා අනෙකුත් කාර්යය මණ්ඩලවල තනතුරු පිළිවෙලින් 29 ක්, 20 ක් හා 09 ක් එකතුව තනතුරු 58 ක් පුරප්පාඩු පැවති අතර එකී පුරප්පාඩුවලට බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඕ) කාර්මික තාක්ෂණ ආයතනයේ කටයුතු වාණිජ මට්ටමෙන් පවත්වාගෙන යාම සඳහා ඖෂධ හා ඛනිජතෙල් රසායනාගාරය වෙත එකතුව සේවකයින් 47 ක තනතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරගෙන තිබූ අතර එම තනතුරුවලින් මාණ්ඩලික, මාණ්ඩලික නොවන හා අනෙකුත් කාර්යය මණ්ඩලවල තනතුරු පිළිවෙලින් 21 ක්, 18 ක් හා 8 ක් ප්‍රවර්තන වර්ෂය තුලදී පුරප්පාඩු වී පැවතියද, ඒ සඳහා බඳවා ගැනීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ක) ප්‍රධාන අභ්‍යන්තර විගණක ඇතුළුව තනතුරු 07 ක් වසර ගණනාවක සිටම පුරප්පාඩුව පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න
විගණකාධිපති

කාර්මික තාක්ෂණ ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන සහ වෙනත් තෙතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

අංකය	**විගණකාධිපතිවරයාගේ වාර්තාවේ කරුණු**	**31.12.2019 ආයතනයීය කරුණු දැක්වීම**
01	මුල්‍ය ප්‍රකාශන	
1.2	තත්ත්වාගණනය කල මතය සඳහා පදනම	
(අ)	ආයතනය විසින් කාර්යසාධන බැඳුම්කරයක් නිදහස් කර ගැනීමට එරෙහිව පුද්ගලික සමාගමක් විසින් රු.6,355,550ක් ගෙවීම් කරන ලෙස ඉල්ලා ආයතනයට එරෙහිව නඩු පවරා තිබූ අතර ඒ හේතුවෙන් එකී වටිනාකමට අසම්භාව්‍ය බරකමක් ඇතිවීමට ඉඩකඩ පවතින නමුත් ඒ පිළිබඳව ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රමිත අංක 08හි (100) වගන්තියට අනුව මුල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණි.	ආයතනය විසින් රු. මිලියන 4.6 මුදල් ලබා ගන්නා ලද්දේ ගිවිසුම් ප්‍රකාර අනුව ව්‍යාපෘතියේ සිදු වී තිබූ අඩුපාඩු නිසාය. ඉතිරි මුදල උපචිත බරකමක් ලෙස සටහන් කර ඇත. ඔවුන් නීතිමය ක්‍රියාමාර්ගයට අවතීර්ණ වන බව දන්වා තිබුනද නිත්‍යානුකූල කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. එමනිසා අවසාන ගිණුම් වල ඇතුලත් නොකර තිබුණි.
(ආ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 09 ප්‍රකාරව අවසන් තොගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් වැඩ අඩු අගයට තක්සේරු කිරීමට කටයුතු නොකර අවසන් තොගයෙහි අගය රු.මිලියන 25.1ක් ලෙස සරල සාමාන්‍ය පිරිවැය මත අගය කර මුල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	පවතින පරිගණක පද්දතිය තුළ හරිත් සාමාන්‍ය පිරිවැය අනුව තොග ආගණනය සිදු කිරීමට අවශ්‍ය පහසුකම් නොමැති බැවින් සරල සාමාන්‍ය ක්‍රමය තොග ආගණනය සඳහා යොදා ගනු ලබයි. මෙම පහසුකම ඇති නව පරිගණක පද්දතියක් ස්ථාපිත කරමින් පවතියි.
(ඇ)	මාලබේ පර්යේෂණ හා සංවර්ධන ගොඩනැගිලි පිහිටි ඉඩම පිරිවැය මත සියයට 5 බැගින් ඉකුත් වර්ෂය තුළ ක්ෂය කිරීම නිසා රු.2,000,000 ක් ක්ෂය වෙන් කිරීමේ ගිණුමෙහි ඇතුළත්ව තිබීමේ වරද ප්‍රවර්තන වර්ෂය තුළදී ද නිවැරදි කර නොතිබුණි.	අදාල කෂය වෙන් කිරීම පිළිබඳ ගැලපීම ප්‍රවර්තන වසරේදී සිදු කිරීමට කටයුතු කරනු ඇත.
(ඈ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති හඳුනා නොගත් බැංකුවට සෘජුව බැරකිරීම් රු.6,993,491 ක් හඳුනාගෙන ගිණුම්වලට ගැලපීමට කටයුතු නොකර ජංගම බැරකම් ලෙස මුල්‍ය ප්‍රකාශනවල දක්වා තුබුණි. මේ හේතුවෙන් ඉහත ප්‍රමාණයෙන් සමාලෝචිත වර්ෂයේ අදායම අඩුවෙන්ද ජංගම වගකීම් වැඩියෙන්ද මුල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කෙරුණි.	සෞඛ්‍ය රක්ෂණය හා අග්‍රහාර රක්ෂණ ක්‍රමය සඳහා ගෙවනු ලබන PF 380 දායක මුදලට අදාල රු.312,915ක වටිනාකමට රක්ෂණ ගිණුම හරහා ගෙවා ඇති බැවින් එය රක්ෂණ ගිණුම් තුළ ගැලපා ඇත.
(ඉ)	රු.9,476,908ක් වූ නොපියවූ අත්තිකාරම් වෙනුවෙන් අඩමාන ණය ලෙස රු.1,134,572ක් වෙන්කර තිබුණි. මේ හේතුවෙන් ප්‍රවර්තන වර්ෂයේ ඌනතාවය රු.1,134,572කින් වැඩියෙන් මුල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කෙරුණි.	අඩමාණ ණය සඳහා වෙන් කිරීම් අදාල අත්තිකාරම් ගිණුම හරහා ගැලපීමට කටයුතු කරනු ඇත.
	නීති රීති / විධිවිධානවලට යොමුව	
(අ)	ආයතනයේ රු. මිලියන 2,952ක් වූ ජංගම නොවන වත්කම් සම්බන්ධව සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.	2019.12.31 දිනට අදාල ජංගම නොවන වත්කම් පරීක්ෂණ කටයුතු පෙබරවාරි/මාර්තු මස තුළ නිම කිරීමට සියළු කටයුතු සම්පාදනය කර තිබියදී COVID 19 (කොරෝනා) වසංගතය හේතුවෙන් සියලු ආයතන Lockdown කිරීම හේතුවෙන් එම කටයුතු ක්‍රියාත්ම කිරීමට නොහැකි විය. එම කටයුතු නැවත ක්‍රමානුකූලව ඉතා ඉක්මනින් (2020 අගෝස්තු මස දින වන විට) නිම කිරීමට කටයුතු කරනු ලැබේ.

කාර්මික තාක්ෂණ ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන සහ වෙනත් තෙතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

අංකය	**විගණකාධිපතිවරයාගේ වාර්තාවේ කරුණු**	**31.12.2019 ආයතනයීය කරුණු දැක්වීම**
	බැංකු ගිනුමක් ඇති සම ආයතනයක් විසින්ම එක එක මාසය අවසානයේදී ඇති ගනුදෙනු තත්වය සම්බන්ධයෙන් ඊලඟ මාසයේ 15වංඉ දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශනයක් පිළියෙළ කළ මුත් ආයතනය එක් එක් මාසය වෙනුවෙන් වෙන්වෙන්ව මාසික බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ නොකොට 2019 දෙසැම්බර් 31 දිනට 2019 වර්ෂය සඳහා එක බැංකු සසඳුමක් පමණක් පිළියෙළ කර තිබුණි.	මුල්‍ය අංශය තුළ පවතින සේවක හිගය මේ සඳහා බලපා ඇති අතර 2019 වර්ෂය සඳහා සියලුම බැංකු සැසඳුම් නිමකර ඇති බවත් 2020 වසරේ ඇතිවූ කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් මෙම වසර සඳහා වූ බැංකු සැසඳුම් නිම කිරීමට ප්‍රමාද වූ අතර බැංකු සැසඳුම් ප්‍රකාශන සකස් කිරීමේ කටයුතු සිදු කරමින් පවතයි.
	2019 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත්වල වටිනාකම රු.11,414,070කි. එම වටිනාකමෙන් මස 06ක වලංගු කාලය ඉක්මවා තිබූ රු.1,031,917ක් චෙක්පත් වෙනුවෙන් මෙම මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණි.	වලංගු කාලය එකුත් වූ චෙක් පත් සඳහා මෙම වගන්තිය අනුව කටයුතු කර තිබුනද මෙම වසර තුල එය සිදුවී නොතිබූ අතර මෙ වසරේදී මෙම වගන්තිය අනුව කටයුතු සිදු කිරීමට කටයුතු කරනු ඇත.
(ආ)	ඊළඟට එළඹෙන වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදනකටයුතු පිළිබඳව විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙළ කළ යුතුවුවත් ආයතනය විසින් 2019 වර්ෂය සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.	විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම 2019 වර්ෂය සඳහා සකස් කර නොමැති අතර වටිනාකමින් වැඩි ප්‍රාග්ධන භාණ්ඩ සඳහා අදාල ලිපිගොනුවල විස්තරාත්මක කාලසටහනක් අමුණා ඇත. එය යාවත්කාලින කරමින් මෙම ප්‍රසම්පාදන ලිපිගොනුව නිරතුරුවම පරික්ෂා කිරීමට කටයුතු කර ඇත.
	ප්‍රසම්පාදන ක්‍රියාවලියක ආරම්භක අවස්ථාවේ සිට අවසන් කරන තුරු එක් එක් ක්‍රියාවලින් වෙනුවෙන් කාල ක්‍රමානුකූලව විස්තර කරමින් ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙළ කළ වුවත් ආයතනය 2019 වර්ෂයේදී එසේ කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී ප්‍රසම්පාදන ලිපිගොනුවට අදාලව විස්තරාත්මක කාල සටහනක් පිළියෙළ කර යාවත්කාලින කිරීමට කටයුතු කරනු ඇත .
	වෙනත් විගණන නිරීක්ෂණ	
(අ)	වසර 03 සිට වසර 10 කාල සීමාවක් දක්වා කාල පරාසය සිට පැවත එන අයිතමයන් 06කින් සමන්විතවූ රු.1,272,918ක අගයකින් යුක්ත උපචිත වියදම් පියවා දැමීමට ආයතනය කටයුතු කර නොතිබුණි.	ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම ගෙවියයුතු දුරකථන බිල් මෙම ගිණුමට බැර කර ඇත. නමුත් එම බිල් දුරකථන වියදම් ගිණුම හරහා ගෙවීම් කර ඇත. මෙම ප්‍රවර්ත වසරේදී නිසි පරිදි ගැලපීමට කටයුතු කර ඇත.
(ආ)	වර්ෂ ගණනාවක් සිට මුල්‍ය ප්‍රකාශනවල ඇතුලත් වූ අයිතම 10කින් සමන්විත එකතුව රු.14,158,958ක ණයගැති ශේෂ සමාලෝචිත වර්ෂයතුලදීද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	මෙහි සමහර අයිතම පොත්වලින් ලියා හැරීම සඳහා පාලක මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත එහි .නිර්දේශ මත ඉදිරියේදී ක්‍රියා කරනු ලැබේ. සමහර අයිතම ප්‍රවර්තන වසරේදී අය කර ගෙන ඇත. ඉතිරි අයිතමයන් සඳහා ප්‍රවර්තන වසරේදී . .උචිත ක්‍රියාර්ග ගැනීමට කටයුතු කරනු ඇත
(ඇ)	වර්ෂ ගණනාවක සිට අයවියයුතු විදේශ ශිෂ්‍යත්ව ගිවිසුම්වල කොන්දේසි කඩකළ නිලධාරීන් 20 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 16,899,429 ක් වූ මුදල 2019 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.	මෙයින් රු. 4,020,392 ක මුදලක් නිලධාරීන් 17 දෙනෙකුට සම්බන්ධ වන අතර ගිවිසුම් කඩ කළ නිලධාරීන්ගෙන් අදාල මුදල අයකර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග සිදුකල මුත් එම ක්‍රියාමාර්ග ව්‍යර්ථ වුයේ එම නිලධාරීන් දිවයින හැර ගොස් සිටි බැවිනි. ඔවුන්ගේ බොහෝ ඇප කරුවන්ද දිවයිනෙන් බැහැරව ගොස් සිටින අතර ඇතැමෙක් ජීවතුන් අතර නැත. රු.3,789,640 ක් වටිනා ගිවිසුම කඩකළ නිලධාරිනිය සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු නීතිපති දෙපාර්තමේන්තුව සමග මේ වනවිටත් සිදු කෙරෙමින් පවතියි.

කාර්මික තාක්ෂණ ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන සහ වෙනත් තෙතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

අංකය	**විගණකාධිපතිවරයාගේ වාර්තාවේ කරුණු**	**31.12.2019 ආයතනයීය කරුණු දැක්වීම**
(ඇ)	2019 දෙසැම්බර් 31 දිනට වෙළඳ ලැබිය යුතු දෑ ශේෂය රු.29,378,901 ක මුදල තුළ වසර 06කට වැඩි කාලයක සිට අයවියයුතු ණය ශේෂ 448ක් පවතින අතර එම වටිනාකම රු.10,612,617ක් විය.	මෙම ණයගැති ශේෂ ඉහල යාම තුළ වැඩි වශයෙන් තිබුනේ SVAT ණය වව්වර් එකතු කර ගැනීමය. SVAT සකස් කිරීම පුහුණුවන්නන් යොදාගෙන සිදුකල අතර වර්තමානයේ පවතින තත්ත්වය මත එසේ පුහුණුවන්නන් බඳවා ගැනීමටද අපහසු වී ඇත.
(ඉ)	තාක්ෂණික උපකරණවල ජ්‍යාතන්තර වෙළඳපල තුළ පවත්නා මිල ගණන් හඳුනා ගැනීමට විධිමත් ක්‍රමවේදයක් ආයතනය විසින් හඳුන්වා නොදීම නිසා එකී ප්‍රසම්පදනයන්ට අදාල පිරිවැය ඇස්තමේන්තු පිළියෙළ කිරීමේ දුර්වලතා පැවතුණි. මේ හේතුවෙන් 2019 වර්ෂය තුළදී මිලදී ගන්නා ලද උපකරණ 12ක් සඳහා පිළියෙළ කර තුබූ පිරිවැය ඇස්තමේන්තුවල සියයට 25 සිට සියයට 107 දක්වා මිල වැඩි වීම් නිරීක්ෂණය විය.	මෙහිදී පසුගිය වර්ෂයේ අග පවතින වෙළඳ මිල ගණන් මත සහ අන්තර්ජාලයේ ප්‍රසිද්ධ කර ඇති වෙළඳ මිල ගණන් මත ප්‍රාග්ධන භාණ්ඩ වල ඇස්තමේන්තු මිල තීරණය කරනු ලැබේ. එම මිල ගණන් භාණ්ඩයේ සත්‍ය වටිනාකම නොවන අතර එම භාණ්ඩ ආනයනය කිරීමේදී ගෙවිය යුතු තීරු බදු ගාස්තු, ගුදම් ගාස්තු සහ වෙනත් අදාල සියලු වියදම් එකතු කළ විට හා විනිමය අනුපාත මත රුපියලේ අගය අවප්‍රමාණය වීම භාණ්ඩයේ ඇස්තමේන්තු අගයට වඩා වැඩි අගයක් ආරෝපණය වීම ආදී එම සාධකයන් මත ඇස්තමේන්තු අගය ඉක්මවා සත්‍ය වටිනාකම වැඩිවී ඇත.
(ඊ)	රසායන හා ක්ෂුද්‍ර ජීවී විද්‍යාගාරය වෙත 2019 නොවැම්බර් 19 දින ප්‍රසම්පාදන කරන ලද රු. 665,900ක් වටිනා Tablet Friability Tester උපකරණය 2020 පෙබරවාරි 07 වන විටත් භාවිතයට ගෙන නොතිබුණි.	ඖෂධ විද්‍යාගාරය සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම අවසන් කර නොමැති අතර එම නිසා උපකරණ නිතිපතා භාවිතා කිරීම සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයින් නොමැත. කාර්ය මණ්ඩලය බඳවා ගත් පසු යන්ත්‍රය අදාල කාර්ය සඳහා යොදා ගනු ඇත.
(උ)	LIMS පරිගණක පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා පරිගණක අංශය වෙත ප්‍රසම්පාදනය කරන ලද රු.2,549,321ක් වටිනා Rack Mountable Server පද්ධතිය 2019 සැප්තැම්බර් 05දින ආයතනය වෙත ලැබී තිබුනද 2020 ජුනි 23 දින වනවිටත් එය භාවිතයට ගෙන නොතිබුණි.	නිරීක්ෂණය සඳහා එකග වන අතර (ISS) පරිගණක පද්ධතියට Intergrated software system (Science Land Pvt Ltd) මේ නිලධාරීන් ISS මෘදුකාංගය සඳහා අවශ්‍ය මූලික අධ්‍යන කටයුතු අදාළ අංශ සමග සිදුකරමින් පවතයි. තවද එම සමාගම සමග 24.06.2020 දින අදාල කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කළ අතර මෘදුකාංගය ස්ථාපනය කිරීමේ මූලික වැඩ කටයුතු සිදු වෙමින් පවතයි. මෙය මාස 08ක් තුළ සම්පූර්ණ වීමට නියමිත අතර එවිට නියමිත අතර එවිට අදාළ Rack Mount Server පද්ධතිය භාවිතයට ගත හැක.
(ඌ)	කාර්මික තාක්ෂණ ආයතනය විසින් 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ නිමකලයුතු පර්යේෂණ ව්‍යාපෘති 56ක් අතරින් ව්‍යාපෘති 25ක් අවසන් පරීක්ෂණ වාර්තා නිකුත් කර නොතිබුණි.මේ හේතුවෙන් එකී කාල පරිච්ඡේදය තුළ සිදුකරන ලද පර්යේෂණ ව්‍යාපෘතිවලින් අපේක්ෂිත අරමුණු ඉටුකරගෙන නොතිබුණි.	විගණනය සිදුවන අවස්ථාවේ ඉතිරි ව්‍යාපෘති වාර්තා ලබාගෙන නොතිබූ නමුත් ඒවාට අදාළ ක්‍රියාකාරකම් නිසි ආකාරයේ සිදුවී තිබූ බව පර්යේෂණ පත්‍රිකා ප්‍රසිද්ධ කිරීම සහ තාක්ෂණ පැවරුම් මගින් සනාථ වේ. එසේ වුවද අද වන විට එම අවසන් වාර්තා ලැබී ඇති අතර විගණනය සඳහා ඉදිරිපත් කළ හැකිය.
(එ)	2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ කාර්මික තාක්ෂණ ආයතනය සිදුකරන ලද පර්යේෂණ මගින් තාක්ෂණය පැවරීම් වෙනුවෙන් රු.1,610,000 ක අදායමක් උපයාගෙන තිබූ බවට හඳුනාගෙන තිබූ අතර එම කාල පරිච්ඡේදය තුළ පර්යේෂණ ව්‍යාපෘති සඳහා රු.61,449,858 ක වියදමක් හා පර්යේෂණ දීමනා ගෙවීම සඳහා රු. 33,980,404 ක් ලෙස එකතුව රු. 95,430,262ක් වැයකර තිබුණි. ඒ අනුව පර්යේෂණ ව්‍යාපෘතිවලට වැය කරන ලද මුදල්වලට ආර්ථික ප්‍රතිලාභයක් ලබාගෙන නොතිබුණි.	2015 – 2019 කාල පරිච්ඡේදය සඳහා තාක්ෂණ පැවරීම් තුලින් උපයා ඇති අදායම රු. 17,430,270කි. තාක්ෂණික පැවරීම් තුලින් වන ප්‍රතිලාභය හුදෙක් වසරකට පමණක් සිමා නොවන අතර එමගින් දිගු කාලයකට ආර්ථික ප්‍රතිලාභ හිමිවන බව ප්‍රකාශ කළ යුතුය. අතීතයේ සිදු කළ පැවරීම් වලට අදාළ ප්‍රතිලාභ මේ වන විටත් ආයතනය භුක්ති විඳිමින් සිටියි.

කාර්මික තාක්ෂණ ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන සහ වෙනත් තෙතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

අංකය	**විගණකාධිපතිවරයාගේ වාර්තාවේ කරුණු**	**31.12.2019 ආයතනයීය කරුණු දැක්වීම**
(ඒ)	එකතුව රු. 3,066,925ක් වූ බැංකු ගිණුම් ශේෂ 05ක් අක්‍රිය බැංකු ගිණුම් ලෙස වසර 05කට අධික කාලයක සිට පවත්වාගෙන ගොස් තිබුණි.	අංක 000-0351 ගිණුම 567 කාර්මික තාක්ෂණ ආයතනය හා පිගන් ගඩොල් ආශ්‍රිත නිෂ්පාදනයන් සිදුකරන ආයතන කිහිපයක් එක්ව පවත්වාගෙන යන CENTEC ව්‍යාපෘතියට අදාල මෙම ගිණුම මේ වනවිට ක්‍රියාකාරිව නොපවතී අතර මෙම මුදල නැවත ලබා ගැනීමට ලිඛිත ඉල්ලීමක් කර ඇත.